රාජ්‍ය දැව සංස්ථාව



# වාර්ෂික වාර්තාව 2015

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

දැව වෙළෙඳපොළෙහි

# සැබෑ නායකත්වය

උදෙසා...

රාජ්‍ය දැව සංස්ථාව



# අපේ හෙට දින

## දැක්ම

ජාතියේ
විශ්වාසනීයත්වය දිනූ
අනර්ඝතම දැව
හා දැවමය
භාණ්ඩ සැපයුම්කරුවීම
සහ
දැව වෙළෙඳ පොළෙහි
සැබෑ නායකත්වය ඉසිලීම.

## මෙහෙවර

අප සතු තාක්ෂණික දැනුම,
කීර්තිනාමය හා නිපුනතාවය
උපයෝගී කරගනිමින්
නීත්‍යානුකූලව,
පරිසර හිතකාමී අන්දමින්
ජාතික අවශ්‍යතාවය අනුව
අපගේ ගැනුම්කරුවන්ගේ
දැව සහ දැවමය භාණ්ඩ
ඉල්ලීම නිෂ්පාදනය කර
ලබාදීම.



දැව හා
දැවමය භාණ්ඩ
නිෂ්පාදනය කිරීමේ
ප්‍රමුඛස්ථානයේ
වැජබෙන රාජ්‍ය
දැව සංස්ථාව ශ්‍රී
ලාංකීය උන්නතිය
හා අභිවෘද්ධිය
වෙනුවෙන් වසර
47 ක ගමන් මග
ඔස්සේ අදටත් එදා
මෙන් නොසැලී
ඉදිරියට . .

ගෙවීගිය කාලය පුරාවට විවිධ හැලහැප්පීම්, බාධක හමුවේ අපි ඔබසමග අත්වැල් බැඳගත්තෙමු.

ඔබේ සිතැඟි පරිදි භාණ්ඩ හා සේවා උසස් ප්‍රමිතියෙන් යුතුව සැපයීම, ජාතික මෙහෙවරක් සේ සලකා රටේ සංවර්ධනයට උරදීම අරමුණු පෙරදැරිව සිටින්නෙමු.

# පටුන


| | |
|---|---|
| ආරම්භය සහ අද අපි | 6 - 7 |
| මූල්‍ය ප්‍රකාශන උද්ධෘත | 8 - 9 |
| ආයතනික තොරතුරු | 10 |
| කළමනාකරණ මඩුල්ල | 11 - 13 |
| සභාපතිතුමාගේ සමාලෝචනය | 14 - 16 |
| සම්මාන හා ගෞරව | 17 |
| සාමාන්‍යාධිකාරීතුමාගේ සමාලෝචනය | 18 - 19 |
| අපගේ කාර්යභාරයන් හා අපගේ ව්‍යාපාරික වටිනාකම් | 20 - 21 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | 22 - 23 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මඩුල්ල | 24 - 25 |
| පළමු පරිච්ඡේදය | 26 |
|     2015 වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචනය | 27 - 36 |
|     විගණන හා කළමනාකරණ කමිටුවේ වාර්තාව | 37 |
| දෙවන පරිච්ඡේදය | 38 |
|     මූල්‍ය හා නිෂ්පාදන කාර්යසාධනය | 39 - 42 |
|     දශකයක තොරතුරු | 43 |
| ජාතික ආර්ථිකයට රාජ්‍ය දැව සංස්ථාවේ දායකත්වය | 44 - 47 |
| සංස්ථාපිත පාලනය | 48 - 55 |
| තිරසර අනාගතයක් වෙනුවෙන් | 56 - 63 |
| අවදානම් කළමනාකරණය | 64 - 71 |
| විගණකාධිපති වාර්තාව | 72 - 93 |
| වාර්ෂික ගිණුම් | 94 - 117 |
| පාරිභාෂික ශබ්ද මාලාව | 118 |




# ආරම්භය...

රාජ්‍ය දැව සංස්ථාව රජය සතු ව්‍යාපාරයකි. එය 1968 වර්ෂයේ දී ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ගරු අමාත්‍යතුමන් විසින් 1957 අංක 49 දරන රජයේ කාර්මික සංස්ථා පනතේ බලතල ප්‍රකාරව පිහිටුවන ලද අතර, 1982 පෙබරවාරි 05 දිනැති අංක:178/10 අති විශේෂ ගැසට් නිවේදනය සහ 2009 වර්ෂයේ ජුනි 26 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයට අනුව තවදුරටත් සංශෝධනය කොට යාවත්කාලීන කරන ලදී. යෙදවූ මූලික ප්‍රාග්ධනය රු.මිලියන 2.5කි.

# අද අපි...

ප්‍රධාන කාර්යාලය බත්තරමුල්ල"සම්පත්පාය" පරිශ්‍රයෙහි පිහිටුවා ඇති අතර, ප්‍රාදේශීය ඒකක උප කාර්යාල දිප ව්‍යාප්තව ස්ථානගත කර ඇත. රාජ්‍ය දැව සංස්ථාවේ මූලික ආදායම් ප්‍රභවය දැව හා  දැවමය නිෂ්පාදන අලෙවිය වන අතර, තිරසාර අස්වැන්නක් උදෙසා රාජ්‍ය දැව සංස්ථාව, වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධව තිරසාර වනාන්තර වැඩසටහන් ක්‍රමය ක්‍රියාවට නංවනු ලබයි.

ඉතා උසස් තත්වයේ දැව නිෂ්පාදන හා විශිෂ්ඨ සේවාවක් සැපයීමට අප නිරතුරු උත්සුක වන අතර ඉකුත් වසර 47 ක් මුළුල්ලේ රාජ්‍ය දැව සංස්ථාව දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයේ උච්චස්ථානයේ වැජඹීමට මෙය හේතු සාධක වූ අතර, ඉහළ ශ්‍රේණියේ නිෂ්පාදන ඇගයීමේදී අපගේ නිෂ්පාදන  පිළිගත් සාධනීය සලකුණක් ලෙස භාවිතයට පත්ව ඇත.

# මූල්‍ය ප්‍රකාශන උද්ධෘත

2015 මූල්‍ය වර්ෂය තුළදී රාජ්‍ය දැව සංස්ථාව සැලකිය යුතු කාර්යසාධනයක් වාර්තා කර ඇත. ප්‍රධාන ක්‍රියාකාරී දර්ශක පහත පරිදි වේ.

**අයභාරය (රු. මිලියන)**

| 2015 | 2014 | වෙනස |
|---|---|---|
| 3,836 | 3,474 | 10% |

**භාණ්ඩාගාර හා ආදායම් බදු වලට පෙර ලාභය (රු. මිලියන)**

| 2015 | 2014 | වෙනස |
|---|---|---|
| 769 | 427 | 80% |

**භාණ්ඩාගාරයට ගෙවූ බදු (රු. මිලියන)**

| 2015 | 2014 | වෙනස |
|---|---|---|
| 50 | 25 | 100% |

**ආදායම් බදු (රු. මිලියන)**

| 2015 | 2014 | වෙනස |
|---|---|---|
| 349 | 196 | 78% |

**වර්ෂය සඳහා ශුද්ධ ලාභය (රු. මිලියන)**

| 2015 | 2014 | වෙනස |
|---|---|---|
| 370 | 206 | 80% |

**ස්කන්ධය මත ඉපැයීම්**

| 2015 | 2014 | වෙනස |
|---|---|---|
| 9.4% | 5.7% | 63% |

**වත්කම් මත ඉපැයීම්**

| 2015 | 2014 | වෙනස |
|---|---|---|
| 6.3% | 3.6% | 73% |

**මුළු වත්කම් (රු. මිලියන)**

| 2015 | 2014 | වෙනස |
|---|---|---|
| 5,859 | 5,660 | 4% |



අයභාරය (රු. මිලියන)



ආදායම් බදු පසු ශුද්ධ ලාභය (රු. මිලියන)



**මුළු ස්කන්ධය (රු. මිලියන)**

| 2015 | 2014 | වෙනස |
|---|---|---|
| 3,953 | 3,583 | 10% |

**මුළු ණයහිමියන් (රු. මිලියන)**

| 2015 | 2014 | වෙනස |
|---|---|---|
| 1,906 | 2,077 | -8% |

**ණය/ස්කන්ධ**

| 2015 | 2014 | වෙනස |
|---|---|---|
| 48.2% | 58.0% | -17% |

**ණය/මුළු වත්කම්**

| 2015 | 2014 | වෙනස |
|---|---|---|
| 32.5% | 36.7% | -11% |

**මුළු සේවකයන් (සංඛ්‍යාව)**

| 2015 | 2014 | වෙනස |
|---|---|---|
| 2,145 | 2,186 | -2% |

**එක් සේවකයෙකුට අයභාරය (රු. මිලියන)**

| 2015 | 2014 | වෙනස |
|---|---|---|
| 1.8 | 1.6 | 13% |

**එක් සේවකයෙකුට ලාභය (භාණ්ඩාගාර හා ආදායම් බදු වලට පෙර) (රු. මිලියන)**

| 2015 | 2014 | වෙනස |
|---|---|---|
| 0.36 | 0.2 | 80% |



මුළු වත්කම් (රු. මිලියන)



ස්කන්ධය මත ඉපැයීම (%)



භාණ්ඩාගාර හා ආදායම් බදු පෙර ලාභය (රු. මිලියන)

# ආයතනික තොරතුරු - 2015

| | |
|---|---|
| අතිගරු මෛත්‍රීපාල සිරිසේන මහතා | - මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යතුමා |
| ඩී.එම්.ඒ.එල්.පී.ජයරත්න මහතා | - මහවැලි සංවර්ධන හා පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා |
| උදය ආර්. සෙනෙවිරත්න මහතා | - ලේකම්, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යංශය |

## අධ්‍යක්ෂ මණ්ඩලය

| | |
|---|---|
| පී.දිසානායක මහතා | - සභාපති - රාජ්‍ය දැව සංස්ථාව. |
| එච්.වයි.ටී.පවරකුමාර මහතා | - ක්‍රියාකාරි අධ්‍යක්ෂ - රාජ්‍ය දැව සංස්ථාව. |
| එම්.ඒ.කරුණාරත්න මහතා | - අධ්‍යක්ෂක (භාණ්ඩාගාර නියෝජිත) |
| එස්.ඒ.ඒ.සතුරුසිංහ මහතා | - අධ්‍යක්ෂක (වන සංරක්ෂණ ජනරාල්) |
| එම්.වී.කරුණාරත්න මහතා | - අධ්‍යක්ෂක |
| පී.පන්සලවත්ත මහතා | - අධ්‍යක්ෂක |
| ඒ.එම්.සී.පෙරේරා මහතා | - අධ්‍යක්ෂක |
| කේ. සිරිනිවංශ මහතා | - සාමාන්‍යාධිකාරි, රාජ්‍ය දැව සංස්ථාව |

## විගණන හා කළමනාකරණ කමිටුව

| | |
|---|---|
| එම්.ඒ.කරුණාරත්න මහතා | - කමිටු සභාපති |
| එස්.ඒ.ඒ.සතුරුසිංහ මහතා | - කමිටු සාමාජික |
| එම්.වී.කරුණාරත්න මහතා | - කමිටු සාමාජික |

## විගණක

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
306/72, පොල්දූව පාර,
බත්තරමුල්ල.

## ප්‍රධාන කාර්යාලය (ලියාපදිංචි ලිපිනය)

82, "සම්පත්පාය",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.
ශ්‍රී ලංකා.

## ප්‍රධාන බැංකුව

ලංකා බැංකුව

## මුදල් වර්ෂය

ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 වන දින දක්වා

| | |
|---|---|
| දුරකථන | : +94 11 2 866 600-5 |
| ෆැක්ස් | : +94 11 2 866 623 |
| වෙබ් අඩවිය | : www.timco.lk |



# කළමනාකරණ මඩුල්ල - 2015

| | | |
|---|---|---|
| සාමාන්‍යාධිකාරි | : කේ.සිරිනිවංශ | Bsc., Msc. (Forestry), Dip. (Bus. mgt), PostGrad. Dip. (Forest survey-Netherland), Dip(Forest products research-Japan) |

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීන්**

| | | |
|---|---|---|
| නි.සාමාන්‍යාධිකාරී- තොරතුරු තාක්ෂණ | : ඩී.යූ.දයාරත්න | Bsc., Msc.(Com. Sc) |
| නි.සාමාන්‍යාධිකාරී- පර්යේෂණ, පුහුණු හා සංවර්ධන | : ආචාර්ය එන්. රුවන්පතිරණ | Bsc., Msc., PhD. (Forestry) |
| නි.සාමාන්‍යාධිකාරී- අභ්‍යන්තර විගණක | : ඩබ්.ඩබ්.එම්.ජේ.කුරේ | FCA |
| නි.සාමාන්‍යාධිකාරී-මුදල් | පී.ඩී.එස්.කුමාරසිංහ | Bsc. (Acct. Fin. Mgt.), MBA, ACA, ACMA |
| නි.සාමාන්‍යාධිකාරී - මෙහෙයුම් | : එච්.පී.එස්.නවරත්න | Bsc., Msc. (Forestry), Post Grad. Dip in Forestry for Rural Mgt(Netherland) |
| නි.සාමාන්‍යාධිකාරී-අලෙවි | : පී.පී.ආර්.සමරවීර | Bsc., Msc. (Forestry) |

**සහකාර සාමාන්‍යාධිකාරීන්**

| | | |
|---|---|---|
| ස.සාමාන්‍යාධිකාරි | : එස්.එස්.පඩුවාවල | Bsc.,Msc. (Forestry), Post Grad.Dip.(Forest survey-Netherland), PostGrad. Dip. (Mech. Wood Tech. & Prod. Mgt. - Finland) |
| ස.සාමාන්‍යාධිකාරි (වැ.බ) | : එම්.සී.දේවේන්ද්‍ර | Bsc.,Msc (Forestry) |
| ස.සාමාන්‍යාධිකාරි (වැ.බ) | : පී ගුණවංශ | BA (Sp.), Dip in Forestry |

**කළමනාකරුවන්**

| | | |
|---|---|---|
| කළමනාකාර - මුදල් | : පී.ඩී.ඒ.එම්.ඩී. වික්‍රමසිංහ | Dip. (FA) |
| කළමනාකාර - මුදල් | : ආර්.එම්.රත්නපාල | H.N.D.A., Post Grad. Dip. in Finance (India)-1st Class, Member A.A.T., Member U.K.A.P. |
| කළමනාකාර - මුදල් | : එච්.ඒ.ජේ.එම්.පීරිස් | ICASL (L), Higher Dip. (Accountancy) |
| කළමනාකාර - පාලන | : ඒ.පී.එච් කුලරත්න | Dip in English, Dip in Forestry Dip in Mgt, PgD LRHRM, ACPM |
| කළමනාකාර - නිෂ්පාදන | : ආචාර්ය එම්.පී. මොහමඩ් තාරික් | Bsc, Msc, Phd. |
| කළමනාකාර - මානවසම්පත් | : ඊ.ඒ.ඩී.එස්.ඒ.අමරසිංහ | |
| කළමනාකාර - මිලදීගැනීම් හා නාවික | : අරුණ ද සිල්වා | |
| කළමනාකාර - තොරතුරු තාක්ෂණ | : ඒ.පී.මාදුවගේ | |

| | | |
|---|---|---|
| කළමනාකාර - පර්යේෂණ, පුහුණු හා සංවර්ධන | : සී.කේ.මුතුමාල | Bsc (Agric.)Hons., Msc (Forestry) |
| කළමනාකාර - විමර්ශණ | : ඊ.පී.තිලකරත්න | |
| කළමනාකාර - ඉරුම්හල් | : ඩබ්.බී.සමන්ත | Bsc.(Gen), Msc.(Forestry), National Dip in Teaching |
| කළමනාකාර - නැවත වනවගා | : ඒ.පී.රත්නසූරිය | |
| කළමනාකාර - විශේෂ ව්‍යාපෘති | : ඒ.එන්.ඩබ්.ඒ.ආනන්ද | |
| කළමනාකාර - ගෘහභාණ්ඩ යන්ත්‍රාගාරය | : එම්.කේ.ඩබ්. දිසානායක | B.com, Post Grad. Dip in International Affairs |
| | : ජේ.පී.තිසර ගමගේ | Bsc. |
| කළමනාකාර - ආරක්ෂක | : චන්දිම වීරමන් | |
| කළමනාකාර - දැව ශ්‍රේණිකිරීම් | : වයි.බී.එම්.අමීර් | Dip in Forestry |
| කළමනාකාර - මුදල් | : පී.ටී.එන්.බෝවත්ත | |
| කළමනාකාර - මුදල් | : කේ.ඩී.කේ.සී. ද සිල්වා | |
| කළමනාකාර - මුදල් | : එච්.පී.ආර්.විජේනායක | |
| කළමනාකාර - වන අපරාධ හා පරිත්‍යාග දැව (වැ.බ) | : එච්.පී.එස්.දිසානායක | BA. |

**ප්‍රාදේශීය කළමනාකරුවන්**

| | | |
|---|---|---|
| ප්‍රා.ක. - පොලොන්නරුව | : ආර්.එදිරිසිංහ | |
| ප්‍රා.ක. - බණ්ඩාරවෙල | : පී.කේ.අජිත් චන්දන | Bsc. |
| ප්‍රා.ක. - කොළඹ | : ඩබ්.කීර්ති රෝයි | |
| ප්‍රා.ක. - අනුරාධපුර | : යූ.එස්.එම්.ප්‍රනාන්දු | BA (Sp.) |
| ප්‍රා.ක. - රත්නපුර | : ඩී.එච්.රාජපක්ෂ | Bsc., Msc.(Agri) |
| ප්‍රා.ක. - නුවරඑළිය | : එච්.බී.රජවත්ත | BA |
| ප්‍රා.ක. - මොණරාගල | : යූ.පී.එච්.උළුවඩුගේ | Bsc. |
| ප්‍රා.ක. - නුවර | : ඊ.එම්.එස්.ඒකනායක | |
| ප්‍රා.ක. - යාපනය | : එස්.ශ්‍රී ස්කන්ධරාජා | |
| ප්‍රා.ක. - කුරුණෑගල | : ඒ.එස්.විජේසුන්දර | |
| ප්‍රා.ක. - මාතර | : ඩබ්.අයි.සාරංග | Bsc. (Hons.) |
| ප්‍රා.ක. - අම්පාර | : එම්.කේ.පී.වසන්ත රාජ් | |

**සංකීර්ණ භාර කළමනාකරුවන්**

| | | |
|---|---|---|
| කළමනාකාර - සිල්පර හා විදුලිකණු කල්දෙමුල්ල | : ඩී.එම්.නිල්මිණි පුෂ්පකුමාර | Bsc. |
| ප්‍රා.කළමනාකාර - කැප්පෙටිපොල | : ඒ.බී.එම්.වීරසිංහ | BA |



**නියෝජ්‍ය කළමනාකරුවන්**

| | | |
|---|---|---|
| නි.ප්‍රධාන අභ්‍යන්තර විගණක | : එච්.එම්.එස්.මාධව | B.com (Sp) |
| නි.කළමනාකාර - දැව ශ්‍රේණිකිරීම්/වෙන්දේසි | : ටී.එච්.ගුණදාස | |
| නි.කළමනාකාර - නීති | : කේ.අයි.ඩී.පී.කාරියවසම් | LLB.Attorney at Law |
| නි.කළමනාකාර - සිවිල් ඉංජිනේරු | : ඩබ්.පී.එස්.එන්. ද සොයිසා | |
| නි.කළමනාකාර - නිර්මාණ හා තත්වපාලන | : ඊ.එම්.එම්.ප්‍රනාන්දු | |
| පද්ධති විශ්ලේෂක | : ඩබ්.එච්.ඒ.චන්ද්‍රකුමාර | Bsc. |
| | : ජේ.එම්.එම්.බී.ජයසුන්දර | Bsc. (Special Hons) |

**නියෝජ්‍ය ප්‍රාදේශීය කළමනාකරුවන්**

| | | |
|---|---|---|
| නි.ප්‍රා.කළමනාකාර - අනුරාධපුර | : කේ.පී.සී.රත්නසේකර | BA |
| නි.ප්‍රා.කළමනාකාර - බණ්ඩාරවෙල | : සුනිල් ජයරත්න | |
| නි.ප්‍රා.කළමනාකාර - මාතර | : ආර්.විජේතුංග | Bsc. (Agri. Sp.) |
| | : එල්.එස්.ජයසේකර | |
| නි.ප්‍රා.කළමනාකාර - අම්පාර | : එම්.ඩී.චමිල සම්පත් | |
| නි.ප්‍රා.කළමනාකාර - නුවරඑළිය | : ඩී.ඒ.හෙන්දාවිතාරණ | |
| | : එම්.ඩබ්.යූ.ජේ.පියනන්දන | |
| නි.ප්‍රා.කළමනාකාර - අම්පාර ගෘ.කර්මාන්තශාලාව | : ඒ.සී.පිනේජුදීන් | |
| නි.ප්‍රා.කළමනාකාර - නුවර | : ඩී.පී.සිරිල් | |
| | : ආර්.සී.සමන් කුමාර | |
| නි.ප්‍රා.කළමනාකාර - මොණරාගල | : දුමින්ද නවරත්න | BA |
| නි.ප්‍රා.කළමනාකාර - කුරුණෑගල | : ආර්.එම්.එස්.කේ.රත්නායක | |
| | : සුනිල් විජිතබණ්ඩාර | |
| නි.ප්‍රා.කළමනාකාර - යාපනය | : ටී.පී.රමේෂ් | BA |
| නි.ප්‍රා.කළමනාකාර - රත්නපුර | : එච්.එල්.නන්දන | Bsc |
| | : එච්.ඒ.ගාමිණී අල්විස් | |
| නි.ප්‍රා.කළමනාකාර - මාතලේ | : ඩී.එල්.අබේනායක | |
| නි.ප්‍රා.කළමනාකාර - කල්දෙමුල්ල | : එන්.පී.නිහාල් | |
| | : ටී.එස්.රූපසිංහ | |
| නි.ප්‍රා.කළමනාකාර - මින්නේරිය | : එස්.සී.ජයමාන්න | Bsc. |

# සභාපතිතුමාගේ සමාලෝචනය



> "වන කළමනාකරණය පිළිබඳ ආර්ථික, සාමාජීය, දේශපාලනික සහ ජීව විද්‍යාත්මක පසුබිම තේරුම් ගැනීමත්, එම අංශ සමබර කරගැනීමත් අවදානම් සහිත සහ අභියෝගාත්මක වුවද විධිමත් කළමනාකරණයක් තුලින් අනාගත දැව සැපයීම ස්ථාවර මට්ටමක පවත්වා ගත හැක."

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව සහ විගණන මූල්‍ය ප්‍රකාශන එළිදක්වන්නේ හද පිරි සතුටිනි. දශක පහකට ආසන්න සේවා ඉතිහාසය පුරාවට රාජ්‍ය දැව සංස්ථාව ජාතියේ විශ්වාසනීයත්වය දිනූ අනර්ඝතම දැව හා දැවමය භාණ්ඩ සැපයුම්කරු ලෙස පුරෝගාමී නායකත්වයක් උසුලනු ලබයි. පුළුල් කරන ලද මෙහෙයුම් ජාලය හා අප සතුව පවතින ප්‍රාදේශීය කාර්යාල 12ක්, අලෙවි මධ්‍යස්ථාන 54 ක් හා 200 කට අධික දැව හෙළීම් සිදුකරන ක්‍රියාකාරී වැඩබිම් සහ දැව පදම්කිරීමේ හා පරිරක්ෂණය කිරීමේ යන්ත්‍රාගාර වලින් සමන්විත ගෘහභාණ්ඩ නිෂ්පාදනාගාර 03 ක් රාජ්‍ය දැව සංස්ථාව ජාතියේ විශාලතම දැව නිෂ්පාදන ජාලයේ හිමිකරු බවට තහවුරු කර ඇත. නවමු අත්දැකීම් රැසක් සමගින් 2015 වර්ෂය ආරම්භයත් සමග රටේ දේශපාලන, ආර්ථික හා සමාජීය විශාල වෙනසකට මුහුණපෑමට සිදුවීමත්, ඒ හරහා රාජ්‍ය දැව සංස්ථාව සංවර්ධනය කරා මෙහෙයවීමේ භාරදූර වගකීම මම භාරගතිමි. මෙවැනි පසුබිමක් තුළදීත් නිෂ්පාදනය, අලෙවි හා මූල්‍ය යන අංශ විධිමත්ව සංවිධානය කිරීමත් ඊට සමගාමීව නව තාක්‍ෂණය හා නව උපාය මාර්ග හඳුන්වාදීම තුළින් ඉතා සාර්ථකව මෙම වර්ෂය අවසන් කිරීමට අපට හැකියාව ලැබුණි.

ශ්‍රී ලංකාව 2014 දී ළඟාකරගත් 4.9% ක ආර්ථික වර්ධනයට සාපේක්ෂව රාජ්‍ය ප්‍රතිපත්ති සහ දේශීය හා විදේශීය අභියෝග හමුවේ 2015 වසරේදී 4.8% කින් වර්ධනයක් පෙන්නුම් කරන ලදී. 2015 වර්ෂය තුලදී කෘෂිකාර්මික, කාර්මික හා සේවා පිළිවෙලින් 5.5%, 5.3% හා 3.0% කින් වර්ධනයක් දක්නට වූ අතර රාජ්‍ය අංශය ගත් කල රාජ්‍ය සේවකයින්ගේ ආදායම ඉහළයෑම හේතුවෙන් දේශීය පරිභෝජනයේ වෙනසක් ඇති කිරීමට සමත්විය. ලෝක ආර්ථිකයේ මන්දගාමී වර්ධනය දේශීය ආර්ථිකය කෙරෙහි ද බලපෑම් එල්ලකිරීමට සමත් විය. උද්ධමනය ස්ථාවර මට්ටමක පවත්වා ගැනීම මෙන්ම පොළී අනුපාතය අඩුමට්ටමක පැවතීම ආර්ථික වර්ධනය සඳහා උපකාරී විය. මෙසේ ශ්‍රී ලංකා ආර්ථිකය පැවති තත්වය තුළ රාජ්‍ය දැව සංස්ථාව 2015 වර්ෂය අභියෝග හමුවේ සාර්ථකව තම ව්‍යාපාරික කටයුතු මෙහෙයවන ලදී.

රාජ්‍ය දැව සංස්ථාවේ කාර්ය සාධනයට ප්‍රබලව බලපාන සාධක අතර වන කළමනාකරණය පිළිබඳ ආර්ථික, සාමාජීය, දේශපාලනික සහ ජීව විද්‍යාත්මක පසුබිම තේරුම් ගැනීමත්, එම අංශ සමබර කරගැනීමත් අවදානම් සහිත සහ අභියෝගාත්මක වුවද විධිමත් කළමනාකරණයක් තුලින් අනාගත දැව සැපයීම ස්ථාවර මට්ටමක පවත්වා ගතහැක. වෙනත් භාණ්ඩ සදහා ඇති ඉල්ලුම මෙන් නොව දැව භාණ්ඩ සදහා ඇති ඉල්ලුම ආර්ථිකය මෙන් ම පරිසරය සමග සංවේදී වේ. එම නිසා අමුද්‍රව්‍යවල හිඟතාව හා අධික පිරිවැය නිසා රාජ්‍ය දැව සංස්ථාව ලාභදායීත්වය පිළිබඳ අභියෝගතාවයන්ට මුහුණ දේ. වන විනාශය අද පවත්නා දැවැන්ත පාරිසරික අර්බුදයකි. දැව හා දැවමය භාණ්ඩ සඳහා ඇති ඉහළ ඉල්ලුම හේතුවෙන් නීත්‍යානුකූල නොවන අයුරින් වන විනාශය සිදුකිරීමට පෙළඹී ඇති චකවානුවක නියමාකාරයේ වන කළමනාකරණයක් තුළින් පමණක් වන සම්පත අනාගත පරපුරේ පරිභෝජනය සඳහා රැකගත හැකිවේ. තිරසාර දැව අස්වනු නෙලීම තුළින් වන විනාශය අවම කළ හැක. එනම්, දැව අස්වනු හෙළීමේදී වනවගා භූමියේ නිෂ්පාදන හැකියාව ආරක්ෂා වන පරිදි ඉතා ක්‍රමවත්ව හා විද්‍යානුකූලව කටයුතු කිරීමෙන් සහ වයස්ගත ශාක වෙනුවට නව ශාක රෝපණය කොට, නව වනවගා ඇති කිරීමට කටයුතු කිරීම තුලින් සමාජයට දිගුකාලීන ප්‍රතිලාභ සලසාගත හැකිවේ. කෙසේ නමුත් ශාක යනු සදහටම පවතින ජීවයක් නොවේ. කිසියම් මොහොතක පරිණත ශාක දිරාපත්ව ගොස් ඒ වෙනුවට වේගයෙන් වැඩෙන ළදරු ශාක එම භූමිය ආක්‍රමණය කිරීම තුලින් ස්වභාවිකවම නව ශාක ප්‍රතිස්ථාපනය සිදුවේ. වනසංරක්‍ෂණ දෙපාර්තමේන්තුව විසින් නිසි කළමනාකරණ සැලැස්මකට අනුව වාර්ෂිකව අපවෙත නිදහස් කරනු ලබන පරිණත වනවගාවන්, නිවැරදි ක්‍රමවේදයන්ට යටත්ව විද්‍යානුකූලව අපතය



අවම වන ආකාරයෙන් දැව වලට පරිවර්ථනය කර, එම භූමි නැවත වන වගා කටයුතු සදහා නිදහස් කිරීම අප ආයතනය මගින් ඉටුකරනු ලබයි.

රාජ්‍ය දැව සංස්ථාව, එහි ක්‍රියාකාරකම් විධිමත් කළමනාකරණය තුලින් ඉතා විශිෂ්ට ප්‍රතිඵල ලබා ගැනීමට හා කර්මාන්තයේ අභිවෘද්ධිය සදහා ද විශාල ලෙස දායකවීමට හැකිවීම අප ලද භාග්‍යයකි. තවදුරටත් තරඟකාරී වාසි ලබාගැනීම, ගුණාත්මක භාවයෙන් ඉහල භාණ්ඩ නිෂ්පාදනය හා පාරිභෝගික තෝරාගැනීම් පරාසය පුළුල් කිරීම යන අරමුණු ඉටු කරගැනීම සදහා නව මූල්‍ය වර්ෂය තුලදී නව තාක්ෂණික ක්‍රම හඳුන්වාදීමත්, නව වෙළඳපොල උපාය මාර්ග හඳුන්වා දීමත් සදහා ප්‍රාග්ධන ආයෝජනයන් පුළුල් කිරීමට බලාපොරොත්තු වන අතර, 2015 වර්ෂය සියලු බාධක අභිබවා බලාපොරොත්තු වූ අයුරින්ම ඉතා සාර්ථකව අවසන් කිරීමට අප සමත් විය.

මෙම තත්වය යටතේ, සමාලෝචනයට භාජනය වන වසර සදහා වාර්තා වූ ආදායම රු. මිලියන 3,836 ක් වූ අතර, පසුගිය වසරේ දී රු. මිලියන 3,474 ක් විය. මෙම ආදායම උපයාගැනීම සදහා වසර තුල හඳුන්වා දුන් නව නිෂ්පාදන හා නව උපාය මාර්ග පිටුවහල් වී ඇත. පසුගිය වසරේ රු. මිලියන 204ක් වූ මෙහෙයුම් ලාභය මෙම වසරේදී රු. මිලියන 546 දක්වා වර්ධනය වී ඇති අතර, භාණ්ඩාගාර බදු සහ ආදායම් බදු පෙර ශුද්ධ ලාභය 2015 දී රු.මිලියන 769 ක් වූ අතර, 2014 දී රු. මිලියන 427 ක් වූ අතර, එය පසුගිය වසරට සාපේක්ෂව 2015 දී 80% ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී. භාණ්ඩාගාර බදු සහ ආදායම් බදු පසු ශුද්ධ ලාභය 2014 වර්ෂයේ දී රු. මිලියන 206 ක් වූ අතර, 2015 දී රු. මිලියන 370 ක් විය. එමෙන් ම, 2015 වර්ෂය තුලදී රු. මිලියන 1,594 ක ස්කන්ධභාග, මෙහෙයුම් බදු සහ භාණ්ඩාගාරයට ගෙවූ විශේෂ බදු වශයෙන් රාජ්‍ය දැව සංස්ථාව ජාතික ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් සපයා ඇත. එමෙන්ම 2015 වර්ෂය තුළදී රාජ්‍ය දැව සංස්ථාව විසින් සිල්පර අපනයනය මගින් රු. මිලියන 54 ක විදේශ විනිමය උපයා ගන්නා ලදී. ඉහළ යන දැව ඉල්ලුමට පිළියමක් වශයෙන් ඉරූදැව ආනයනය කිරීමටත්, උසස් තත්වයේ ඉරූදැව ආනයනය තුළින් වෙළෙඳපොළේ පවතින ගුණත්වයෙන් අඩු දැව වර්ග භාවිතයෙන් පාරිභෝගිකයා ආරක්‍ෂා කිරීමේ හැකියාව ලැබුණි. තවද, ඉහළ යන දැව ඉල්ලුම සපුරාලීම සඳහා මෘදු දැව කල්පැවැත්මෙන් වැඩි දැව බවට පත් කිරීමට අවශ්‍ය තාක්‍ෂණික හා ශිල්පීය දැනුම රාජ්‍ය දැව සංස්ථාව තුළට ලබාගෙන දැව පරිරක්‍ෂණය තුළින් රටේ වටිනා දැව සම්පත ආරක්‍ෂා කරමින් එම නිෂ්පාදන සඳහා යෝග්‍ය වෙළෙඳපොළක් ඇති කිරීමට අපට හැකි විය. නව යන්ත්‍ර සූත්‍ර හා තාක්‍ෂණික ක්‍රම උපයෝගී කරගනිමින් දැව අපතය අවම කිරීමත්, දැව වලින් උපරිම උපයෝජනය ලබාගැනීමට හැකි ක්‍රමවේද

හඳුන්වාදීම මගින් තිරසාර සංවර්ධනය කරා රාජ්‍ය දැව සංස්ථාව මං පෙත් එළිපෙහෙළි කරගන්නා ලදී. සංස්ථාව සතු වටිනාම සම්පත වන්නේ මානව සම්පත බව අපගේ විශ්වාසයයි. 2015 කාල පරිච්ඡේදය තුලදී පෙර වර්ෂ මෙන් ම අප සංස්ථාව විසින් මානව සම්පත පුහුණු හා වෘත්තිය සංවර්ධන වැඩසටහන් තුලින් කුසලතා හා දක්ෂතා වැඩිදියුණු කොට පාරිභෝගිකයන්ට කාර්යක්ෂම හා උපරිම සේවයක් සැපයීම මෙන්ම ආයතනයේ ඉලක්ක මුදුන් පමුණුවා ගැනීමේ අරමුණින් කටයුතු කරන ලදී.

2015 වර්ෂය තුලදී අප කණ්ඩායමක් වශයෙන් සංස්ථාවේ සෑම පැතිකඩකම පාලන ප්‍රමිතීන් හා ව්‍යාපාර භාවිතයන් වැඩි දියුණු කිරීමට හැකියාව ලැබුණු අතර, අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පයකට අනුව අනාගත පරපුර වෙනුවෙන් පරිසරය සුරැකීම අරමුණු සාක්ෂාත් කරනු වස්, වගකිව යුතු පුරවැසියෙකු වශයෙන් ජාතියේ අවශ්‍යතාවය වෙනුවෙන් රුක් රෝපණය තවදුරටත් ශක්තිමත් කිරීම උදෙසා රාජ්‍ය දැව සංස්ථාවේ ස්ථාපිත වෙනම ඒකකයක් මගින් තෝරාගත් පාසල් අතර, කෘෂිකාර්මික උපකරණ, බීජ පැළ, වන සහ ජෛව විවිධත්වය පිළිබඳ ලියැවුණු පොත්පත් හා ඉගැන්වුම් ආධාර ලබාදෙමින් තරුණ පරපුරේ ශාක වගාකිරීම පිළිබඳ ඇල්ම වැඩිකිරීමේ අරමුණින් "තුරුජන සිසු බැංකු" රුක් රෝපණ වැඩසටහන සාර්ථකව මෙම වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලදී. මීට සමගාමීව බදුල්ල දිස්ත්‍රික්කයේ බණ්ඩාරවෙල, පස්සර, බදුල්ල සහ වැලිමඩ අධ්‍යාපන කලාපවල ඇති අතිදුෂ්කර පාසැල් සඳහා අත්‍යාවශ්‍ය භෞතික සම්පත් ලබාදීම සහ විදේශීය පරිනත දැව ශාක ඉවත් කර, දේශීය පැළ වගාවන් පාසැල් ශිෂ්‍යයන්ගේ දායකත්වයෙන් ඇති කර, සොඳුරු පරිසර හිතකාමී පාසල් පරිසරයක් ඇති කිරීම සඳහා අප විසින් 2015 වසර තුළ කටයුතු කරන ලදී. එසේම පොළොන්නරුව, සෙවනපිටිය ප්‍රදේශයේ අක්කර 50 ක තේක්ක වගාවක් 2015 වසර තුළ ආරම්භ කළ අතර, තවදුරටත් බදුල්ල, අනුරාධපුර හා වව්නියාව දිස්ත්‍රික්ක කේන්ද්‍රකරගනිමින් පවතින වානිජ වනවගා විධිමත් කළමනාකරණයක් යටතේ පවත්වාගෙන යෑම සඳහා කටයුතු කරන ලදී. "වන රෝපා" රුක් රෝපණ වැඩසටහන සදහා ක්‍රියාකාරී දායකත්වයක් ලබාදීමට සංස්ථාවට හැකි වූ අතර, ප්‍රජාව හා විවිධ ආයතන අතර රුක් රෝපණය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් පැළ 100,000 ක පමණ සංඛ්‍යාවක් බෙදා දෙන ලදී. තරුණ පරපුරෙහි රුක් රෝපණය පිළිබද ඇති ඇල්ම වැඩි කිරීම සදහා දේශනා මාලාවක් පැවැත් වූ අතර,කළුවර වැනි වටිනා දුර්ලභ ශාක බෙදාහරින ලදී. තවද පරිසරය, වනාන්තර දැව සංරක්ෂණය කිරීම හා ජෛව විවිධත්වය පිළිබද දේශන පැවැත් වූ අතර, පොත්, පෝස්ටර් හා පත්‍රිකා මෙන් ම හදුනාගත් කණ්ඩායම් අතර, වඳවීමේ තර්ජනයට ලක්ව ඇති කළුවර වැනි වටිනා ශාක බෙදා දෙන ලදී.නව සොයාගැනීම් සමාජයට ඉදිරිපත් කිරීම සදහා දැව සංස්ථාව මගින් මෙම වර්ෂය තුලදී පර්යේෂණ රැසක් සිදුකිරීමට හැකියාව තිබුණි.

එමෙන්ම අමාත්‍යංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන පරිසර සංරක්‍ෂණය සඳහා මෙන්ම සමාජ සුභසාධනය සඳහා සංවිධානය කරනු ලබන විවිධ වැඩසටහන් සඳහා ජාතික මෙහෙවරක් ලෙස සලකා උපරිම දායකත්වයක් ලබාදීමට අපට හැකි විය.නූතන සංවර්ධන යෝජනා ක්‍රම සඳහා විශාල දායකත්වයක් ලබාදෙමින් මොරගහකන්ද, උමා ඔය වැනි බහුකාර්ය යෝජනා ක්‍රම වලජලයෙන් යටවන ප්‍රදේශ වල ශාක ඉවත් කිරීම් කටයුතු සඳහා රාජ්‍ය දැව සංස්ථාව ක්‍රියාකාරීව දායක වූ අතර, එමගින් විශාල මුදලක් ජාතික ආර්ථිකය වෙත ලබාදීම සඳහා අප විසින් කටයුතු කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් ගරු මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යතුමන් වන අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාද, නියෝජ්‍ය අමාත්‍ය අනුරාධ ජයරත්න මැතිතුමා ද, අමාත්‍යංශ ලේකම් හා එම කාර්ය මණ්ඩලයටත්, වනසංරක්ෂණ ජනරාල්තුමා ඇතුළු එම දෙපාර්තමේන්තුවට අනුයුක්ත සියලුම කාර්ය මණ්ඩලයටත්, අනෙකුත් සියලුම රජයේ නිලධාරීන්ටත් අප හට ලබාදුන් ඉමහත් සහයෝගය වෙනුවෙන් කෘතවේදීත්වය පුදකරමි. විවිධ දුෂ්කරතා සහ අභියෝග හමුවේ අපගේ සාමාන්‍යාධිකාරීතුමා ඇතුළු සේවක මණ්ඩලය ඔවුන්ගේ ශක්තිය, කැපවීම හා උපාය කෞශල්‍ය අඛණ්ඩව යොදමින් සංස්ථාවේ කාර්ය සාධනය ඉහළ තලයකට නංවාලීමටගත් ප්‍රශංසනීය කාර්යභාරය වෙනුවෙන් මාගේ විශේෂ ස්තූතිය ඔවුන් වෙතද පුද කර සිටිමි.
2016 නව වර්ෂය අභියෝගාත්මක හා තීරණාත්මක සංවර්ධන ඉලක්ක කරා පියනැගිය හැකි නව වසරක් ලෙස අපි සැලසුම් කර ඇති අතර, කෙටිකාලීන අභියෝග හමුවේ නොසැලී නිරතුරුවම අපේක්ෂිත ඉලක්ක ලඟාකර ගැනීම උදෙසා අපගේ හැකියාවන් උපරිමයෙන් කැපකරමින් විශිෂ්ට ප්‍රතිඵල අත්කරදීම පිණිස ඇපකැප වී සිටින්නෙමු.

**පී.දිසානායක**
සභාපති - රාජ්‍ය දැව සංස්ථාව.



## සෑම ආකාරයකටම අපගේ විශිෂ්ඨ කැපවීම පෙන්නුම් කිරීම නිසා අප සම්මානයට පාත්‍ර වූ වගයි.



*ජාතික වාණිජ්‍ය මණ්ඩලය මගින් පැවැත්වූ 2014 ජාතික ව්‍යාපාර විශිෂ්ඨත්ව සම්මාන උළෙලේදී රාජ්‍ය දැව සංස්ථාව රාජ්‍ය අංශයේ නිෂ්පාදන වෙනුවෙන් පිදෙන රිදී සම්මානයෙන් පිදුම් ලබන ලදී.*




*ජාතික වානිජ්‍ය මණ්ඩලය මගින් පැවැත්වූ 2013 ජාතික ව්‍යාපාර විශිෂ්ඨත්ව සම්මාන උළෙලේදී රාජ්‍ය දැව සංස්ථාව රාජ්‍ය අංශයේ නිෂ්පාදන වෙනුවෙන් පිදෙන වශිෂ්ඨ කුසලතා සම්මානයෙන් පිදුම් ලබන ලදී.*






2009 2010 2011

ජාතික වානිජ මණ්ඩලය පිරිනමන රන් සම්මානයෙන් අඛණ්ඩව 2009, 2010 හා 2011 වසර තුළදී රාජ්‍ය දැව සංස්ථාව පිදුම් ලබන ලදී.



- හරිත මැකෝ සම්මානය 2008 - ශ්‍රී ලංකා ජනමාධ්‍ය සංගමය
- වන හා පරිසර අධ්‍යාපනයට වූ දායකත්වය වෙනුවෙන් සම්භාවනා හා ඇගයීම් - මැකෝ සම්මානය 2010
- 2009 ''දැයට කිරුළ'' ප්‍රදර්ශනයේ වඩාත් නිර්මාණශීලී ප්‍රදර්ශන කුටිය

# සාමාන්‍යාධිකාරීතුමාගේ සමාලෝචනය



> "වැඩ හිතකර නම්‍යශීලී වැඩ පරිසරයක් ගොඩනැංවීම කෙරෙහි අපගේ දැඩි අවධානය මේවනවිටත් යොමු වී ඇත. මෙමගින් අපගේ සහෘද සේවකයන්ගේ ජීවන තත්වය උසස් කිරීමත්, ඔවුන්ගේ මානසික හා කායික සංවර්ධනය ඇතිකිරීම තුළින් කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය ඉහළ මට්ටමකට ලඟාකරලීම සඳහා වසර පුරා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී."

රාජ්‍ය දැව සංස්ථාවේ 2015 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව හා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳ මා ඉමහත් සතුටට පත්වන අතර, වෙළෙඳ පොලෙහි වසර 47 ක පළපුරුද්ද සමග 2015 වර්ෂය තුළදීත් පෙර වර්ෂවල මෙන් ම අභියෝග හමුවේ නොසැලී ඉතා සාර්ථකව ජයග්‍රහණය රැසක් සමගින් විශිෂ්ට කාර්ය සාධනයක් වාර්තා කිරීමට සමත් වූ බව පවසනුයේ අතිශය සංතෘප්තියෙනි.

අප විසින් ඉතාමත් අනර්ඝ තත්වයේ දැවමය භාණ්ඩ නිපදවා, එම භාණ්ඩ සාධාරණ මිලකට සපයන අතර, නිත්‍ය පාරිභෝගිකයන් මෙන්ම නව පරිභෝගිකයන් ද, අපගේ සේවය පිළිබඳ අතිශය තෘප්තිමත් බව කිවයුතුමය. වර්තමානයේ දැව නිෂ්පාදනය සඳහා ලොව පවත්නා නව තාක්ෂණය උපයෝගී කර ගනිමින් දැව හා දැව ආශ්‍රිත භාණ්ඩ සැපයීමෙහි පුරෝගාමියෙකු වශයෙන් දැව නිෂ්පාදන කර්මාන්තය ඔසවා තැබීම සඳහා රාජ්‍ය දැව සංස්ථාව ඉතා වැදගත් කර්තව්‍යයක් අඛණ්ඩව සිදුකරනු ලබයි. දිවයින පුරා පැතිර ගිය ප්‍රාදේශීය කාර්යාල 12 ක්, අලෙවි මධ්‍යස්ථාන 54ක්, 200කට අධික දැව හෙලීම් සිදුකරන ක්‍රියාකාරී වැඩබිම් හා දැව පදම්කිරීමේ හා පරිරක්ෂණය කිරීමේ යන්ත්‍රාගාර වලින් සමන්විත ගෘහභාණ්ඩ නිෂ්පාදනාගාර 03ක් හා ප්‍රදර්ශණාගාර 06ක් රාජ්‍ය දැව සංස්ථාව සතු වේ.

2015 වසරේ ශ්‍රී ලංකා ආර්ථිකය, 2014 වසරේ 4.9% වර්ධනයට සාපේක්ෂව 4.8% කින් වර්ධනය විය. රජයේ මධ්‍යකාලීන ආර්ථික ක්‍රමෝපාය හා යෝග්‍ය ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමත් සමඟ තිරසාර ආර්ථික වර්ධනයක් ලඟාකර ගැනීමේ රජයේ අරමුණු මූලික කරගනිමින් රාජ්‍ය දැව සංස්ථාව 2015 වසරේ අරමුණු හා ප්‍රතිපත්ති පෙළගස්වන ලදී. 2014 වසරේදී රුපියල් මිලියන 3,474 වූ වාර්ෂික ආදායම 2015 වර්ෂය තුලදී 10.4%ක වර්ධනයක් සමග රුපියල් මිලියන 3,836 වර්ධනයක් අත්පත් කරගැනීමට අප සමත්විය. 80% ක ඉතා ඉහළ වර්ධනයක් ළඟාකර ගනිමින් පෙර වසරේ රුපියල් මිලියන 427 ක් බදුපෙර ශුද්ධ ලාභය මෙම වසර තුළදී රුපියල් මිලියන 769 ක් ලෙස උපයමින් ද, ජාතික ආර්ථිකයට රුපියල් මිලියන 1,594 ක දායකත්වයක් ලබා දෙමින් බදු පසු ශුද්ධ ලාභය රු. මිලියන 370ක් මෙම වසරේ උපයා ඇත. අපගේ ඉහළ නිෂ්පාදන ප්‍රමිතීන් තවදුරටත් තහවුරු කරමින් 2015 මූල්‍ය වර්ෂය තුලදී කඩඉම් රාශියක් ජයගැනීමට සමත්වීම කළමනාකාරිත්වයේත්, කාර්ය මණ්ඩලයේත් කැපවීමේ ප්‍රතිඵලයක් ලෙස සදහන් කිරීමට කැමැත්තෙමි.

ආර්ථිකය පමණක් නොව පරිසරය පිළිබඳ පවතින ආකල්ප හේතුවෙන්, තිරසාර සංවර්ධනයක් කරා රාජ්‍ය දැව සංස්ථාව මෙහෙයවීමේ භාර දූර වගකීම කරමත තබාගෙන සියලු මෙහෙයුම් ක්‍රියාකාරකම් පරිසර හිතකාමී අයුරින් සිදුකිරීමටත්, පරිසර සංරක්ෂණය වෙනුවෙන් 2015 වසර පුරාවට විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් රාජ්‍ය දැව සංස්ථාව රාජ්‍ය අංශයේ කැපී පෙනෙන ආයතනයක් බවට පත්විය. වගකිවයුතු පුරවැසියෙකු වශයෙන් රුක්රෝපණය තවදුරටත් ශක්තිමත් කිරීම උදෙසා 2015 වර්ෂයේදී හඳුනාගත් පාසල් කිහිපයක් සඳහා ද්‍රව්‍යමය හා මුදල්මය ආධාර දෙමින් තරුණ පුරපුරේ ශාක වගාකිරීම සම්බන්ධ ඇල්ම වැඩිදියුණු කිරීමේ අරමුණින් "තුරු ජන සිසු බැංකු" රුක්රෝපණ වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. තව ද ජාතික රුක් රෝපණ වැඩසටහන වෙනුවෙන් කුඩා පැළ බෙදාදෙන ලදී. තවද තරුණ පරපුරෙහි රුක්රෝපණය පිළිබඳ ඇති ඇල්ම වැඩිකිරීම සදහා දේශනා මාලාවක් පැවැත්වූ අතර, වටිනා පැළ බෙදාහරින ලදී. මීට අමතරව පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සංස්ථා භූමිවල පිහිටුවන ලද තේක්ක වගාවේ පුරප්පාඩු පිරවීම සදහා අළුතින් තේක්ක පැළ වගාකරන ලදී.පරිසර, වනාන්තර, දැව සංරක්ෂණය කිරීම හා ජෛව විවිධත්වය පිළිබඳ දේශන පැවැත්වූ අතර, තොරතුරු පොත්, පෝස්ටර් හා පත්‍රිකා තෝරාගත් කණ්ඩායම් හා ආයතන අතර බෙදාදෙන ලදී.



මීට අමතරව "වන රෝපා" වගාකිරීමේ ව්‍යාපෘතිය සඳහා ක්‍රියාකාරී දායකත්වයක් ලබාදීමට ද සංස්ථාවට හැකිවිය. ආයතනික සමාජ වගකීමක් ලෙස අප සංස්ථාව විසින් උපාධි අපේක්ෂකයින් සදහා අවශ්‍ය පුහුණුවීම් හා පර්යේෂණ කිරීමට අවස්ථාව ලබාදිමට හැකිවිය. රාජ්‍ය දැව සංස්ථාව විසින් පාරිභෝගික ඉල්ලුම මත දැව හඳුනා ගැනීමේ හා සහතික කිරීමේ සේවාවක් පවත්වාගෙන යනු ලබයි. මේ අයුරින් විවිධ වූ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් ලක්ෂයකට අධික කුඩා පැළ වගාකිරීම සදහා රට පුරා බෙදාහරිමින් රාජ්‍ය දැව සංස්ථාව තම අරමුණු සඵල කරගැනීමේ භාර දූර වගකීම වඩාත් හොදින් ඉටු කර ගැනීමට සමත් විය.

වැඩ හිතකර නම්‍යශීලී වැඩ පරිසරයක් ගොඩනැංවීම කෙරෙහි අපගේ දැඩි අවධානය මේවනවිටත් යොමු වී ඇත. මෙමගින් අපගේ සහෘද සේවකයන්ගේ ජීවන තත්වය උසස් කිරීමත්, ඔවුන්ගේ මානසික හා කායික සංවර්ධනය ඇතිකිරීම තුළින් කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය ඉහළ මට්ටමකට ලඟාකරලීම සඳහා වසර පුරා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. දැනුම, කුසලතා හා ආකල්ප දියුණු කිරීමේ අරමුණින් පුහුණු අවස්ථා ලබාදීමත්, විවිධ වැඩමුළු සංවිධානය කිරීමත් මගින් ඉහළ සේවක තෘප්තියක් ලබාදෙමින් සංස්ථාවේ අභිවෘද්ධිය උදෙසා සේවකයන් මෙහෙයවීමට කළමනාකාරිත්වයට හැකි විය. ශ්‍රී ලංකා රජයේ සංවර්ධන ප්‍රතිපත්ති සාර්ථක කර ගැනීමට උරදෙමින් 2100 කට අධික සේවක සංඛ්‍යාවකට රැකියා අවස්ථා සලසා දෙමින් ජාතික මෙහෙවරක් ලෙස සලකා ක්‍රියාකිරීමට අපි වගබලා ගත්තෙමු.

ආයතනයේ ප්‍රතිපත්ති හා අරමුණු ක්‍රියාත්මක කිරීමේදී පැණනඟින ගැටළු හමුවේ නිවැරදි තීන්දු තීරණ නිසි කලට ගැනීම තුලින් විසඳාගත් බොහෝ ගැටළු ආයතනයේ සංවර්ධනයට හේතු සාධකවිය. අභියෝග හමුවේ නොසැලී සිටී මේ හැකියාව කියා පාමින් කළමනාකාර මඩුල්ල මෙන්ම සේවකයන් ද අධ්‍යක්ෂ මණ්ඩලයේ තීන්දු තීරණ හා එක්ව මැනවින් කටයුතු කිරීම අගය කළ යුතුය.

අවසාන වශයෙන් සංස්ථාවේ උන්නතිය පිණිස අඛණ්ඩව කැපවී කටයුතු කරන සභාපතිතුමා, ක්‍රියාකාරි අධ්‍යක්ෂතුමා ප්‍රමුඛ අධ්‍යක්ෂ මණ්ඩලය මා ඉතා අගය කොට සලකන අතර, දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන සැපයුම්කරු ලෙස අඛණ්ඩව අප කෙරෙහි දැඩි පක්ෂපාතීත්වයක් දක්වමින්, අපගේ සාර්ථකත්වයට අත්තිවාරම සපයන්නා වූ පාරිභෝගික හිතවතුන්ට ද, මාගේ කෘතවේදීත්වය පිරිනමන අතර, අපගේ බැඳීම් තවදුරටත් ශක්තිමත් කරගනු වස් හැකි උපරිම ශක්‍යතාවයෙන් ඔබහට අනර්ඝතම දේ පුදකිරීමට අප සැදී පැහැදී සිටිමු. මීට අමතරව, අපගේ අරමුණු හා පරමාර්ථ ළඟාකර ගැනීම පිණිස පූර්ණ අනුග්‍රහය හා සහයෝගය ලබාදුන් ගරු මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යතුමා, නියෝජ්‍ය අමාත්‍යතුමා හා අමාත්‍යංශ ලේකම්තුමාට මාගේ හද පිරි ස්තුතිය පිරිනමමි.

සාර්ථකත්වයේ මාවත ඔස්සේ වේගවත් හා ස්ථිර ගමනක් යෑම පිණිස නිබඳ සහයෝගයක් දක්වන මාගේ කළමනාකරණ මඩුල්ලේ සියලුම සහෘදයන්ට සහ ලැදියාවෙන්, දැඩි පරිශ්‍රමයකින් හා කැපවීමෙන් ක්‍රියාකරනු ලබන 2100 කට අධික අපගේ කාර්ය මණ්ඩලයට මාගේ අතිශය ගෞරවය පිරිනමන අතර, 2015 වසර ඉතා සාර්ථකව අවසන් කිරීමට නන් අයුරින් සහයෝගය ලැබ දුන් සියලු දෙනාටත් මාගේ හෘදයංගම ප්‍රණාමය පුද කර සිටිමි.

**කේ. සිරිනිවංශ**
සාමාන්‍යාධිකාරී - රාජ්‍ය දැව සංස්ථාව

# කාර්යභාරයන්

වනාන්තරවලින් දැව කපා ඉවත්කිරීම, එම දැව ඉරූ දැව හා නිමි භාණ්ඩ බවට පරිවර්තනය කිරීම, දැව කඳන්, ඉරූ දැව හා නිමි භාණ්ඩ නිෂ්පාදන අලෙවිය සහ යථෝක්ත කාර්යයන් සඳහා කැලෑ මාර්ග ඉදිකිරීම.

දැව කඳන් කිරීමේ මධ්‍යස්ථාන, ඉරුම් මෝල්, තෙල් කැවීමේ හා පරිරක්ෂණ යන්ත්‍රාගාර, දැව වියළීම හා වියළීමේ උඳුන් හා අවශ්‍ය උපකරණ මිළදීගැනීම, ඉදිකිරීම හා ක්‍රියාකරවීම.

දැව අලෙවි මධ්‍යස්ථාන පවත්වාගෙන යාම.

දැව අතුරු භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවිය.

දැව ආනයනය කිරීම.

නව වනවගා ව්‍යාපෘති ආරම්භ කිරීම, නැවත වනවගා කිරීම, කැලෑ සහ වනවගාවන් විද්‍යාත්මකව කළමනාකරණය කිරීම.

කෘෂිකාර්මික නිෂ්පාදන.

දැව ආශ්‍රිත නිමි හා අර්ධ නිමි භාණ්ඩ නිෂ්පාදන අපනයනය කිරීම.

පෞද්ගලික ඉඩම් වලින් දැව මිලදීගැනීම.

වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන පිරි සැකසුම.

වේවැල් ආනයනය කිරීම.

නියැඳි පරීක්ෂා කිරීම් මගින් දේශීය හා ආනයනය කරන ලද දැව හඳුනා ගැනීම සහ දැව සම්බන්ධ සහතික නිකුත් කිරීම.

දැව කර්මාන්තය ආශ්‍රිත විෂයයන් පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම, සහතික ප්‍රදානය කිරීම සහ පරිසරය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම.

සංස්ථාවට අයත් ඉඩම් හා ගොඩනැගිලිවල සම්පූර්ණ ප්‍රයෝජනය ලබාගැනීම සඳහා සැලසුම් කිරීම සහ ඒ වෙනුවෙන් ආයෝජනය කිරීම.

# ව්‍යාපාරික වටිනාකම්

- ඉතාමත් පරිසර හිතකාමී සහ වාණිජ වශයෙන් ජීවමාන රාජ්‍ය අංශයේ ආයතනයක් ලෙස අපගේ ස්ථාවරත්වය පවත්වාගෙන යෑම අපගේ ප්‍රමුඛ වගකීම ලෙස හඳුනාගනිමු.
- පිවිතුරු සහ හිතකාමී පරිසරයක් සුරක්ෂිත කිරීම සඳහා වනාන්තර සහ දැව ඉවත් කිරීමේ විද්‍යානුකූල කළමණාකරණයට සම්බන්ධ සියළුම ව්‍යවස්ථාපිත රෙගුලාසීන්ට අනුකූලව එය ඉටු කිරීමට අපි කැපවෙමු.
- ගනුදෙනුකරුවන් සමඟ ආචාරශීලි ව්‍යාපාරික සබඳතා ගොඩනඟා ගනිමින්, ඔවුනට සහ සියළුම ශ්‍රී ලාංකිකයන්ට වටිනාකම් නිර්මාණය කිරීම අපගේ පැවැත්මේ මූලික ම කාරණය ලෙස අපි පිළිගන්නෙමු.
- කුසලතා වර්ධනය, වෘත්තීය සංවර්ධනය සහ නිරන්තර අධ්‍යාපනය සහ පුහුණුව තුළින් අපගේ සේවා නියුක්තිකයන්ගේ ඵලදායීතා මට්ටම ඉහළ නැංවීම සඳහා කටයුතු කරන්නෙමු.
- ගනුදෙනුකරුවන්ට කාර්යක්ෂම සහ ආචාරශීලී සේවයක් සැපයීම සඳහා අපගේ සියළු කාර්යයන්හි දී ඔවුන්ව මූලිකව තබා ගනිමින් කටයුතු කරන්නෙමු.
- සියළුම මෙහෙයුම් කටයුතු වලදී සහ සේවා සැපයීමේදී පුද්ගලික අවංකභාවය ඉතා ඉහළින්ම තබා ගන්නා බවට සහතික වන්නෙමු.
- අනාගත පරපුරේ අගනා ජාතික උරුමයන් ලෙස පරිසරය සහ වන සම්පත ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් සියළුම ව්‍යවස්ථාපිත රෙගුලාසි සහ සමාජීය ප්‍රතිමාන අනුගමනය කරන්නෙමු.



# අධ්‍යක්ෂක මණ්ඩලය - 2015



**පී.දිසානායක**
සභාපති - රාජ්‍ය දැව සංස්ථාව



**එච්.වයි.ටී.පවරකුමාර**
ක්‍රියාකාරී අධ්‍යක්ෂක - රාජ්‍ය දැව සංස්ථාව



**එම්.ඒ.කරුණාරත්න**
අධ්‍යක්ෂක (භාණ්ඩාගාර නියෝජිත)



**එස්.ඒ.ඒ.සතුරුසිංහ**
අධ්‍යක්ෂක (වන සංරක්ෂණ ජනරාල්)



**එම්.වී.කරුණාරත්න**
අධ්‍යක්ෂක



**පී.පන්සලවත්ත**
අධ්‍යක්ෂක



**ඒ.එම්.සී.පෙරේරා මහතා**
අධ්‍යක්ෂක

# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මඬුල්ල - 2015



**කේ. සිරිනිවංශ**
සාමාන්‍යාධිකාරී

**ඩී.යූ. දයාරත්න**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(තොරතුරු තාක්ෂණ)

**ආචාර්ය එන්. රුවන්පතිරණ**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(පර්යේෂණ, පුහුණු හා සංවර්ධන)

**එච්.පී.එස්.නවරත්න**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(මෙහෙයුම්)

**ඩබ්.ඩබ්.එම්.ජේ. කුරේ**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(අභ්‍යන්තර විගණන)

**පී.ඩී.එස්. කුමාරසිංහ**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(මූල්‍ය)

**පි.පී.ආර්. සමරවීර**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(අලෙවි)



**එස්.එස්.පඬුවාවල**
ස.සාමාන්‍යාධිකාරී



**එම්.සී.දේවේන්ද්‍ර**
ස.සාමාන්‍යාධිකාරී



**පී. ගුණවංශ**
ස.සාමාන්‍යාධිකාරී

" බාධක ජයගනිමින් නැගී සිටින හැම මොහොතකම
අවංක කැපවීම හා නව්‍යකරණය තුළින්
සාර්ථකත්වය කරා පියනගමු...."



## පළවන පරිච්ඡේදය

*සංස්ථාවේ අරමුණු හා ඉලක්ක ළඟාකර ගැනීමේ අභිලාෂයෙන් හා අපේක්ෂිත මුදල් ප්‍රවාහය ළඟාකරගෙන මූල්‍යමය අතින් ශක්තිමත් ආයතනයක් බවට තහවුරු කිරීමේ අරමුණින් නව අවස්ථාවන්, නව අදහස් හා කළයුතු වෙනස්කම් සම්බන්ධයෙන් නිබඳවම සොයා බලනු ලැබේ.*

# 2015 වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචනය

මෙම වර්ෂයේ සංස්ථාව විසින් රු.මිලියන 3,836 ක පිරිවැටුමක් ලඟාකරගත් අතර, (පසුගිය වසරේ පිරිවැටුම රු.මිලියන 3,474 කි.) එය පසුගිය වසරට සාපේක්ෂව 10% ක ඉහළයාමකි. පසුගිය වර්ෂයේ දළ ලාභය රු.මිලියන 1,453 ක් වූ අතර, මෙම වර්ෂයේ දළ ලාභය රු.මිලියන 1,757 කි. එය පසුගිය වසරට සාපේක්ෂව 21% ක ඉහළයාමකි. 2015 වර්ෂයේ පසුගිය වර්ෂවලට සාපේක්ෂව ඉහළ පිරිවැටුමක් ලඟා කර ගැනීමට හඳුන්වා දුන් නව ප්‍රතිපත්ති ආර්ථික තත්වය සහ දේශපාලනමය සාධක ඉවහල් වූ අතර එමඟින් සංස්ථාවේ ලාභය සහ කාර්ය සාධනය ඉහළ යාමට සෘජුව බලපාන ලදී.

*රු.මිලියන 427 ක පසුගිය වර්ෂයේ භාණ්ඩාගාර හා ආදායම් බදු පෙර ශුද්ධ ලාභයට සාපේක්ෂව මෙම වර්ෂයේ භාණ්ඩාගාර හා ආදායම් බදු පෙර ශුද්ධ ලාභය රු.මිලියන 769 ක් දක්වා රු.මිලියන 342 කින් වැඩිවී ඇත. ආයතන හා පරිපාලන, විකුණුම් හා බෙදාහැරීමේ වියදම් රු.මිලියන 1,284 දක්වා අඩු වූ අතර පසුගිය වසරට සාපේක්ෂව එය 2% අඩු වීමකි.*

| කාර්යසාධනය | 2015 (රු. මිලියන) | 2014 (රු. මිලියන) |
|---|---|---|
| පිරිවැටුම | දශ,836 | 3,474 |
| ලාභය | 1,757 | 1,453 |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 73 | 60 |
| මෙහෙයුම් ලාභය | 546 | 204 |
| මෙහෙයුම් නොවන ආදායම් | 223 | 223 |
| භාණ්ඩාගාරයට ගෙවූ විශේෂ බදු | 50 | 25 |
| භාණ්ඩාගාර හා ආදායම් බදු පෙර ලාභය | 769 | 427 |

රු.මිලියන 427 ක පසුගිය වර්ෂයේ භාණ්ඩාගාර හා ආදායම් බදු පෙර ශුද්ධ ලාභයට සාපේක්ෂව මෙම වර්ෂයේ භාණ්ඩාගාර හා ආදායම් බදු පෙර ශුද්ධ ලාභය රු.මිලියන 769 ක් දක්වා රු.මිලියන 342 කින් වැඩිවී ඇත. ආයතන හා පරිපාලන, විකුණුම් හා බෙදාහැරීමේ වියදම් රු.මිලියන 1,284 දක්වා අඩු වූ අතර පසුගිය වසරට සාපේක්ෂව එය 2% අඩු වීමකි.

පසුගිය වසරට සාපේක්ෂව ආයතන හා පරිපාලන වියදම් වල අඩුවීමක් දක්නට ඇති අතර යථෝක්ත වර්ෂයේ ආයතන හා පරිපාලන වියදම් 5% කින් අඩුවී ඇත. 2014 වර්ෂයේ ආයතන හා පරිපාලන වියදම් සහ විකුණුම් හා බෙදාහැරීමේ වියදම් අඩු කිරීමෙන් පසු විශේෂ භාණ්ඩාගාර බදු සහ ආදායම් බදු පසු ශුද්ධ ලාභය රු.මිලියන 370 කි. එය පසුගිය වසරට සාපේක්ෂව රු.මිලියන 164 ක වැඩිවීමකි.

වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය හා හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය 2015 වර්ෂයේ පිළිවෙලින් 6% ක් හා 9% ක් වේ.













| වර්ෂය | වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය | හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය |
|---|---|---|
| 2015 | 6% | 9% |
| 2014 | 4% | 6% |

2015 වර්ෂයේ රාජ්‍ය ආදායම සඳහා සංස්ථාවේ දායකත්වය රු.මිලියන 1,594 කි. එය පසුගිය වර්ෂයේ රු.මිලියන 1,396 කි.









## නිෂ්පාදනය

### රජයේ කැලෑවලින් දැව හෙලීම්

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වන කළමනාකරණ සැලැස්මකට අනුව හෙලීම් සඳහා තේක්ක, පයිනස් සහ යුකැලිප්ටස් වැනි වනවගා නිදහස් කරනු ලබන අතර 2014 හා 2015 වර්ෂ වල හෙලීම් සඳහා නිදහස් කර ඇති හෙක්ටයාර් ප්‍රමාණය පහත පරිදි වේ.

| දැව විශේෂය | පූර්ණ හෙලීම් (හෙක්ටයාර්) | | තුනීකිරීම් (හෙක්ටයාර්) | |
|---|---|---|---|---|
| | 2015 | 2014 | 2015 | 2014 |
| තේක්ක | 444.9 | 538.0 | 221.70 | 382.3 |
| යුකැලිප්ටස් | 40.3 | 20.0 | 272.54 | 98.0 |
| පයිනස් | 104.6 | 136.3 | - | - |
| කායා | - | - | 45.20 | - |
| ඇකේෂියා | 16.0 | 9.0 | - | 6.5 |

### ඉරූ දැව පරිවර්තනය කිරීම

2014 වර්ෂයේ ඉරුදැව නිෂ්පාදනය ඝන මීටර් 4,239 ට සාපේක්ෂව 2015 වර්ෂය තුළදී ඉරුදැව ඝන මීටර් 4,562 ක් ඉරුම්හල් මගින් නිෂ්පාදනය කර ඇති අතර, ඝන මීටර් 3,124 ක් දිවයින පුරා පිහිටා ඇති දැව අලෙවි ගබඩා මගින් අලෙවි කර ඇත.

### විදුලි කණු සහ සිල්පර පරිරක්ෂණය කිරීම

2015 වර්ෂය තුලදී සිල්පර 21,919 ක්, විදුලිකණු 21,636 ක් හා අලිවැටකණු 76,061 ක් රාජ්‍ය දැව සංස්ථාවේ කල්දෙමුල්ල, කැප්පෙටිපොල හා බුස්ස පරිරක්ෂණාගාර වලින් පරිරක්ෂණය කර ඇත.

පසුගිය වසරට සාපේක්ෂව 2015 වසරේ අලි වැට කණු නිෂ්පාදනයේ සැලකිය යුතු ඉහළයෑමක් දක්නට ඇත.

### ගෘහභාණ්ඩ නිෂ්පාදනය

රාජ්‍ය දැව සංස්ථාවේ අම්පාර, කල්දෙමුල්ල හා බුස්ස ගෘහභාණ්ඩ නිෂ්පාදනාගාර වලින් රුපියල් මිලියන 255.6 ක් වටිනා ගෘහභාණ්ඩ සලකා බලන වර්ෂය තුලදී නිෂ්පාදනය කර ඇත. ඒ අතර රුපියල් මිලියන 264 ක ශුද්ධ වටිනාකමින් යුත් ගෘහභාණ්ඩ රාජ්‍ය දැව සංස්ථාවේ රත්මලාන, මහනුවර, රත්නපුර, තලල්ල, බුස්ස හා අම්පාර ගෘහභාණ්ඩ ප්‍රදර්ශනාගාර වලින් අලෙවි කර ඇත.

### 2014 - 2015 වර්ෂවල නිෂ්පාදනය, අලෙවිය හා ආදායම

| | | නිෂ්පාදන ප්‍රමාණය | | අලෙවි ප්‍රමාණය | | දළ පිරිවැටුම (රු.මි.) | |
|---|---|---|---|---|---|---|---|
| | | 2015 | 2014 | 2015 | 2014 | 2015 | 2014 |
| කඳන් | ඝ.මී | 126,465 | 131,162 | 127,424 | 118,231 | 2,890.5 | 2,336.8 |
| ඉරුදැව | ඝ.මී | 4,562 | 4,239 | 3,124 | 2,567 | 266.8 | 185.4 |
| සිල්පර | ඒකක | 21,919 | 39,389 | 27,727 | 64,761 | 250.5 | 568.7 |
| විදුලිකණු | ඒකක | 21,636 | 41,332 | 25,637 | 32,567 | 259.6 | 314.0 |
| අලිවැටකණු | ඒකක | 76,061 | 38,630 | 81,025 | 36,088 | 250.6 | 104.5 |
| වටකණු | ඒකක | 89,927 | 126,333 | 88,074 | 126,130 | 11.3 | 12.8 |
| දර | ඝ.මී | 87,159 | 105,537 | 86,541 | 102,301 | 56.1 | 47.0 |
| වැටකණු | ඒකක | 65,748 | 110,254 | 73,179 | 116,635 | 9.6 | 9.8 |





## අපගේ ආවරණ කලාප

ප්‍රාදේශීය කාර්යාල 12ක්, දිවයින පුරා ක්‍රියාත්මක වන දැව අලෙවි ගබඩා 54ක්, කල්දෙමුල්ල, අම්පාර සහ බූස්ස යන ස්ථානයන් හි ගෘහභාණ්ඩ නිෂ්පාදනාගාර 3ක්, මහනුවර, රත්නපුර, තලල්ල, අම්පාර, කල්දෙමුල්ල සහ බූස්ස, යන ස්ථානයන්හි ගෘහභාණ්ඩ ප්‍රදර්ශනාගාර 6 ක්ද කැප්පෙටිපොළ, කල්දෙමුල්ල සහ බූස්ස යන ස්ථානවල දැව පරිරක්ෂණාගාර 03ක්, ලී මෝල් 06ක් අම්පාර, මහනුවර, බූස්ස, කල්දෙමුල්ල, රත්මලාන සහ තලල්ල යන ස්ථානවලත්, බණ්ඩාරවෙල ලී මෝල් 04 ක්, රත්නපුර ලී මෝල් 02ක්, කැප්පෙටිපොළ ලී මෝල් 04ක් සහ කුරුණෑගල ලී මෝල් 02 ක් ද ආදී වශයෙනුත් පවත්වා ගනිමින් රටේ සෑම කොටසක්ම ආවරණය වන පරිදි, රටේ සමස්ථ ජනකොටිඨාශ වෙත සේවා සැපයිය හැකි පරිදි අපගේ මෙහෙයුම් ජාලය ඉතාමත් හොඳින් සැලසුම් කර ඇත.



## අම්පාර ප්‍රාදේශිකය



- මඩකලපුව අලෙවි ගබඩාව
- පදියතලාව අලෙවි ගබඩාව
- අම්පාර ප්‍රාදේශීය කාර්යාලය
- අම්පාර අලෙවි ගබඩාව
- අම්පාර ලී මෝල
- අම්පාර ප්‍රදර්ශනාගාරය



## අනුරාධපුර ප්‍රාදේශිකය



- වවුනියාව අලෙවි ගබඩාව
- මැදවච්චිය අලෙවි ගබඩාව
- අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය
- අනුරාධපුර අලෙවි ගබඩාව
- තලාව අලෙවි ගබඩාව



## බණ්ඩාරවෙල ප්‍රාදේශිකය



- බොරලන්ද අලෙවි ගබඩාව
- බණ්ඩාරවෙල ප්‍රාදේශීය කාර්යාලය
- බණ්ඩාරවෙල ලී මෝල



## කොළඹ ප්‍රාදේශිකය



- නයිනමඩම අලෙවි ගබඩාව
- මීරිගම අලෙවි ගබඩාව
- කඩවත අලෙවි ගබඩාව
- ඔරුගොඩවත්ත අලෙවි ගබඩාව
- කොළඹ ප්‍රාදේශීය කාර්යාලය
- පන්නිපිටිය අලෙවි ගබඩාව
- පිළියන්දල අලෙවි ගබඩාව
- කල්දෙමුල්ල නව අලෙවි ගබඩාව
- කල්දෙමුල්ල අලෙවි ගබඩාව
- කල්දෙමුල්ල ලී මෝල
- රත්මලාන අලෙවි ගබඩාව
- රත්මලාන ප්‍රදර්ශනාගාරය
- රත්මලාන ලී මෝල
- එගොඩඋයන අලෙවි ගබඩාව
- මොරටුමුල්ල අලෙවි ගබඩාව
- විල්ලෝරාවත්ත අලෙවි ගබඩාව



## යාපනය ප්‍රාදේශිකය



- යාපනය ප්‍රාදේශීය කාර්යාලය
- යාපනය අලෙවි ගබඩාව
- නල්ලූර් අලෙවි ගබඩාව
- කිලිනොච්චි අලෙවි ගබඩාව



## මහනුවර ප්‍රාදේශිකය



- දඹුලුඔය අලෙවි ගබඩාව
- මාතලේ අලෙවි ගබඩාව
- පල්ලෙකැලේ අලෙවි ගබඩාව
- මහනුවර ප්‍රාදේශීය කාර්යාලය
- මහනුවර ප්‍රදර්ශනාගාරය
- නෙළුන්දෙනිය අලෙවි ගබඩාව
- ඇත්ගාල අලෙවි ගබඩාව
- ඇත්ගාල ලී මෝල



## කුරුණෑගල ප්‍රාදේශිකය




## මොණරාගල ප්‍රාදේශිකය




## මාතර ප්‍රාදේශිකය






## නුවරඑළිය ප්‍රාදේශිකය




## පොළොන්නරුව ප්‍රාදේශිකය




## රත්නපුර ප්‍රාදේශිකය



## ඉලක්ක හා සපුරාගැනීම් පිළිබඳ සමාලෝචනය සහ අධීක්ෂණය

සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා සියලුම ප්‍රාදේශීය කළමනාකරුවන් හා සංස්ථාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්ගේ සහභාගීත්වයෙන් මාසිකව කළමනාකරණ රැස්වීම් පවත්වනු ලබන අතර, එහිදී සත්‍ය කාර්යසාධනය, නිෂ්පාදනය සහ අලෙවි ඉලක්ක සමග සසඳා බලනු ලැබේ. මෙම රැස්වීම් වලදී සියලුම බාධක හා ගැටළු අදාල ප්‍රාදේශීය කළමනාකරුවන් සමග සාකච්ඡා කර හඳුනාගනු ලබන අතර, ඒ සම්බන්ධ විවිධ තීරණ හා විකල්ප ක්‍රියාමාර්ග යෝජනා කර පසුව එම යෝජනා ඇගයීමට ලක්කර ක්‍රියාත්මක කරනු ලැබේ. තවද සංස්ථාවේ අරමුණු හා ඉලක්ක ළඟාකර ගැනීමේ අභිලාෂයෙන් හා අපේක්ෂිත මුදල් ප්‍රවාහය ළඟාකරගෙන මුල්‍යමය අතින් ශක්තිමත් ආයතනයක් බවට තහවුරු කිරීමේ අරමුණින් නව අවස්ථාවන්, නව අදහස් හා කළයුතු වෙනස්කම් සම්බන්ධයෙන් ද සාකච්ඡා කරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කළේ

**පී.දිසානායක**
සභාපති - රාජ්‍ය දැව සංස්ථාව.

*රටේ සෑම කොටසක්ම ආවරණය වන පරිදි, රටේ සමස්ථ ජනකොට්ඨාශ වෙත සේවා සැපයිය හැකි පරිදි අපගේ මෙහෙයුම් ජාලය ඉතාමත් හොඳින් සැලසුම් කර ඇත.*





# රාජ්‍ය දැව සංස්ථාවේ විගණන හා කළමනාකරණ කමිටුවේ වාර්තාව - 2015

### රාජ්‍ය දැව සංස්ථාවේ විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජිකයන්

| | | |
|---|---|---|
| එම්.ඒ.කරුණාරත්න මහතා | - | කමිටු සභාපති |
| එස්.ඒ.ඒ.සතුරුසිංහ මහතා | - | කමිටු සාමාජික |
| එම්.වී.කරුණාරත්න මහතා | - | කමිටු සාමාජික |

2015 වර්ෂයට අදාලව පහත සඳහන් කරුණු අදාල රැස්වීම්වලදී සාකච්ඡා කර ඇති අතර, එහිදී ගන්නා ලද තීරණ අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය සඳහා නිර්දේශ සහිතව ඉදිරිපත් කරන ලදී.

1. මාසික මූල්‍ය හා භෞතික කාර්යසාධනය
2. වාර්ෂික ගිණුම්
3. වාර්ෂික අයවැය හා සංශෝධිත අයවැය
4. අභ්‍යන්තර විගණන හා විගණකාධිපතිගේ විගණන විමසුම් හා පිළිතුරු
5. පිරිස් හා පාලන කාර්යයන්
6. නීති කටයුතු
7. සේවක ණය, අත්තිකාරම් සහ ටෙන්ඩර් පිරිනැමීම

**එම්. ඒ. කරුණාරත්න**
සභාපති - විගණන හා කළමනාකරණ කමිටුව



# දෙවන පරිච්ඡේදය

*මුදල් ප්‍රවාහය, මූල්‍යමය වත්කම් හා වගකීම්, ප්‍රාග්ධන වියදම් සහ ලාභ ආදියෙන් සමන්විත වේ. සංස්ථාව ලබා ඇති ලාභ හා වියදම් පෙන්නුම් කරන දර්ශකයන් මගින් ආයෝජන සැලසුම් හා ක්‍රියාකාරී සැලසුම් මනා මුදල් පාලනයක් ඇතිව ක්‍රියාත්මක කර ඇති බවට සාක්ෂි දරනු ඇත.*



## මූල්‍ය හා නිෂ්පාදන කාර්යසාධනය

පසුගිය වාර්තා අනුව වසර පහක සංස්ථාවේ මූල්‍ය ස්ථාවරත්වය පවත්වාගෙන යාම පිළිබඳව හා මුදල් තත්ත්වය ඉහළ නැංවීම දැක්වෙන සංක්ෂිප්තය.

වසර පහක් තුළ මූල්‍ය කාර්යසාධනයේ සංක්ෂිප්තය, මුදල් ප්‍රවාහය, මූල්‍යමය වත්කම් හා වගකීම්, ප්‍රාග්ධන වියදම් සහ ලාභ ආදියෙන් සමන්විත වේ. සංස්ථාව ලබා ඇති ලාභ හා වියදම් පෙන්නුම් කරන දර්ශකයන් මගින් ආයෝජන සැලසුම් හා ක්‍රියාකාරී සැලසුම් මනා මුදල් පාලනයක් ඇතිව ක්‍රියාත්මක කර ඇති බවට සාක්ෂි දරනු ඇත.
පසුගිය වසර කිහිපය හා සැසඳීමේදි මෙම වසර තුළ මුදල්මය වශයෙන් ලබා ඇති දියුණුව තුළින් සංස්ථාවේ මූල්‍ය ස්ථාවරත්වය හා තිරසාරත්වය පිළිබඳව ඉදිරි කාලය සඳහා පියවර ගෙන ඇති බව තහවුරු වේ.
තවද මුදල් අංශයේ සහ මෙහෙයුම් අංශයේ සියලු අරමුණු සාක්ෂාත් කරගැනීම තුළින් ආයතනික සැලැසුම් අනුව කටයුතු කර ඇති බව තහවුරු වේ.

*පසුගිය වසර කිහිපය හා සැසඳීමේදි මෙම වසර තුළ මුදල්මය වශයෙන් ලබා ඇති දියුණුව තුළින් සංස්ථාවේ මූල්‍ය ස්ථාවරත්වය හා තිරසාරත්වය පිළිබඳව ඉදිරි කාලය සඳහා පියවර ගෙන ඇති බව තහවුරු වේ.*



# ආදායම් වර්ධන ප්‍රවනතා විශ්ලේෂණය

බදු සහිත (රු. 000)




බදු රහිත (රු. 000)




# ලාභ වර්ධන ප්‍රවණතා විශ්ලේෂණය

දළ ලාභය (රු. 000)




ආදායම් හා භාණ්ඩාගාර බදු ගෙවීමට
පෙර ශුද්ධ ලාභය (රු. 000)




මෙහෙයුම් ලාභය (රු. 000)




# නිෂ්පාදනය වර්ධනයවීමේ ප්‍රවනතා විශ්ලේෂණය

කඳන් නිෂ්පාදනය (ඝ.මී)




ඉරූ දැව නිෂ්පාදනය (ඝ.මී)




සිල්පර නිෂ්පාදනය (ඒකක)




විදුලි සම්ප්‍රේෂණ කණු නිෂ්පාදනය (ඒකක)




ගෘහ භාණ්ඩ නිෂ්පාදනය (රු. මිලියන)




අලි වැට කණු නිෂ්පාදනය (ඒකක)




# අගය එකතු කිරීම









## ප්‍රග්ධන ආයෝජනය - 2015

| **විස්තරය** | **රු:** |
|---|---|
| සහකාර ප්‍රාදේශීය කළමනාකාර කාර්යාලය - පොලොන්නරුව | 10,210,054 |
| නිල නිවාසය - නුවරඑලිය ප්‍රාදේශීය කාර්යාලය | 14,787,684 |
| නිල නිවාසය - කඳපොළ | 11,437,881 |
| කන්කානියමුල්ල ගබඩාව සහ සහකාර ප්‍රාදේශීය කළමනාකාර කාර්යාලය | 13,822,991 |
| රත්මලාන ප්‍රාදේශීය කළමනාකාර කාර්යාලය | 8,583,796 |
| රත්නපුර දැල ගබඩා ගොඩනැගිල්ල | 8,287,497 |
| Cat 3 exavator - පොළොන්නරුව | 15,690,000 |
| මොණරාගල log loader යන්ත්‍රය | 15,690,000 |
| Wide belt sander holytex - S2DA - කල්දෙමුල්ල ගෘහ භාණ්ඩ නිෂ්පාදනාගාරය. | 5,579,911 |
| Wood Mizer බණ්ඩාරවෙල | 7,709,007 |
| Toyota 4wd double cab-3 ක් | 20,400,000 |
| Isuzu Jeep | 9,125,000 |
| Mistubishi double cab - 4ක් | 24,000,000 |
| Toyata Hilux double cab - 2 ක් | 13,600,000 |

| **ආයෝජනය** | **2015** | **2014** |
|---|---|---|
| | **රු:** | **රු:** |
| රාජ්‍ය ආයතනවල තාවකාලික අතිරික්ත අරමුදල් ගිණුම් | 382,550,525 | 360,226,630 |
| මහජන බැංකුව | 738,673,524 | 696,410,412 |
| ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ මණ්ඩලය | 500,000 | 500,000 |
| ලංකා බැංකුව | 1,238,592,415 | 877,910,713 |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | 140,049,121 | 130,485,324 |
| **එකතුව** | **2,500,365,585** | **2,065,533,079** |



## දශකයක තොරතුරු

| (නිරපේක්ෂ සංඛ්‍යා) | | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මුළු වාර්ෂික ආදායම | රු.'000 | 2,106,155 | 2,531,611 | 2,986,925 | 3,445,141 | 3,616,164 | 3,103,744 | 3,563,390 | 3,213,547 | 3,756,482 | 4,132,052 |
| වාර්ෂික දළ ලාභය | රු.'000 | 966,095 | 1,050,896 | 1,210,845 | 1,351,695 | 1,365,285 | 1,237,640 | 1,546,107 | 1,197,518 | 1,453,451 | 1,757,114 |
| පොළී සහ ආදායම් බදුවලට පෙර ශුද්ධ ලාභය | රු.'000 | 480,641 | 488,535 | 647,039 | 810,612 | 877,623 | 603,499 | 801,681 | 382,337 | 427,222 | 768,699 |
| මළු සේවක පිරිවැය | රු.'000 | 774,751 | 841,831 | 852,879 | 898,652 | 901,910 | 953,498 | 1,065,052 | 1,117,036 | 1,254,516 | 1,449,746 |
| වාර්ෂික ප්‍රාග්ධන වියදම් | රු.'000 | 13,523 | 95,745 | 141,327 | 112,909 | 237,332 | 180,546 | 162,509 | 332,870 | 115,132 | 244,929 |
| වර්ෂාවසාන ජංගම නොවන වත්කම් | රු.'000 | 1,579,613 | 1,338,570 | 1,523,553 | 1,793,467 | 1,801,988 | 1,739,893 | 1,479,880 | 1,658,535 | 1,654,908 | 1,743,579 |
| වර්ෂාවසාන ජංගම වත්කම් | රු.'000 | 962,569 | 1,545,428 | 1,407,022 | 2,079,543 | 2,341,020 | 2,177,892 | 2,929,185 | 3,153,777 | 4,004,860 | 4,115,259 |
| වර්ෂාවසාන ජංගම වගකීම් | රු.'000 | 528,005 | 690,558 | 455,460 | 1,028,979 | 1,034,258 | 497,229 | 804,102 | 1,050,258 | 1,591,991 | 1,480,965 |
| වර්ෂාවසාන ජංගම නොවන වගකීම් | රු.'000 | 341,581 | 370,816 | 362,399 | 364,553 | 399,057 | 399,953 | 409,030 | 384,831 | 484,649 | 424,853 |
| වර්ෂාවසාන ස්කන්ධය | රු.'000 | 1,672,595 | 1,822,624 | 2,112,716 | 2,479,478 | 2,709,694 | 3,020,602 | 3,195,933 | 3,377,223 | 3,583,129 | 3,953,019 |
| ඒකාබද්ධ අරමුදලට දායකත්වය | රු.'000 | 75,000 | 150,000 | 75,000 | 50,000 | 413,490 | 75,000 | 600,000 | 50,000 | 25,000 | 50,000 |
| වර්ෂාවසාන සේවක සංඛ්‍යාව | සංඛ්‍යාව | 2,751 | 2,634 | 2,499 | 2,457 | 2,346 | 2,267 | 2,187 | 2,139 | 2,186 | 2,145 |
| වර්ෂාවසාන අතිරික්ත අරමුදල් ආයෝජන ශේෂය | රු.'000 | 1,267,102 | 834,037 | 777,101 | 858,717 | 605,235 | 764,328 | 298,546 | 338,010 | 360,227 | 382,550 |
| ප්‍රධාන ක්‍රියාකාරී දර්ශක | | | | | | | | | | | |
| ස්කන්ධයට ආදායම් බදු වලට පෙර ශුද්ධ ලාභය | % | 28.74 | 26.80 | 30.63 | 32.69 | 32.39 | 19.98 | 25.08 | 11.32 | 11.92 | 19.45 |
| මුළු වත්කම් වලට පොළී හා බදුවලට පෙර ශුද්ධ ලාභය | % | 18.91 | 16.94 | 22.08 | 20.93 | 21.18 | 15.40 | 18.18 | 7.94 | 7.55 | 13.12 |
| ජංගම අනුපාතය | වාර ගණන | 1.82 | 2.24 | 3.09 | 2.02 | 2.26 | 4.38 | 3.64 | 3.00 | 2.52 | 2.78 |
| එක් සේවකයෙකුට සේවක පිරිවැය | රු. '000 | 282 | 320 | 341 | 366 | 384 | 421 | 487 | 522 | 574 | 676 |
| ස්කන්ධයට වත්කම් අනුපාතය | වාර ගණන | 0.66 | 0.63 | 0.72 | 0.64 | 0.65 | 0.77 | 0.72 | 0.70 | 0.63 | 0.67 |
| වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය | % | 18.91 | 16.94 | 22.08 | 20.93 | 21.18 | 15.40 | 18.18 | 7.94 | 7.55 | 13.12 |
| මළු පිරිවැටුම් වර්ධනය | % | 37.74 | 20.20 | 17.99 | 15.34 | 4.96 | (14.17) | 14.81 | (9.82) | 16.89 | 10.08 |



# ජාතික ආර්ථිකයට රාජ්‍ය දැව සංස්ථාවේ දායකත්වය

*රටේ ආර්ථික දියුණුව උදෙසා නවෝත්පාදන බිහිකිරීමටත්, ඵලදායී ලෙස ප්‍රාග්ධනය හා නිපුණතා භාවිතයට පෙළඹවීමත්, නව භාණ්ඩ හා සේවා නිෂ්පාදන ක්‍රමෝපායන් හඳුන්වාදෙමින් වෙළඳපොළ සංවර්ධනය කිරීමටත් කටයුතු කරමින් පවතී.*

# ජාතික ආර්ථිකයට රාජ්‍ය දැව සංස්ථාවේ දායකත්වය.

දැව කර්මාන්තයේ ප්‍රමුඛයා ලෙස වැජඹෙන රාජ්‍ය දැව සංස්ථාව ආර්ථික වර්ධනය හා සංවර්ධනය උදෙසා අනගි මෙහෙවරක් ඉටුකරයි. රාජ්‍ය දැව සංස්ථාව දැව කර්මාන්ත අංශයේ දියුණුව සඳහා පමණක් නොව, අනෙකුත් අංශයන්ගේ දියුණුව සඳහා ද වැදගත් කාර්යභාරයක් ඉටුකරයි. වර්ෂ 2015 දී රු.මිලියන 1,594 ක ස්කන්ධ භාග එකතු කළ අගය මත බදු, ජාතිය ගොඩනැඟීමේ බදු, ආදායම් බදු සහ භාණ්ඩාගාරයට ගෙවූ බදු වශයෙන් රාජ්‍ය දැව සංස්ථාව ජාතික ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් සපයා ඇත.

**2011 - 2015 වර්ෂවල ස්කන්ධභාග, එකතු කළ අගය මත බදු හා ජාතිය ගොඩනැඟීමේ බදු, ආදායම් බදු සහ භාණ්ඩාගාරයට ගෙවූ විශේෂ බදු සාරාංශය පහතින් දැක්වේ.**

| | 2011 | 2012 | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|---|
| ස්කන්ධ භාග | 777,852,620 | 831,555,555 | 706,779,429 | 743,675,772 | 891,797,062 |
| එකතු කළ අගය මත බදු, ජාතිය ගොඩනැඟීමේ බදු | 433,254,605 | 447,825,030 | 387,928,678 | 424,740,460 | 418,055,273 |
| ආදායම් බදු | 242,640,682 | 192,453,384 | 131,882,763 | 202,347,603 | 234,000,000 |
| භාණ්ඩාගාරයට ගෙවූ බදු | 75,000,000 | 600,000,000 | 50,000,000 | 25,000,000 | 50,000,000 |
| මුළු දායකත්වය | 1,528,747,907 | 2,071,833,969 | 1,276,590,870 | 1,395,763,835 | 1593,852,335 |

## ජාතික ආර්ථිකයේ උන්නතිය උදෙසා රාජ්‍ය දැව සංස්ථාවේ දායකත්වය.

1. රාජ්‍ය දැව සංස්ථාව සමාජයේ වැඩි පිරිසකට රැකියා අවස්ථා ලබාදෙමින්, ජාතික ආර්ථික සංවර්ධනයට බලපාන ප්‍රබල සාධකයක් වන සේවා වියුක්තිය පහත හෙළීමට මහඟු මෙහෙවරක් ඉටුකරමින් පවතී.

2. රාජ්‍ය දැව සංස්ථාව අති දුෂ්කර ප්‍රදේශවල ප්‍රාදේශීය කාර්යාල පිහිටුවමින් ප්‍රාදේශීය සංවර්ධනය ඇති කිරීමටත්, ප්‍රාදේශීය විෂමතා ඉවත් කිරීමටත් කටයුතු කරයි. එවැනි ප්‍රදේශවල ව්‍යාපාර කටයුතු පුළුල් කිරීමෙන් පොදු පහසුකම් රැසක් වැඩිදියුණු වීමට මඟපාදා ඇත.

3. රටේ ආර්ථික දියුණුව උදෙසා නවෝත්පාදන බිහිකිරීමටත්, ඵලදායී ලෙස ප්‍රාග්ධනය හා නිපුණතා භාවිතයට පෙළඹවීමත්, නව භාණ්ඩ හා සේවා නිෂ්පාදන ක්‍රමෝපායන් හඳුන්වාදෙමින් වෙළඳපොළ සංවර්ධනය කිරීමටත් කටයුතු කරමින් පවතී.

4. රටේ ජනතාවගේ ජීවන තත්වය උසස්වීම යනු ආර්ථික සංවර්ධනයේ ප්‍රබලම අංගයකි. සාධාරණ මිලකට ඉහළ ගුණත්වයෙන් යුත් භාණ්ඩ සපයමින්, විවිධ භාණ්ඩ හා සේවා වෙළඳපොළට හඳුන්වාදීමටත්, සමාජයටත් මෙන්ම පරිසරයටත් හිතකර ඉහළ දායකත්වයක් ලබාදීමටත් රාජ්‍ය දැව සංස්ථාව කටයුතු කරමින් පවතී.

5. ආර්ථිකයේ සුභදායී පැවැත්ම හා සංවර්ධනය සහතික කිරීමට හේතුවන, ආනයන වෙළඳපොළට එරෙහිව විදේශ විනිමය ආදායම ඉහළ නැංවීමට රාජ්‍ය දැව සංස්ථාව අපනයන වෙළඳපොළ කරා ප්‍රවේශ වීමෙන් විදේශ විනිමය ඉපැයීමට කටයුතු යොදමින් පවතී.



6. රාජ්‍ය දැව සංස්ථාව, දැව වෙළඳපොළේ ඒකාධිකාරී බලයක් ඇතිවීම වැලැක්වීම සඳහා දැව කර්මාන්තයේ සම්පූර්ණ ක්‍රියාවලියට සම්බන්ධ වෙමින් හා එය පාලනය කරමින් රාජ්‍ය හා ජාතික මට්ටමේ පහසුකම් සැලසීමට දායක වෙයි.

7. රටේ වැඩි පිරිසක් අතරත්, විවිධ භූගෝලීය ප්‍රදේශයන් අතරත්, සාධාරණ ආදායම් හා ධන ව්‍යාප්තියක් ඇති කිරීම සඳහා පෙළඹවීම.

8. සමාජ වගකීමෙන් යුක්ත රාජ්‍ය දැව සංස්ථාව පරිසරය ආරක්ෂා කිරීමටත්, පරිසර හිතකාමී කාර්යයන් ප්‍රවර්ධනය කිරීමටත් විවිධ වැඩසටහන් මෙහෙයවමින් පවතී.





# සංස්ථාපිත පාලනය

සංස්ථාපිත පාලනය යනු ආයතනයේ ව්‍යුහය හා සම්බන්ධතාවය පිළිබඳ මනා අවබෝධයක් ලබාදීම මගින් ආයතනයේ දිශාව හා කාර්යසාධනය තීරණය කෙරෙන අතර, අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සංස්ථාපිත පාලනයේ වගකීම් දරන්නෝ වෙති.

# සංස්ථාපිත පාලනය

***සංස්ථාපිත පාලනය යනු ආයතනයේ ව්‍යුහය හා සම්බන්ධතාවය පිළිබඳ මනා අවබෝධයක් ලබාදීම මගින් ආයතනයේ දිශාව හා කාර්යසාධනය තීරණය කෙරෙන අතර, අධ්‍යක්ෂ මණ්ඩලය සංස්ථාපිත පාලනයේ වගකීම් දරන්නෝ වෙති.***

1. රාජ්‍ය දැව සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සහ සමස්ථ සේවක ප්‍රජාව රාජකාරි කටයුතුවලදී මෙන්ම අනෙකුත් සෑම අවශ්‍යතාවයකදීම රාජ්‍ය දැව සංස්ථාවේ ප්‍රතිරූපය සහ කීර්තිනාමය ඔසවා තැබීම සඳහා ආයතනික සංස්ථාපිත පාලනයට හැඩ ගැසීම අත්‍යාවශ්‍ය වේ.

## අධ්‍යක්ෂ මණ්ඩලය

- සංස්ථාවේ කළමනාකාරිත්වය හසුරුවීම හා අධීක්ෂණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන භූමිකාව වේ.
- අධ්‍යක්ෂවරු හා නිලධාරීන් රාජ්‍ය දැව සංස්ථාවේ භාරකරුවෝ වෙති. එනම්, ඔවුන් පක්ෂපාතීව හා උපරිම විශ්වාසයකින් සංස්ථාව හා බැඳී සිටින අතර, එහි යහපත වෙනුවෙන් පමණක් කටයුතු කළ යුතුය.
- අධ්‍යක්ෂවරු සහ නිලධාරීන් ඔවුන්ට අදාල නීතිවලට අනුව ඔවුන්ගේ යුතුකම්වලට අනුකූල විය යුතුය.

අධ්‍යක්ෂ මණ්ඩලය සභාපති, ක්‍රියාකාරි අධ්‍යක්ෂ, වන සංරක්ෂණ ජනරාල්, භාණ්ඩාගාර නියෝජිත සහ නීතිඥවරු ඇතළුව සාමාජිකයන් හත් දෙනෙකුගෙන් සමන්විත වේ. ආයතනයට වැදගත් සියලුම ප්‍රධාන තීරණ ගැනීම සඳහා මාසිකව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වයි. අධ්‍යක්ෂවරු ඇල්මැති පාර්ශවයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ වගකීමෙන් යුක්ත වන අතර, සංස්ථාවේ සමස්ත කළමනාකරණය සඳහා ඔවුන් වගකිව යුතුවේ.

## ව්‍යවස්ථාපිත බැඳීම්

1. අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන ලද වාර්ෂික අයවැය, ක්‍රියාකාරී සැලැස්ම සහ මිලදී ගැනීමේ සැලැස්ම වර්ෂාරම්භයට පෙර අමාත්‍යංශයට, භාණ්ඩාගාරයට හා විගණකාධිපතිතුමා වෙත ඉදිරිපත් කළ යුතුය.
2. මූල්‍ය වර්ෂය අවසන් වී දින 60ක් ඇතුලත වාර්ෂික ගිණුම්වල කෙටුම්පත් විගණකාධිපතිතුමා වෙත ඉදිරිපත් කළ යුතුය.
3. මූල්‍ය වර්ෂය අවසන් වී දින 150ක් ඇතුලත භාෂා තුනෙන්ම සමන්විත විගණනය කරන ලද අවසාන ගිණුම් සහ විගණක වාර්තාව පාර්ලිමේන්තවේ සභාගත කළ යුතුය.
4. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සංයුක්ත සැලැස්ම අමාත්‍යංශයට, භාණ්ඩාරයට හා විගණකාධිපතිතුමාට ඉදිරිපත් කළ යුතුය.

## විගණන කමිටුව

මූල්‍ය කළමනාකරණ කුසලතා සපිරි අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක නොවන සාමාජිකයන්ගෙන් සහ භාණ්ඩාගාර නියෝජිතයෙකුගෙන් කමිටුව සමන්විත වේ. වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, සංස්ථාවේ කාර්යසාධනය, වාර්ෂික විගණන සැලැස්ම, අභ්‍යන්තර හා බාහිර විගණන වාර්තා සමාලෝචනය කිරීමේ අරමුණින් මෙම කමිටුව මාස තුනකට වරක්වත් එක්රැස් වේ.

## කළමනාකරණ රැස්වීම

රාජ්‍ය දැව සංස්ථාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් සහභාගී වන කළමනාකරණ රැස්වීම් වලදී නිෂ්පාදන, අලෙවිකරණ, විකුණුම් හා මූල්‍ය කාර්ය සාධනය සමාලෝචනය හා ඇගයීමට ලක්කෙරේ. මීට අමතරව කළමනාකරණ රැස්වීම්වලදී ආයතනයේ මූලික ප්‍රශ්න හා සංරෝධන සාකච්ඡා කරන අතර ඒවාට අවශ්‍ය විසඳුම් පිළිබඳ තීරණ ගනුලැබේ.

## ප්‍රාදේශික කාර්යසාධන කළමනාකරණ රැස්වීම්

මෙම රැස්වීම විශේෂයෙන්ම වනාන්තර වැඩබිම් භාර වැඩබිම් නිලධාරීන්, විකුණුම් භාර ගබඩා නිලධාරීන් සහ අනෙකුත් ප්‍රාදේශික කාර්ය මණ්ඩලය වෙනුවෙන් පවත්වනු ලබයි. ප්‍රාදේශිකයන්ගේ කාර්යසාධනය අගය කිරීම සහ නිෂ්පාදනය මෙන්ම විකුණුම් මත ඉලක්ක ඇති කිරීම මෙම රැස්වීම්වල අරමුණ වේ.

විවිධ දුෂ්කරතා සහ අවස්ථා හඳුනාගැනීමටත්, ප්‍රශ්නවලට අදාළව තීරණගැනීමටත් මෙම රැස්වීම් මඟින් හැකිවේ.

## තාක්ෂණික ඇගයීම් කමිටුව

ටෙන්ඩර් පත්‍රිකා ඇගයීමට සහ නිර්දේශ ඉදිරිපත් කිරීමට රාජ්‍ය ප්‍රසම්පාදන නීතිවලට අනුව මෙම කමිටුව පත්කරනු ලබයි.

## වාර්ෂික වාර්තාව

රාජ්‍ය දැව සංස්ථාව එහි වාර්ෂික වාර්තාව සෑම වර්ෂයකදීම ගිවිසගත් කාලය තුලදී ප්‍රකාශයට පත්කරනු ලබයි. වාර්ෂික වාර්තාව ඇල්මැති පාර්ශවයන්ගේ අවශ්‍යතා සඳහා පිළියෙල කරනු ලබන අතර, සංස්ථාවේ මූල්‍ය කළමනාකරණ පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා ස්ථාපිත යහපාලනය සඳහා වූ මාර්ගෝපදේශ සමඟ අනුකූල විය යුතුය.

## ඇල්මැති පාර්ශවයන් සමඟ පවතින සම්බන්ධතාව.

ප්‍රධාන ඇල්මැති පාර්ශවයන් සමඟ හිතකර සම්බන්ධතාවයක් පවත්වාගෙන යාමේ වැදගත්කම අධ්‍යක්ෂ මණ්ඩලය වටහාගෙන ඇත. අභ්‍යන්තර සන්නිවේදනය මූලිකවම විද්‍යුත් තැපෑල, සන්නස් පත්‍ර, චක්‍ර ලේඛන සහ දැන්වීම් හරහා සිදුවේ. එසේම සංස්ථාවේ ප්‍රතිපත්ති සහ භාවිතයන්, සංස්ථාවේ වටිනාකම් හා සමාජ වගකීම් සමඟ අනුකූල වන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික වේ. සංස්ථාව එහි අභ්‍යන්තර හා බාහිර පරිසරය ආරක්ෂා කිරීමට අනුබල දෙයි.

## ව්‍යවස්ථාපිත හා නෛතික අවශ්‍යතාවලට අනුකූලවීම.

47 වසරක් පුරා ජාතියේ විශ්වාසනීයත්වය දිනූ අනර්ඝතම දැව හා දැවමය භාණ්ඩ සැපයීමේ පුරෝගාමී නායකයා ලෙස රාජ්‍ය දැව සංස්ථාව අද්විතීය ස්ථානයක් හිමිකරගෙන ඇත. රාජ්‍ය දැව සංස්ථාව 1968 වර්ෂයේදී ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ගරු අමාත්‍යතුමන් විසින් 1957 අංක 49 දරන රජයේ කාර්මික සංස්ථා පනතේ බලතල ප්‍රකාරව පිහිටුවන ලද අතර, 1982 පෙබරවාරි 05 දිනැති අංක:178/10, 5.2 නමැති විශේෂ ගැසට් නිවේදනය සහ 2009 වර්ෂයේ ජුනි 26 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍ර අංක:11907 ට අනුව තවදුරටත් සංශෝධනය කොට යාවත්කාලීන කරන ලදී.



## වාර්ෂික වාර්තාවේ අන්තර්ගතය





රාජ්‍ය දැව සංස්ථාව ජාතික ආර්ථිකයට ඇති දායකත්වය පිළිබඳව සන්තෘප්ත විය හැකිය. රජය ස්වභාවික සම්පත් ආරක්‍ෂා කිරීමේ හා සංරක්‍ෂණය කිරීමේ අරමුණින් නියම කරන ලද ප්‍රදේශවල අනවසර ගස් හෙළීම වලක්වාලීම සඳහා කටයුතු කිරීම සංස්ථාවට ඇති විශාලම අභියෝගය වේ. මෙය සංස්ථාවේ ව්‍යාපාර කටයුතු සඳහා දැඩි බලපෑමක් ඇති කරයි.

වගකීමෙන් යුතු ආයතනික පුරවැසියෙකු ලෙස රාජ්‍ය දැව සංස්ථාව පසුකාලීන සංශෝධනයන් ඔස්සේ රජයේ පනත් සහ නියෝගවලට අනුකූල වෙමින් එහි කටයුතු සාර්ථකව පවත්වාගෙන යයි.

- 1966 අංක 13 දරන වන ආඥා පනත
- 1971 අංක 38 දරන මූල්‍ය පනත
- 1954 අංක 15 දරන සාප්පු හා කාර්යාල සේවක පනත
- 1958 අංක 15 දරන සේවක භාරකාර අරමුදල
- 1980 අංක 46 දරන සේවක අර්ථසාධක අරමුදල
- 2006 අංක 10 දරන ආදායම් බදු පනත
- 2002 අංක 14 දරන එකතුකළ අගය මත බදු පනත
- 2009 අංක 09 දරන ජාතික ගොඩනැගීමේ බදු පනත

රාජ්‍ය අණ පනත් හා නියෝග වලට අමතරව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ඃබපසීඃ සහ බණී* ශ්‍රී ලංකා විගණන ප්‍රමිත රාජ්‍ය දැව සංස්ථාවේ ගිණුම්කරණ හා විගණන කාර්යයන් සඳහා අදාල වේ.

සංස්ථාව ඉලක්ක ලඟාකරගත් ප්‍රමාණය සහ සමාජ වගකීම් සපුරාලීමේ ප්‍රමාණය නිශ්චය කරගැනීම සඳහා වාර්ෂික ගිණුම් හා කාර්යසාධනය සමාලෝචනය කිරීමේ බලය පැවරී ඇත්තේ රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කමිටුවටයි.

අප සංස්ථාවේ ප්‍රධාන අමුද්‍රව්‍ය නම් ඉතා වටිනා ස්වභාවික සම්පතක් වන ශාක වේ. එසේම අප සමස්ත මෙහෙයුම් ක්‍රියාවලිය සෘජු හා වක්‍රාකාරයෙන් පරිසරය සමඟ සම්බන්ධවේ. මෙවැනි අවස්ථාවන් යටතේ නීතිමය රාමුවට අනුකූලවීම අත්‍යවශ්‍ය වේ. අප සංස්ථාව මේ වනවිටත් මධ්‍යම පරිසර අධිකාරිය මඟින් පනවන නීති හා රෙගුලාසිවලට අනුකූල වී ඇත. දිවයින පුරා විහිදී ඇති අප මෙහෙයුම් ජාලය ඉරුම්හල්, පරිරක්‍ෂණ යන්ත්‍ර, බොයිලේරු, පෝරණු සහ ගෘහභාණ්ඩ නිෂ්පාදනාගාර වලින් සමන්විත වේ. නිෂ්පාදනාගාර වලින් ඉවත් කෙරෙන පරිසරයට අහිතකර ලෙස බලපාන බාහිරතා පහත හෙළීම සඳහා සංස්ථාව විසින් පාලන පද්ධතියක් භාවිතා කරයි. මේ සඳහා මධ්‍යම පරිසර අධිකාරිය අප මෙහෙයුම් කටයුතු පරිසර හිතකාමී අයුරින් පවත්වාගෙන යාම සඳහා විවිධ අංශයන් යටතේ නීති හා උපක්‍රම පනවා ඇත.
මේ අනුව සංස්ථාව ශබ්ද දූෂණය, ජල දූෂණය, වාත දූෂණය, කැළිකසල සහ අනෙකුත් පරිසරය දූෂණය වන ක්‍රියාවන් සඳහා පරිසර දූෂණ අවම කිරීමේ ක්‍රමවේදයන් අනුගමනය කරයි.

ගෘහභාණ්ඩ නිෂ්පාදනාගාරයන්ගෙන් හා ඉරුම්හල් වලින් සමන්විත රාජ්‍ය දැව සංස්ථාවේ සේවා ඒකක සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් වාර්ෂිකව පරිසර සංරක්‍ෂණ බලපත්‍රය නිකුත් කරනු ලැබේ. මේ අනුව සංස්ථාවේ සියලුම කර්මාන්තශාලා මෙම කොන්දේසීන්ට හැකිතරම් අනුකූලවීමට උනන්දුවක් දක්වයි.

වංචා හා දූෂණ සිදුවීමේ හැකියාව අඩුකිරීම සඳහා සංස්ථාව විවිධ පාර්ශවයන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරයි. මේ අනුව වැඩ තහනම් කිරීම්, දිනක වැටුප කපාහැරීම්, වාර්ෂික පඩි වැඩිවීම් අත්හිටුවීම් සහ උසස්වීම් අඩුකිරීම, වැටුප් අත්හිටුවීම සහ අලාභ අයකරගැනීම වැනි දඬුවම් වලට සේවකයන් භාජනය වේ.

මෙම දඬුවම් සේවකයන් සිදුකරන ලද වංචා, දූෂණවල ස්වභාවය අනුව වෙනස්වේ.

යම් සේවකයෙකු කිසියම් හිරිහැරයකින් හෝ වෙනස්කමකින් පීඩා ලබයි නම් ඔවුන්ගේ ප්‍රධානියාට ඒ බව දැනුම් දීමට සේවකයාට අවස්ථාවක් ඇත. එවැනි අවස්ථා සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට සංස්ථාවේ ප්‍රධානීන් හා ඉහළ කළමනාකාරීත්වය සක්‍රියව කටයුතු කරයි.

මේ ආකාරයට ගන්නා සෑම උපක්‍රමයකින්ම සංස්ථාවේ උන්නතිය වෙනුවෙන් යහපත්ව පාලනයන් පවත්වාගෙන යනු ලබයි. එය සංස්ථාවේ සේවකයන්ට ඇල්මැති පාර්ශවයන්ට මෙන්ම රටට ද සුභදායීවේ.

අවසාන වශයෙන් සංස්ථාපිත පාලනය තුළින් පළාත් ආයතන, රාජ්‍ය සහ සංගෘහිත විධිවිධාන හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කරමින් ආයතනයේ කීර්තිනාමය වර්ධනය කෙරෙන අතරම සේවක සේව්‍ය දෙපාර්ශවයේ අනිසි හැසිරීම හේතුවෙන් උද්ගතවන අර්බුදකාරී මෙන්ම වංචාසහගත ක්‍රියාවන් අවම කිරීම තුළින් සාර්ථකත්වයක් අත්පත්කරගැනීමට හැකිවේ.



# තිරසාර අනාගතයක් වෙනුවෙන්

*අනාගත පරපුරට සිය අපේක්ෂාවන් ඉටුකර ගැනීමට පවතින විභවතාව පවත්වා ගෙන යන අතරම, වත්මන් පරපුරට ඉහලම තිරසාර ප්‍රතිලාභ ලැබෙන අන්දමට මිනිසා විසින් ජෛව ගෝලය පරිහරණය කිරීම කළමනාකරණය තිරසාර සංවර්ධනය වේ.*

# තිරසාර අනාගතයක් වෙනුවෙන්...




තිරසාර සංවර්ධනය යනු ගෝලීය වශයෙන් සාකච්ඡාවට ලක්වන මාතෘකාවකි. තිරසාර සංවර්ධන ඉලක්ක ජය ගැනීම සඳහා යන ගමනේදී ස්වභාවික සම්පත් කළමනාකරණය ඉතා වැදගත් අරමුණක් ලෙස සඳහන් කල හැකි. ශ්‍රී ලංකාව වැනි ස්වභාවික සම්පත්වලින් පොහොසත් රටක් තුළ විශේෂයෙන් වනාන්තර කළමනාකරණය හරහා සමතුලිත පාරිසරික පද්ධතියක් නිර්මාණය කිරීමෙහිලා වැදගත් තැනක් ගනී.

වනාන්තර කළමනාකරණය මූලික වශයෙන් ප්‍රධාන අරමුණු දෙකක් මුදුන් පමුණුවා ගැනීම සඳහා වැදගත් වේ. වර්තමානයේ වනසම්පත උපයෝගී කරගන්නා අතරම අනාගත පරපුර සඳහා ද එය රැකගැනීම වනාන්තර කළමනාකරණයේ ප්‍රමුඛ අරමුණකි.

දැව සංස්ථාව වනාහි මෙම දැව සම්පත් පරිසරයට හානි නොවන ආකාරයටත් පවත්නා සම්පත් වලින් උපරිම පල නෙලාගනිමින් මිනිසාගේ අවශ්‍යතාවට ගැලපෙන අයුරින් භාණ්ඩ නිර්මාණය කිරීම, නව වනවගා ඇති කිරීම හා මාර්ගෝපදේශන මගින් වන සම්පත ආරක්ෂා කිරීම තුළින් කුටුම්බ වල වර්තමාන හා අනාගත ජීවන තත්වය සරුසාර කිරීම මගින් ආයතනයේ තිරසාර සංවර්ධනයේ මංපෙත් විවර කරගැනීම මූලික අරමුණු අතර වේ.








පුළුල් නිෂ්පාදන ක්‍රියාවලියන් තුලින් විශාල පිරිසකට පරිසරයේ දායාද ගලා යන ආකාරයට කටයුතු කරමින් බිහිකරන්නා වූ ශුද්ධ හර වටිනාකම් නිතැතින් ම ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධනයට දායක කරලීම.

↓

දැව සංස්ථාවේ මාර්ගෝපදේශන මූලධර්ම යටතේ සියලුම නිෂ්පාදන මෙහෙයවීම් සහ දැව කඳන්, ඉරූ දැව සහ අතුරු ප්‍රතිඵල හා අප ද්‍රව්‍ය බැහැර කිරීම පරිසර හිතකාමී ආකාරයට සිදු කිරීම.

↓

ආයතනයේ මධ්‍ය හා දිගු කාලීන සැලසුම් අත්පත් කර ගැනීමට විවිධ පාරිභෝගික කණ්ඩායම් තෘප්තිමත් කෙරෙන අයුරින් දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන සදහා ප්‍රමිත සකස් කිරීම

↓

ගුණාත්මකභාවයෙන් යුතු දැව සාධාරණ මිලකට අලෙවි කිරීමෙන් ලබාගන්නා ආදායම් සේවකයන්ගේ සහ ඔවුන්ගේ කුටුම්බයන්ගේ ජීවන තත්වය උසස් කිරීමට දායක කර ගැනීම.

↓

පෞද්ගලික ඉඩම් හිමියන්ගෙන් දැව සාධාරණ මිලකට මිලදී ගැනීම්, දැව වලින් අතුරු නිෂ්පාදන බිහි කිරීම හා පරිසර හිතකාමී මානවයන් බිහිකිරීම සදහා මාර්ගෝපදේශණයන් සැපයීම මෙන්ම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමෙන් සමාජ වගකීම ඉටුකිරීමට දායක වේ.

## පාරිභෝගිකයා

"පාරිභෝගිකයා ව්‍යාපාරයට රජෙකු මෙනි." එබැවින් පාරිභෝගිකයා තෘප්තිමත් කිරීම තුලින් ලබාගන්නා දායාද තිරසාර සංවර්ධනයට හිතකර වූ අස්වැන්නක් නෙලා ගැනීමක් බඳුය. මෙම තේමාව ඔස්සේ අප සංස්ථාව පරිසර හිතකාමි දැව අස්වනු නෙලීම තුළින් රටේ මුළු මහත් ජනතාවගේ ජීවිත නගා සිටුවමින්, වර්තමාන බුද්ධිමත් පාරිභෝගිකයන්ගේ විවිධාකාර වුවමනාවන්ට ගැලපෙන නවීන, සුරක්ෂිත හා ඉහළ ගුණාත්වයෙන් යුතු භාණ්ඩ හා සේවා සපයනු ඇත.

පාරිභෝගික තෘප්තිය යනු ආයතනයක් විසින් සපයන භාණ්ඩ හා සේවාවන් පරිභෝජනය කිරීම තුලින් පාරිභෝගිකයා තුල ඇති වන කැමැත්ත වේ. ගුණාත්මක මෙහෙයුම් ක්‍රියාකාරකම් හේතුවෙන් විශාල පාරිභෝගිකයන් පිරිසක් දැව සංස්ථාවේ පාරිභෝගික කණ්ඩායමට දිනපතා එකතු වෙමින් පවති. තෘප්තිමත් වූ පාරිභෝගිකයන් ආයතනයට සම්පතකි. එබැවින් ඔවුන් තව තවත් තෘප්තිමත් කිරීම ආයතනයේ අනාගත පැවැත්ම තහවුරු කරනු ලැබේ. මෙය මැනවින් හඳුනාගත් අප ආයතනය පාරිභෝගිකයන් කේන්ද්‍ර කර ගත් වැඩසටහන් විශාල ප්‍රමාණයෙන් සිදුකරන අතර, මේ තුළින් පාරිභෝගික පක්ෂපාතීත්වය හඳුනාගැනීමට හැකිවේ. සංස්ථාවේ සමස්ත පාරිභෝගිකයන් ගත්කල විවිධ අංශ යටතේ වර්ගීකරණය කළ හැක. රාජ්‍ය අංශය නියෝජනය කරමින් රජයේ

දෙපාර්තමේන්තු මෙන්ම අර්ධ රාජ්‍ය ආයතන මෙන්ම රජයේ සේවකයින්ද, පෞද්ගලික අංශය නියෝජනය කරමින් පෞද්ගලික සමාගම් මෙන්ම බොහෝ පෞද්ගලිකව ඇණවුම් ලබාදෙන පිරිස් මේ අතර වේ.

රාජ්‍ය ආයතනයක් වශයෙන් රාජ්‍ය දැව සංස්ථාව සියලුම පාරිභෝගිකයන්ගේ උවමනා සහ අදහස් හඳුනා ගනිමින් පාරිභෝගිකයා මූලික කොට ගත් අප සංස්ථාවට ආවේනික වූ අගනාකම් තුළින් ආචාර ධර්ම ආරක්ෂා වන ආකාරයට ව්‍යාපාරික ක්‍රියාකාරකම් සිදු කිරීමේ පරිසරයක් නිර්මාණය කිරීමට පියවර ගෙන ඇත.

## පාරිභෝගික තෘප්තිය හා තහවුරු කරගැනීම




## සේවකයන්

සේවකයා තෘප්තිමත් කිරීමේ අරමුණින්, ''සේවකයා සතුටු කිරීම නොහොත් සේවක ප්‍රසාදය දිනාගැනීම'' යන ප්‍රතිපත්තිය ප්‍රධානකොට ගෙන අප, ආයතනයේ සියලුම සේවකයන් අභ්‍යන්තර පාරිභෝගිකයෙකු ලෙස දකිමින් ආයතනයේ සියලු කටයුතු සකස්කොට ඇත. තෘප්තිමත් වූ පාරිභෝගිකයා යනු සෑම විටම තමා අපේක්ෂිත මට්ටමට වඩා යමක් ලබාගෙන තෘප්තිමත් වන්නෙකි, එසේනම් සේවකයන්ට ද එලෙස ඔවුන් බලාපොරොත්තු වන දෙයට වඩා වැඩියෙන් ලබාදී තෘප්තිමත් කල යුතුය යන තේමාව අප ආයතනය දිගු කාලීන අරමුණු මුදුන් පමුණුවා ගැනීම අරමුණු කොට පවතී.

අප ආයතනයේ සේවකයන්ට අවශ්‍ය කුමක්ද යන්න නශ්චිතව හඳුනාගැනීමට නොහැකි වුවත් අනුමාන කිරීමෙන් පසුව අවශ්‍යතාවයන් කලට වේලාවට සපුරා දීමට කටයුතු කිරීම තුළින් බිහිවන්නා වූ ප්‍රීතිමත් සේවකයන් සැමවිටම සංස්ථාවේ ඉලක්ක, පරමාර්ථ ළඟා කර ගැනීමට අනගි සහයක් ලබා දේ. මෙසේ තෘප්තිමත් සේවකයන් අප ආයතනයේ පක්ෂපාතී පාරිභෝගිකයන් දිගු කාලයක් පුරාවට රඳවාගැනීමට නිරන්තරයෙන් කටයුතු කරනු ඇත.

අප ආයතනයේ ඉතා හොඳ මාර්ගෝපදේශන සංග්‍රහයක් මගින් ආයතනය තුළ සෑම විටම හර වටිනාකම් බිහි කරන තෘප්තිමත් සේවක මඩුල්ල අපටම ආවේනික වූ සංස්කෘතියක් තුළ වැඩි දියුණු වූ ආකල්ප සහිත සාමූහිකව වැඩ කිරීමට හැකි අන්‍යයන්ට ගරු කිරීම තුළින් ලබාගන්නා යහපත් සේවක සබඳතා තුළින් ආයතනයේ දිගු කාලීන උන්නතිය උදෙසා සාමූහිකව වැඩ කටයුතු කිරීමට ඇල්මක් දැක්වීමට හැඩගැසුණු කාර්ය මණ්ඩලය අප ආයතනයේ කොදු නාරටිය බඳුය. අප සංස්ථාව වැටුප් හා වේතන වලට අමතරව විවිධ පහසුකම් රාශියක් සපයයි.






රාජ්‍ය දැව සංස්ථාවේ සේවක සංවර්ධනය වෙනුවෙන් 2015 වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලද පුහුණු හා සංවර්ධන වැඩසටහන්

**දැව තාක්ෂණ ආයතනය මගින් ලබාදෙන ලද පුහුණු අවස්ථා පහතින් දැක්වේ.**

| පුහුණු වැඩසටහන | සහභාගී වූ සේවකයින් |
|---|---|
| දැව ශ්‍රේණි කිරීමේ වැඩමුළු (දින 03) | 70 |
| ගබඩා නිලධාරීන් සඳහා මාස 2ක වැඩමුළුව | 23 |
| ගෘහභාණ්ඩ නිෂ්පාදනය පිළිබඳ වැඩමුළුව | 12 |
| දැව පදම් කිරීම (දින 03) | 14 |

**අනෙකුත් පිළිගත් ආයතන හරහා ක්‍රියාත්මක කරන ලද සේවක පුහුණු වැඩසටහන්**

| පුහුණු වැඩසටහන | සහභාගී වූ සේවකයින් |
|---|---|
| Wheel Loader පුහුණුව | 06 |
| Excavator පුහුණුව | 05 |
| ඩෝසර් පුහුණුව | 02 |
| Fork Lift පුහුණුව | 03 |
| ෆර්නස් තෙල් පිළිබඳ වැඩමුළුව | 06 |
| තොග පාලනය | 52 |
| දෙමල භාෂාව | 15 |
| Micrsoft Excel | 08 |
| දැව උපයෝජනය | 15 |

මනාව පුහුණුව සහ ආකල්ප වර්ධනය තුළින් මානව සම්පත් උපයෝජනය ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒමත්, එමගින් ආයතනයේ ඉලක්ක මෙන්ම සේවකයින්ට තම පෞද්ගලික ඉලක්ක ඉටුකරගැනීමට අවස්ථාව සැලසේ.

## පරිසරය හා ප්‍රජාව

ඔබ අප සියල්ලන්ගේම සොඳුරු නවාතැන්පොළ වූ මේ සොඳුරු පරිසරයෙන් අප ලබාගන්නා දෑ බොහොමයකි. උපන් මොහොතේ පටන් අවසන් හුස්ම පොද වාතලයට එක් කරන මරණයේ අඳුරු හෝරාව දක්වාම වැටෙන සෑම සුසුම් පොදකින්ම අපි සෑම ජීවය නම් වූ අපූර්වතම යදම් වැලෙන් පරිසරයට බැඳී සිටින්නෙමු. ඒ සොඳුරු මිහිමඩලේ චිරස්ථිතිය උදෙසා අප සංස්ථාව පරිසරයට වන බලපෑම අඩු කිරීම දේශගුණික වෙනස්වීම් වලට අනුගත වෙමින් පරිසර හිතකාමී තිරසාර සංවර්ධනයක් රාජ්‍ය දැව සංස්ථාව හැමවිටම අපේක්ෂා කරයි.

වර්ථමාන ශ්‍රී ලංකාව තුල පවත්නා නීතිරීති වලට අනුගත වෙමින් රටේ සංස්කෘතිය,

සාරධර්ම, සිරිත්විරිත්, ඉතිහාසය හා ආචාරධර්ම වලට අනුකූලව ව්‍යාපාරික වටිනාකම් බිහිකරමින් පරිසර හිතකාමී ක්‍රියාකාරකම් තුළින් ප්‍රජාව ශක්තිමත් කිරීම අප ආයතනයේ අපේක්ෂාව වේ. ප්‍රජාව ශක්තිමත් කිරීමට හැකි ක්‍රියාකාරකම් නිරන්තරයෙන් හඳුනාගෙන ඒවා සමාජයේ උන්නතිය උදෙසා ඉවහල් වන ආකාරයට කටයුතු කිරීමට හැකි පුහුණු නිලධාරී මණ්ඩලයකින් සමන්විත ආයතනයකි.  තිරසාර සංවර්ධනයක් සඳහා අවශ්‍යතා ඉටුකරන ප්‍රජාව නිරතුරුවම ශක්තිමත් කරන දිගු ඉතිහාසයක් ඇති අප ආයතනය සක්‍රියව ක්‍රියාත්මක වේ.




මිනිස් අවශ්‍යතා සඳහා දැව අවශ්‍යය. එබැවින් තිරසාර දැව අස්වනු නෙලීම වනවිනාශයට හේතු නොවන අයුරින් මිනිස් අවශ්‍යතා සම්පූර්ණ කිරීමට අවශ්‍ය දැව ලබාගැනීමට දැව වනවගා කළමනාකරණ සංකල්පය හඳුන්වා දෙමින් දැවමය වටිනාකමක් ඇති ශාක විශේෂ මේ සඳහා යොදා ගනිමින් පරිහානියට පත්ව ඇති වනාන්තර, හිස් භූමි ප්‍රදේශ, මුඩු ඉඩම් දැව වනවගා සඳහා යොදාගෙන ඉතා ක්‍රමවත්ව හා විද්‍යානුකූල පර්යේෂණ සිදුකරමින් හා වයස්ගත ශාක වෙනුවට නව ශාක රෝපණය කිරීමට කටයුතු කිරීමෙන් පරිසරයට හා ශාක ප්‍රජාවට දිගු කාලීන ප්‍රතිලාභ සලසාගත හැකි වන අයුරින් වැඩසටහන් ක්‍රියාත්මක කරයි.

අප සියල්ලන්ගේම සොඳුරු නවාතැන්පොළ වූ සොඳුරු පරිසරයෙන් අප ලබාගන්නා දෑ බොහොමයකි. උපන් මොහොතේ පටන් අවසන් හුස්ම පොද වා තලයට එක් කරන මරණයේ අඳුරු හෝරාව දක්වා ම වැටෙන සෑම සුසුම් පොදකින් ම අප සැම ජීවය නම් වූ අපූර්වතම යදම් වැලෙන් පරිසරයට අප බැඳී සිටින්නෙමු. සොඳුරු මිහිමඩලේ චිරස්ථිතිය උදෙසා අප සංස්ථාව පරිසරයට වන බලපෑම අඩුකිරීම දේශගුණික වෙනස්වීම් වලට අනුගත වෙමින් පරිසර හිතකාමී සංවර්ධනයක් රාජ්‍ය දැව සංස්ථාව අපේක්ෂා කරයි.

**මානව අයිතීන්, පරිසර ආරක්ෂාව, සේවක අයිතීන් හා ප්‍රජාසේවා යන වගකීම් ඉටුකිරීමට කටයුතු කර ඇත.**

**වඩා හොඳ සමාජයක් බිහිකිරීමට 2015 වර්ෂය තුළ සංස්ථාව සිදුකරන ලද වැඩසටහන් පිළිබඳ සාරාංශයක්  පහතින් වේ.**

**රුක් රෝපණ වැඩසටහන් සහ ඊට සමගාමීව සිදුකරන ලද විවිධ වැඩසටහන්**

- 2015 වර්ෂයේ ලෝක පරිසර දිනයට සමගාමීව වැඩසටහන් ගණනාවක් පවත්වන ලදී.

  "තුරු ජන සිසු බැංකු" රුක් රෝපණ වැඩසටහන අඛණ්ඩව මෙම වර්ෂයේදීත් තෝරාගත් පාසල් අතර, ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන හරහා වනවගාව මෙන්ම දැව කුලය පිළිබඳවත්, එම ශාක පරිණතභාවයට ළඟා වූ විට නිවැරදිව උපයෝජනය කරගැනීම පිළිබඳවත් දේශන පවත්වන ලද අතර, පාසල් සිසුන්ගේ ඇල්ම ඉහළ නැංවීමත් මහෝපකාරී වේ.

  තවද, බණ්ඩාරවෙල, බදුල්ල, වැලිමඩ සහ පස්සර යන අධ්‍යාපන කලාප කේන්ද්‍ර කොට ගෙන බීජ පැළ 5,552 ක් පාසල් අතර බෙදාදුන් අතර, බීජ පැළ 350ක් බණ්ඩාරවෙල කහගොල්ල ආරණ්‍ය සේනාසනයට ලබාදෙන ලදී.

  දැව පරිරක්ෂණ පිළිබඳ ප්‍රදර්ශණයක් පොලොන්නරුව මැදිරිගිරිය මධ්‍ය මහා විද්‍යාලයේ පවත්වන්නට යෙදුනි.
- පොලොන්නරුව දිස්ත්‍රික්කයේ සෙවනපිටිය ප්‍රදේශයේ හෙක්ටයාර් 20 ක තේක්ක වගාවක් ස්ථාපිත කරන ලද අතර, පුලියන්කුලම සහ මැදවච්චිය රාජ්‍ය දැව සංස්ථාවට අයත් භූමියේ වගා කරන ලද තේක්ක වගාවේ පුරප්පාඩු පිරවීම සඳහා තේක්ක පැළ 1,000 ක් නැවත රෝපණය කරන ලදී.

- පරිසරය, දැව පරිරක්ෂණය සහ ජෛව විවිධත්වය පිළිබඳව පාසල් සිසුන්, ආයතන සහ මහජනතාව දැනුවත් කරමින් දේශනා සංවිධානය කරන ලදී.

- දැව සහ පරිසරය පිළිබඳ විවිධ තොරතුරු ඇතුළත් අත් පත්‍රිකා සහ පොත්පත්, පාසල් සිසුන් සහ මහජනතාව අතර බෙදාදෙන ලදී.

- වටිනාකමින් වැඩි කළුවර වැනි ශාක වගා කිරීම දිරිමත් කිරීමේ අරමුණින් පාසල් සිසුන් සහ ගෙවතු සඳහා එම පැළ බෙදාහැරීම.

- "වන රෝපා" රුක් රෝපණ වැඩසටහන සඳහා ක්‍රියාශීලී දායකත්වයක් ලබාදීම.

- මහජනයාට සහ විවිධ ආයතන අතර බෙදාදීම සඳහා බීජ පැළ 88,000 ක් විවිධ රුක් රෝපණ වැඩසටහන් සඳහා බෙදා දෙන ලදී.



කැලිකසල බැහැර කිරීම කළමනාකරණය සංස්ථාවේ කළමනාකාරිත්වය විසින් ගනු ලැබූ තීරණයකට අනුව බොහෝ කාලයක පටන් කැලිකසල, කඩදාසි, පොලිතින් සහ කාබනික අපද්‍රව්‍ය ලෙස වර්ගීකරණය කිරීමෙන් වෙන්වෙන් වශයෙන් එක්රැස් කොට ක්‍රමානුකූලව බැහැර කරනු ලබයි.

**දැව හඳුනාගැනීමේ හා සහතික කිරීමේ සේවය**

රාජ්‍ය දැව සංස්ථාවේ පර්යේෂණ අංශය වෙත දැවවල ගුණත්වය හා දැව දේපළ මත සහතික නිකුත් කිරීමේ අධිකාරි බලය 2008 පෙබරවාරි 25 වැනි දින අංක:1538/7 දරන විශේෂ ගැසට් පත්‍රය මඟින් පවරන ලදී.  නියත බර, තෙතමනය, අන්තර්ගතය, හැකිලීම හා බෝරෝන් ප්‍රතිකාරය සඳහා දැවවල තත්වය පරීක්ෂා කිරීමට එම අංශයේ පහසුකම් ඇත.

**දැව තාක්ෂණ පුහුණු ආයතනය මඟින් සපයන සේවා**

රාජ්‍ය දැව සංස්ථාව ඉතා වැදගත් සන්ධිස්ථානයකට මුහුණපාමින් 2006 දී රත්මලාන කල්දෙමුල්ල දැව තාක්ෂණ පුහුණු ආයතනය පිහිටුවීමට පියවර ගන්නා ලදී.  වන හා දැව තාක්ෂණය භාවිතා කරන්නන්ගේ කාර්යයන් ශක්තිමත් කිරීම තුලින් ඔවුන්ගේ ධාරිතාවය ඉහළ නැංවීමටත්, දැනුම යාවත්කාලීන කර ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධන අරමුණු ඉටුකරගැනීමටත් දැව තාක්ෂණ පුහුණු ආයතනය පිහිටුවා ඇත.




# අවදානම් කළමනාකරණය

*රාජ්‍ය දැව සංස්ථාව සිය මෙහෙයුම්, නිෂ්පාදනය, නිර්මාණය, බෙදාහැරීම සහ මූල්‍ය යන අංශවල කටයුතු කිරීමේදී ආර්ථික හා දේශපාලන පරිසරය තුල ඇති විය හැකි විචල්‍යයන් හඳුනාගැනීම, විශ්ලේෂණය, අධීක්ෂණය හා සමාලෝචනය, අවදානම් ප්‍රතිකාර මගින් ආයතනයට සිදුවන බලපෑම අවමකිරීම හෝ ඉවත් කිරීම අවදානම් කළමනාකරණය වේ.*

# අවදානම් කළමනාකරණය

රාජ්‍ය දැව සංස්ථාව සිය මෙහෙයුම්, නිෂ්පාදනය, නිර්මාණය, බෙදාහැරීම සහ මූල්‍ය යන අංශවල කටයුතු කිරීමේදී ආර්ථික හා දේශපාලන පරිසරය තුල ඇති විය හැකි විචල්‍යයන් හඳුනාගැනීම, විශ්ලේෂණය, අධීක්ෂණය හා සමාලෝචනය, අවදානම් ප්‍රතිකාර මගින් ආයතනයට සිදුවන බලපෑම අවමකිරීම හෝ ඉවත් කිරීම අවදානම් කළමනාකරණය වේ. කාර්යක්ෂම මූල්‍ය, මෙහෙයුම් හා වෙනත් පාලනය කරන ලද පද්ධති, අවදානම් කළමනාකරණය සදහා සංස්ථාව යොදාගෙන ඇත.

ආර්ථික සහ ව්‍යාපාර සාධකවල අඛණ්ඩව සිදුවන වෙනස්වීම් සමග පාරිභෝගික රුචිකත්වයේ සිදුවන වෙනස්වීම් මගින් බොහෝ අවදානම් හා ව්‍යාපාර අවස්ථා පැනනැඟීම නිසා අවදානම් හදුනාගැනීම, ඇගයීම සහ ප්‍රමුඛස්ථානයේ අනුපිළිවෙල අනුව සැකසීම හා අවශ්‍ය අවදානම් ප්‍රතිකාර ගැනීම ව්‍යාපාර මෙහෙයුම් සැලසුම්කරණයේ මූලික අංගයක් වන අතර, තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී අවදානම් පිළිබඳ සැලකිලිමත්වීම ඉතා වැදගත් වේ.

01 අවදානම් හඳුනාගැනීම

02 අවදානම් විශ්ලේෂණය

03 අධීක්ෂණය හා සමාලෝචනය

04 අවදානම් ප්‍රතිකාර

අවදානම් හඳුනැගැනීම හා කළමනාකරණය යන ක්‍රියාවලීන් වල අවසාන වගකීම අධ්‍යක්ෂක මණ්ඩලය සතු වන අතර, අවදානම් අධීක්ෂණය සහ අවදානම් කළමනාකරණ ක්‍රියාවලියෙහි අනුකූලතාවය පරීක්ෂා කිරීම විගණන කමිටුව වෙත පවරා ඇත. අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති යාවත්කාලීන කිරීම හා නොකඩවා නිරීක්ෂණය ආර්ථික හා වෙළඳපොල තත්වයන්ගේ වෙනස්වීම් විදහා දක්වනු ලැබේ. රාජ්‍ය දැව සංස්ථාවෙහි භාවිතා වන අවාදනම් කළමනාකරණ ප්‍රතිපත්තිය මගින් සංස්ථාවට පවතින අවදානම් හඳුනාගැනීම, අධීක්ෂණය හා අවම කිරීම සඳහා යොදාගන්නා ක්‍රියාදාමයන් හා මාර්ගෝපදේශයන් මනාව පැහැදිලි වේ.

අවදානම් කළමනාකරණ ක්‍රියාවලියේදී එක් එක් සේවකයා සතු වගකීම, පුහුණුව හා දැනුවත් කිරීම මගින් අවදානම් සංස්කෘතියක් ඇති කිරීම කරනු ලැබේ. සංස්ථාවට මුහුණදීමට සිදුවන අවදානම් හා කළමනාකරණය කිරීමේ ක්‍රියාදාමයන් පහත සඳහන් පරිදි වේ.









## මූල්‍ය අවදානම් කළමනාකරණය

### 1. ණය අවදානම

ණයගැතියන් මගින් සිදුවන මඟහැරීම් තුළින් ඇතිවන අවදානම් පාලනය කිරීම සඳහා සංස්ථාව මගින් අවදානම් වලක්වා ගැනීමේ උපාය මාර්ගය යොදාගනු ලබයි. ඒ සදහා පහත සදහන් ප්‍රතිකාර යොදාගනු ලැබේ.

- අඩමාන ණය වෙන්කිරීම හා විමර්ශනය සඳහා සංස්ථාව විසින් විධිමත් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරනු ලබයි.
- මාසිකව ණයගැතියන් පිළිබඳ විශ්ලේෂණයක් සිදුකරනු ලබන අතර, වාර්ෂිකව සිදුවිය හැකි අවදානම් හඳුනාගෙන වෙන්කිරීම් කරනු ලබයි.
- ණයපත් වැනි ක්‍රම මගින් ගණුදෙනු වල මුදල් ලැබීම් සුරක්ෂිත බව තහවුරු කර ගැනීම.
- බොහෝ විට මුදල් මත පමණක් විකුණුම් සිදුකිරීමට වගබලාගන්නා අතර, ණයට විකුණුම් සිදුකරනුයේ සංස්ථාවේ ණයට විකුණුම් ප්‍රතිපත්ති වලට අනුකූල වන පරිදිය.
- සියලු ලැබිය යුතු හා ගෙවිය යුතු ණයගැති හා ණයහිමි ගිණුම් පිළිබඳ නිරන්තර අවධානය යොමු කර ඇත.
- තනි පුද්ගලයන් සදහා බොහෝවිට ණයට විකුණුම් කරනු නොලබන අතර නව අලෙවිකරණ උපක්‍රමයක් ලෙස රාජ්‍ය සේවකයන් සදහා පමණක් සහනදායී පොලී අනුපාතයන්ට "ප්‍රසාද අභිමාණී" ක්‍රමය යටතේ භාණ්ඩ විකුණනු ලබයි.
- රාජ්‍ය ආයතන සදහා පමණක් ණයට විකුණුම් සිදුකරයි. බොහෝ විට මහා භාණ්ඩාගාර භුවමාරුව යටතේ ගිණුම් පියවීම සිදුකරනු ලබයි.
- නිරතුරු අධීක්ෂණය කරමින් රජයේ මෙන්ම සංස්ථාවේ ප්‍රතිපත්ති රාමුවට අනුකූලව ණය ලබාදීමට කටයුතු කිරීම.

### 2. පොළී අනුපාත මත අවදානම

පොළී අනුපාත වෙනස්වීම ලාභය හා මූල්‍ය ප්‍රවාහය මත බලපෑම් ඇති කරනු ලබන බැවින් එම අවදානම කළමනාකරණය කිරීම සදහා අවදානම් අවම කිරීමේ උපාය මාර්ග භාවිතා කරනු ලැබේ. ඒ සදහා පහත සදහන් පිළියම් යොදාගනු ලබයි.

- සැපයුම්කරුවන්ට මුදල් ගෙවීමේදී, අත්තිකාරම් ගෙවීමේදී විශේෂ මූල්‍ය ප්‍රතිපත්ති වලට අනුකූලව මුදල් ගෙවීම් සිදුකිරීම.
- අවම තෝලන මට්ටමක් පවත්වාගැනීම.
- ඵලදායී ලෙස කාරක ප්‍රාග්ධන කළමනාකරණය
- මූල්‍ය අවදානම් කළමනාකරණ ශිල්ප ක්‍රම ස්ථාපනය
- බැංකු සමග සාකච්ඡා කොට එකඟතාවන්ට අනූව සංස්ථාවේ ආයෝජනයන් මත විශේෂ පොළී අනුපාත ලබාගැනීම.
- අතිරේකව පවතින මුදල් නැවත අවශ්‍ය වන කාලසීමාව අනූව සැලසුම් කොට විශේෂ පොළී අනුපාත යටතේ තැන්පත් කිරීමට කටයුතු කිරීම.

### 3. ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා ගැටළු මගින් සේවක ගැටළු හා යෙදවුම් පිළිබඳ ගැටළු පැනනැඟීම තුළින් සංස්ථාවේ මෙහෙයුම් කටයුතු වලට අහිතකර බලපෑම් ඇතිවීම වලක්වා ගැනීම සදහා අවදානම් අවම කිරීමේ උපාය මාර්ගය සංස්ථාව විසින් යොදාගනු ලබයි. යහපත් ද්‍රවශීලතා මට්ටමක් පවත්වාගෙන යාම සදහා හා ක්‍රමවත් මූල්‍ය සැලසුම් හා පාලන පද්ධතියක් ස්ථාපිත කිරීම සදහා පහත සදහන් ක්‍රම යොදාගනු ලබයි.

- මුදල් ප්‍රවාහ පුරෝකථනය සහ ප්‍රමාණවත් මුදල් සහ මුදල් සමාන වත්කම් ශේෂ පවත්වා ගැනීම.
- සංස්ථාව සතුව අවශ්‍ය වූ විටක ඇප ලෙස භාවිතා කොට අනාගත මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීම සදහා ප්‍රමාණවත් වත්කම් පවත්වා ගැනීම.
- සංස්ථාවේ ප්‍රතිපත්තිමය තීරණ ගැනීම මධ්‍යගත කොට ඇත.
- ක්‍රමවත් ණය අයකරගැනීමේ ප්‍රතිපත්තියක් තුළින් බොල් ණය සහ ණයගැති ශේෂ ඉහලයාම වැලැක්වීම.
- වියදම් පාලනය කිරීම සදහා උචිත බලතල ස්ථාපිත කිරීම හා අභ්‍යන්තර විගණන පද්ධතියක් තුළින් ස්වාධීන ප්‍රතිපත්ති හා බලතල ක්‍රියාත්මකවීම පිළිබඳ නිරන්තරයෙන් විමර්ශණය කිරීම.

### 4. ප්‍රාග්ධන ආයෝජන අවදානම

සංස්ථාවේ තිරසාර පැවැත්මට ආයෝජන මූලික වශයෙන් බලපාන බැවින් වර්තමාන හා අනාගත යෝජනා මගින් ඇති විය හැකි අලාභ අවම කරගැනීම සදහා අවදානම් කළමනාකරණය කිරීමේ උපායමාර්ග ක්‍රියාත්මක කරනු ලබයි. ඒ

සඳහා පහත දැක්වෙන ක්‍රියාකාරකම් යොදාගනු ලබයි.

- වත්කම්වල ආයෝජන කිරීමේදී නියමිත පරිදි සැලසුම් කොට සංස්ථාවේ අයවැය සහ ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කිරීම.
- පවත්නා සියලුම වත්කම් උපරිම ලෙස උපයෝජනය.
- ප්‍රාග්ධන යෝජනා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී රාජ්‍ය අංශයේ ව්‍යාපාරයක් ලෙස වගකීමෙන් කටයුතු කිරීම.

## මෙහෙයුම් අවදානම් කළමනාකරණය

### 1. අභ්‍යන්තර පාලනයන් තුළ ඇති විය හැකි අවදානම

සංස්ථාවෙහි පවතින වත්කම් ආරක්ෂණය, මෙහෙයුම් ක්‍රියාවලියෙහි ඇති විය හැකි බිඳවැටීම් හඳුනාගැනීම, ප්‍රතිපත්ති හා තීරණ වෙනස් විය යුතු ආකාරය පෙන්වා දෙමින් හා අවදානම් වලක්වා ගැනීම සඳහා සංස්ථාව විසින් පහත සඳහන් උපායමාර්ගයන් යොදා ගනු ලබයි.

- නිරන්තරව කාලසටහනකට අනුව නියමාකාරයෙන් අභ්‍යන්තර විගණනයන් සිදුකිරීම වෙනුවෙන් අභ්‍යන්තර විගණන අංශය කැපවීමෙන් කටයුතු කිරීම.
- රාජ්‍ය අංශයේ ව්‍යාපාරික ආයතනයක් ලෙස සුදුසු පාලන පද්ධතියක් පවත්වා ගැනීම. විශේෂයෙන් මුදල් ගෙවීම්, සැපයුම්කරුවන් තෝරාගැනීම, සේවකයන් බඳවාගැනීමේ ක්‍රියාවලි පිළිබඳ වැඩි අවධානය යොමු කිරීම.
- සියලුම මූල්‍ය ක්‍රියාකාරකම් මූල්‍ය පනත් විධිවිධානයන්ට හා පවත්නා නීති හා රෙගුලාසි අනුව සිදුකරනු ලබයි.

### 2. නිෂ්පාදන අවදානම

සංස්ථාවේ පැවැත්ම තහවුරු කරන මූලික අංගයක් ලෙස නිෂ්පාදන ක්‍රියාවලිය හැඳින්විය හැක. ක්‍රමවත් නිෂ්පාදන ක්‍රියාවලියක් නොපැවතීමෙන් පාරිභෝගික තෘප්තිය අපේක්ෂිත මට්ටමින් ළඟා කරගත නොහැකි වන අතර, එය සංස්ථාවේ සාර්ථකත්වයට ද බලපානු ලබයි. එබැවින් නිෂ්පාදන ක්‍රියාවලියේ ඇති විය හැකි අවදානම් කළමනාකරණය සඳහා පහත ක්‍රියාමාර්ග යොදාගනු ලබයි.

- නිෂ්පාදන ක්‍රියාවලිය විවිධ මට්ටම් වලදී තත්ව පරීක්ෂණයන්ට භාජනය කොට නිම් භාණ්ඩ පාරිභෝගිකයන් අතට පත්වීම දක්වා ගුණාත්වය තහවුරු කිරීම.

- නියමිත ප්‍රමිතියෙන් තොර නිෂ්පාදන වෙන් කොට ඒවා සංස්ථාවේ කීර්ති නාමයට හානි නොවන පරිදි විකිණීමට හෝ ක්‍රමවත් අයුරින් බැහැර කිරීමට කටයුතු කිරීම.
- නියමිත ප්‍රමිතියෙන් යුතු දැව ලබාගැනීම සඳහා වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් නිදහස් කරනු ලබන වනවගා වලින් දැව ලබාගැනීම සිදුකරන අතර, එසේ නිදහස් කරනු ලබන දැව අවුරුදු 35 කට අධික බැවින් එය නිෂ්පාදනවල ගුණාත්මකබව හා උසස් තත්වයේ නිමාව තහවුරු කරයි.

### 3. මානව සම්පත් අවදානම

සංස්ථාවේ මෙහෙයුම් කටයුතු බාධා රහිතව කරගෙන යාම සදහා රාජ්‍ය දැව සංස්ථාව මානව සම්පත් අවදානම් වලක්වා ගැනීමේ උපාය මාර්ගය යොදාගනු ලැබේ.
මෙමගින් සේවක පිරිවැටුම අවම මට්ටමක පවත්වා ගැනීම, පුහුණුවීම් සහ යහපත් පිළිවෙත් තුලින් අනුවර්ථතාව, යෝග්‍ය හා කාර්යඵල ජනිත කරන සේවකයින් සංස්ථාව වෙත ආකර්ෂණය හා සංස්ථාව තුළ රඳවා ගැනීම, යහපත් වැඩ පරිසරයක් ආයතනය තුල පවත්වා ගැනීම කළ හැකිය. මේ සඳහා පහත ක්‍රියාමාර්ග සංස්ථාව විසින් යොදාගනු ලබයි.

- යහපත් හා මිත්‍රශීලි වැඩ පරිසරයක් සෑම සේවක මට්ටමක් අතරම පවත්වා ගැනීම.
- විවිධ ආකාරයේ සේවක ප්‍රතිලාභ ලබාදීම.
- අවශ්‍ය අවස්ථාවලදී සේවකයින් විශේෂ හා පොදු පාඨමාලා සදහා යොමු කරනු ලැබේ.
- රාජ්‍ය ආයතනයක් ලෙස විශේෂ ප්‍රතිපත්ති මාලාවකට අනුව නව සේවකයින් බඳවා ගනු ලැබේ.

### 4. තොග කළමනාකරණ අවදානම

අවදානම් අවම කිරීම උපාය මාර්ගය යොදා ගැනීම තුලින් තොග මගින් ඇති විය හැකි අවදානම් අවම කිරීම තුලින් රාජ්‍ය දැව සංස්ථාව තොග නැතිවීමෙන් සිදුවන අලාභ වලක්වාගැනීම, සෙමින් චලනය වන තොග එක්රැස්වීමෙන් සිදුවන අලාභ අවම කිරීම, යල්පැනගිය තොග එක්රැස්වීමෙන් සිදුවන අලාභ අවම කිරීම, ගුණාත්වයෙන් අඩු අමුද්‍රව්‍ය තොග ලබාගැනීමෙන් සහ භාවිතයෙන් සිදුවන අලාභ අවම කිරීම, තොග රඳවා ගැනීමේ පිරිවැය අවම





කිරීම යන ප්‍රතිලාභ ලබාගත හැක. ඒ සදහා පහත දැක්වෙන ක්‍රියාමාර්ග යොදාගනු ලබයි.

- මාසික විකුණුම් පුරෝකථනයන් සහ වාර්ෂික අයවැයගත නිෂ්පාදන ඉලක්ක පිළිබඳ සැළකිල්ලට ගෙන නිෂ්පාදන කමිටු රැස්වීමේදී මාසික නිෂ්පාදන ඉලක්ක තීරණය කරනු ලබයි.
- සෙමින් චලනය වන නිෂ්පාදිත අලෙවි කරගැනීම සදහා විවිධ අලෙවිකරණ උපක්‍රම යෙදීම. උදා:- "ප්‍රසාද අභිමානී ගෘහභාණ්ඩ ණය යෝජනා ක්‍රමය" වැනි අලෙවිකරණ උපාය මාර්ග.
- නිෂ්පාදන ක්‍රියාවලිය විවිධ මට්ටම් වලදී තත්ව පරීක්ෂණයන්ට භාජනය කොට නිම්භාණ්ඩ පාරිභෝගිකයන් අතට පත්වීම දක්වා ගුණාත්වය තහවුරු කිරීම.
- නියමිත ප්‍රමිතියෙන් තොර නිෂ්පාදිත වෙන්කොට, ඒවා සංස්ථාවේ කීර්ති නාමයට හානි නොවන පරිදි විකිණීමට හෝ ක්‍රමවත් අයුරින් බැහැර කිරීමට කටයුතු කිරීම.
- නිරතුරුව තොග විශ්ලේෂණය කොට සෙමින් චලනය වන තොග හඳුනාගෙන ඒවා ආදායම් ඉපැයීම සඳහා යොදාගැනීම.
- නිරතුරුව තොග රඳවාගැනීමේ කාලය පිළිබඳ සැලකිලිමත්වීම.
- කාලයෙන් කාලයට විශ්ලේෂණය කොට සෙමින් චලනය වන තොග සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම. සුදුසු ගබඩා පහසුකම් හා ගබඩා කිරීමේ ක්‍රම සැලසීම.

### 5. පරිසර අවදානම

රාජ්‍ය දැව සංස්ථාවෙහි සිදුකෙරෙන මෙහෙයුම් කටයුතු වලින් පරිසරයට සිදුවන අලාභදායී බලපෑම් අවම කරගැනීම සඳහාත්, සංස්ථාවේ පරිසර නීතිරීති අනුව කටයුතු කිරීම සඳහාත් අවදානම් වලක්වා ගැනීමේ උපාය මාර්ගය තුලින් පහත සඳහන් ක්‍රම යොදා ගනු ලබයි.

- විවිධ වූ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් ප්‍රජාව සහ ආයතන විශේෂයෙන් පාසැල් සිසුන් දැනුවත් කිරීම.
- පාරිසරික ප්‍රතිපත්ති තීරණය කරන ආයතනවල ප්‍රතිපත්ති වලට අනුකූල බව තහවුරු කරගැනීම.
- පරිසරය කෙරෙහි ඇල්මැති පාර්ශවයන් සමඟ ශක්තිමත් සම්බන්ධතාවයක් ඇති කර ගැනීම.
- පහළ යන වනවගා ප්‍රමාණයට පිළියමක් ලෙස නැවත වනවගා ව්‍යාපෘති ආරම්භ කිරීම.

### 6. වත්කම් අවදානම

යන්ත්‍ර සූත්‍ර ක්‍රියාවිරහිතවීම්, ගින්නෙන්, හදිසි අනතුරු වලින් සේවකයන්ගේ හා සොරසතුරු උවදුරු වලින් වත්කම් වලට ඇති විය හැකි හානි අවම කිරීම සඳහා සංස්ථාව පහත සඳහන් ක්‍රම තුලින් අවදානම් වලක්වා ගැනිමේ උපාය මාර්ගය යොදා ගනී.

- සියලුම අවදානම් අංශයන් ආවරණය වන පරිදි රක්‍ෂණාවරණයක් වත්කම් සඳහා ලබාගැනීම.
- සැලසුම්ගත නඩත්තු කිරීමේ වැඩසටහනක් යටතේ වත්කම් නඩත්තුව සිදුකිරීම.
- වත්කම්වල සියලු කටයුතු වෙනුවෙන් විශේෂ ප්‍රතිපත්ති බලතල පනවා ඇත. එමෙන් ම අභ්‍යන්තර විගණන කටයුතු නිසි වේලාවට සිදුකිරීම.

## අනුකූලතා අවදානම් කළමනාකරණය

### 1. නීති හා රෙගුලාසි අවදානම

නීති හා රෙගුලාසි වලට අනුකූල නොවීමෙන් සංස්ථාවේ මෙහෙයුම් කටයුතු වලට ඇති වන බලපෑම, කීර්ති නාමයට සිදුවන බලපෑම හා වන්දි හා දඩ මුදල් ගෙවීමට සිදුවීම යන අලාභදායී තත්වයන්ට මුහුණ දීමට සිදුවීමෙන් වන අවදානම් මේ යටතට ගතහැක. එම නිසා නීති හා රෙගුලාසි වල වෙනස්වීමෙන් ඇති වන බලපෑම කල්තියා හඳුනාගෙන සංස්ථාවට ඇති වන බලපෑම අවම කිරීම හා නෛතික පරිසරය තුල ඇති වන වෙනස්කම් වලට සාර්ථකව මුහුණදීම සඳහා ශක්තිමත්, ඵලදීයි සහ නම්‍යශීලි ව්‍යුහයක් ඇති කිරීම සඳහා අවදානම් වලක්වා ගැනිමේ උපක්‍රමය යොදා ගන්නා අතර, ඒ සඳහා පහත සඳහන් ක්‍රියා මාර්ග යොදාගනී.

- සංස්ථාවේ නීති හා රෙගුලාසි වලට අනුකූල වෙමින් කටයුතු කිරීම
- අධ්‍යක්‍ෂවරු සහ අදාල බලධාරීන්ගේ උපදෙස් මත කටයුතු කිරීම.
- නීති ප්‍රතිපත්ති නැඹුරුතාවය පිළිබඳ අධීක්‍ෂණය කිරීම.
- රජයේ ප්‍රතිපත්ති හා චක්‍රලේඛ වලට අනුකූලව කටයුතු කිරීම.

## තාක්‍ෂණය හා නිෂ්පාදනවල අවදානම් කළමනාකරණය

### 1. ගුණාත්මකභාවය සම්බන්ධ අවදානම

රාජ්‍ය දැව සංස්ථාව විසින් අවදානම් වලක්වා ගැනීමේ උපක්‍රමය යොදා ගෙන නවීන තාක්‍ෂණය සහ තත්ව ප්‍රමිති පිළිබඳ වැඩි අවදානයක් යොමුකිරීම මගින් ආයතනය තුල යල්පැනගිය ක්‍රම භාවිතය නිසා ඇති වන ගැටළු මගහරවා ගැනීම, භාණ්ඩ හා සේවා නියමිත ගුණාත්මක භාවයෙන් නොපැවතීම අවම කිරීම, අදාල නීතිරීති වලට අනුකූලව සැලසුම් ක්‍රියාත්මක කිරීම යනාදිය ඉටුකර ගනී. ඒ සඳහා පහත සඳහන් ක්‍රම යොදා ගනී.

- දිගුකාලීන සැලසුම් වලට අනුව යල්පැනගිය යන්ත්‍ර වෙනුවට නව යන්තසුත්‍ර නිෂ්පාදනයට භාවිතා කිරීම
- අපගේ නිෂ්පාදන ජාතික සහ අන්තර් ජාතික මට්ටම හා ගැලපෙන බවට අදාල ආයතනයන්ගෙන් සහතික ලබාගැනීම
- පර්යේෂණ හා සංවර්ධන අංශය මගින් පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් සංස්ථාවේ අභිවෘද්ධිය උදෙසා සිදුකිරීම.
- නිෂ්පාදන ගුණත්වය ආරක්‍ෂා කිරීම සදහා අවශ්‍ය පර්යේෂණ කටයුතු වෙනුවෙන් විද්‍යාගාර පහසුකම් සැපයීම
- බාහිර හා අභ්‍යන්තර විගණනයන් මගින් නිරතුරුව සොයා බැලීම.

## උපායමාර්ග හා ව්‍යාපාරික අවදානම් කළමනාකරණය

### 1. කීර්තිනාම අවදානම

රාජ්‍ය දැව සංස්ථාව විසින් තම කීර්තිනාමයට සිදුවියහැකි අවදානම් කළමනාකරණය සදහා අවදානම් අවම කිරීමේ උපාය මාර්ගය යොදාගන්නා අතර, එමගින් තම කීර්තිනාමයට හා ගුණත්වයට හානි සිදුවන ක්‍රියාවලින් වැලකීම, මෙහෙයුම් කාර්යක්‍ෂමතාව, මූල්‍ය කටයුතු වල විනිවිදභාව තුලින් ඇල්මැති පාර්ශවයන් සමග ශක්තිමත් සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීමට කටයුතු කරයි. පහත සඳහන් ක්‍රියා මාර්ග කීර්තිනාමයට සිදුවිය හැකි අවදානම් අවම කිරීම සඳහා යොදාගනී.

- අයවැයගත ඉලක්ක අනුව මාසිකව අයවැය ඉලක්ක වෙත ළඟා වන අයුරින් ක්‍රියාකිරීම හා සංස්ථාවේ කාර්ය සාධන අපේක්ෂිත ඉලක්ක හා ගැලපේද යන්න තහවුරු කරගැනීම.
- නිෂ්පාදන ගුණාත්මකභාවය සහ ප්‍රමිතීන්ට අනුකූල බව තහවුරු කරගැනීම.
- ඇල්මැති පාර්ශවයන් සමග යහපත් ඵලදායී සන්නිවේදන ක්‍රම තුලින් ගනුදෙනු කිරීම.
- සංස්ථාවේ ප්‍රතිරූපය තව තවත් ඉහල නැංවීම සදහා බාහිර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.



### 2. වෙළඳපොල තරඟකාරීත්ව අවදානම

අඩු ගුණත්වයෙන් යුත් ආනයනික දැව හා දැවමය භාණ්ඩ හේතුවෙන් වෙළඳපොල තරඟකාරීත්වය ඉහළයාමෙන් ඇති විය හැකි වෙළඳපොළ කොටස අඩුවීම වැලැක්වීම, ප්‍රධාන නිෂ්පාදිතවල විකුණුම් ආදායම ඉහළ නංවාගැනීම, (එනම් දැව කඳන්, ඉරූදැව, සිල්පර, විදුලි කණු, අලිවැටකණු වැනි ආදායම්) හා නවෝත්පාදන තුලින් වෙළඳපොළ කොටස ඉහල නංවා ගැනීම යන අරමුණු ඉටුකරගැනීම සදහා වෙළඳපොළ තරඟකාරීත්වය මගින් සංස්ථාවට ඇති වන අවදානම කළමනාකරණය සදහා අවදානම් අවම කිරීමේ උපාය මාර්ගය යොදාගනු ලබයි. ඒ සදහා පහත දැක්වෙන ක්‍රියාමාර්ග යොදාගනු ලබයි.

- පවතින තත්වය පාලන ප්‍රමිති වලට අනුකූල වන බවට හැමවිටම තහවුරු කරගැනීම.
- විවිධ පුවත්පත් දැන්වීම් සහ ප්‍රවර්ධන වැඩසටහන් මගින් තවදුරටත් රාජ්‍ය දැව සංස්ථාවේ කීර්ති නාමය ශක්තිමත් කිරීමට කටයුතු කිරීම.

  උදා:- රාජ්‍ය සේවකයින් සදහා ලබාදෙන "ප්‍රසාද අභිමාණී" ගෘහභාණ්ඩ ණය ක්‍රමය යටතේ අවුරුදු 2ක ණය ආපසු ගෙවීමේ කාලයකට යටත්ව 10% පොලී අනුපාතිකය මත භාණ්ඩ ලබාදීම. 2013 වර්ෂයේ සිට ණයපත් ක්‍රමය හරහා ගනුදෙනු කිරීම ආරම්භ කිරීම.

- විශිෂ්ඨ සේවාවක් සැපයිය හැකි පරිදි ගබඩා හා ප්‍රදර්ශනාගාර විධිමත් ලෙස පවත්වාගෙන යාම.
- නවෝත්පාදන වෙනුවෙන් පර්යේෂණ පැවැත්වීම මෙන්ම නව සංකල්ප ආයතන තුළට ගෙන ඒම මගින් පාරිභෝගික ආකර්ශණය වැඩිකර ගැනීම.
- වෙළඳපොළ පර්යේෂණයන් තුලින් පාරිභෝගිකයන්ගේ අපේක්‍ෂාවන් හඳුනාගැනීම.
- අපතය අඩුකිරීම තුළින් අඩු පිරිවැයකින් උසස් තත්වයේ භාණ්ඩ නිෂ්පාදනය කරගැනීම.
- විවිධ ක්‍රම හා ශිල්ප භාවිතා කොට නව මෙහෙයුම් ක්‍රමෝපායන් සකස් කිරීම.

### 3. තොරතුරු පද්ධති අවදානම

නිවැරදි තොරතුරු හිඟ බව, තොරතුරු වල සුරක්‍ෂිත බව, දෘඩාංග හා මෘදුකාංග සන්නිවේදන පද්ධති හා බැඳී පවතින අවදානම් අවම කිරීම මෙන්ම තාක්‍ෂණික ප්‍රතිපත්ති නිරන්තරව යාවත්කාලීන කොට නව තාක්‍ෂණික පරිසරයට ගැලපෙන අයුරින් පවත්වා ගැනීමත්, සංස්ථාව තුළ තොරතුරුවල සුරක්‍ෂිතභාවය මැන බලන මිනුම්වල ඒකීයභාවය සහ ප්‍රමිතියට අනුකූල බව සැමවිටම තහවුරු කරගැනීම සඳහා පහත උපාය මාර්ග යොදාගනු ලබයි.

- නිරතුරුව තොරතුරු තාක්‍ෂණික ප්‍රතිපත්ති වලට අනුකූලවීම.
- දත්ත උපස්ථ පිටපත් නිතර එක්රුැස්කොට බාහිර ස්ථානවල ගබඩා කිරීම.
- වැදගත් දත්ත සම්බන්ධ දෘඩ තැටියේ පිටපතක් තබාගැනීම.
- නඩත්තු කිරීම හා අනෙකුත් සේවා සඳහා වාර්ෂිකව සැපයුම්කරුවන් සමඟ ගිවිසුම් වලට එළඹීම.
- පවතින වෛරස අනාවරණය කර නිශේදනය කරන පිලි වෛරස් මෘදුකාංග, අනෙකුත් මෘදුකාංග නිසිකලට යාවත්කාලීන කිරීම, සෑමවිටම රහස් සංකේත භාවිතා කිරීමට පෙළඹවීම තුළින් තොරතුරු වලට බාහිර පුද්ගලයින් අනවසරයෙන් ඇතුළුවීම වැලැක්වීම.





# විගණකාධිපති වාර්තාව

*රාජ්‍ය දැව සංස්ථාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ශය සඳහා  වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව*

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } අයිඊඑන්/සී/එස්ටීසී/1/16/146    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2016 සැප්තැම්බර් 27 දින

සභාපති කාර්යාලය
27 SEP 2016
රාජ්‍ය දැව සංස්ථා

සභාපති

රාජ්‍ය දැව සංස්ථාව

**රාජ්‍ය දැව සංස්ථාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

යථෝක්ත වාර්තාව මේ සමග එවා ඇත.

එච්. එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

පිටපත් : 1. ලේකම්, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
2. ලේකම්, මුදල් අමාත්‍යාංශය.



අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk



# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } අයිඊඑන්/සී/එස්ටීසී/1/16/146    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2016 සැප්තැම්බර් 27 දින

සභාපති

රාජ්‍ය දැව සංස්ථාව

**රාජ්‍ය දැව සංස්ථාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

රාජ්‍ය දැව සංස්ථාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනිකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ අංක 29 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සංස්ථාවේ සභාපති වෙත යථාකාලයේදී නිකුත් කරනු ලැබේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.



අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරුකිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත්වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.



AGDSL
විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය දැව සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01

විශ්‍රාම පාරිතෝෂික බැදීම් සඳහා වූ වෙන්කිරීම් වලදී ඇතිවන අතිරික්ත හෝ ඌණතා විස්තීරණ ආදායම් ප්‍රකාශනයෙහි වෙනම හෙළිදරව් කළයුතු වුවද, සංස්ථාව විසින් අතිරික්ත හෝ ඌණතා හදුනාගෙන විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16

(i) දේපල හා පිරියතවල ප්‍රයෝජනවත් ජීවිත කාලය ගිණුම් කාලපරිච්ඡේදයක් අවසානයේ සමාලෝචනය කර ඒ අනුව ක්ෂය ප්‍රතිපාදන සංශෝධනය කළයුතු නමුත් පිරිවැය රු.879,187,990 ක්වූ වත්කම් පූර්ණ වශයෙන් ක්ෂය කර අයිතමයක් රු.5 ක වටිනාකමට දක්වා තිබුණි. මෙම වත්කම් තවදුරටත් ප්‍රයෝජනයට ගන්නේ නම් ක්ෂය අනුපාතය සංශෝධනය කිරීමටත්, ප්‍රයෝජනයට නොගන්නේ නම් ඒ සඳහා ක්‍රියාමාර්ග ගෙන නිවැරදි ධාරණ අගය පෙන්නුම් කිරීමට හෝ ගිණුම් මගින් හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) වටිනාකම රු.84,467,845 ක් වූ ඉඩම් තුළ නිශ්චිත ප්‍රයෝජනවත් ආයු කාලයක් සහිත වූ රු. 25,410,700 ක් වටිනා තාප්ප, ගේට්ටු, මායිම් වැටවල් ආදිය දක්වා තිබුණ අතර 1968 වර්ෂයේ සිට පිරිවැයට ඉදිරියට ගෙන එමින් පැවතුණි. එම වත්කම් ඉඩම් යටතේ දැක්වීමෙන් ක්ෂය කිරීමක් සිදු කර නොතිබුණි. දීර්ඝ කාලයක සිට පිරිවැයට ගිණුම් ගත කර තිබූ ඉඩම්වල වර්තමාන වෙළඳපල මිල ගණන් සැලකිය යුතු ප්‍රමාණයකින් වෙනස්වී ඇතත් එහි සාධාරණ අගය දැක්වීම සඳහා වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 37

ප්‍රමිතිය අනුව අලාභයේ වටිනාකම හඳුනාගත හැකි අවස්ථාවලදී අසම්භාව්‍ය බැරකම් සඳහා වෙන්කිරීම් සිදුකල යුතු නමුත් වැඩ තහනම් කල නිලධාරියෙකු චෝදනාවලට නිවැරදිකරු වීම නිසා ගෙවිය යුතු රු.1,957,174 ක හිග වැටුප සඳහා වෙන් කිරීම් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 40

වටිනාකම රු. 5 ක් ලෙස දක්වා ඇති සංස්ථාවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ කොටසක් රාජ්‍ය ආයතන දෙකකට කුලියට දී සමාලෝචිත වර්ෂයේදී රු.14,714,790 ක ආදායමක් උපයාගෙන තිබුණි. එසේ වුවද මෙම ගොඩනැගිල්ලේ වටිනාකම ආයෝජන වත්කම් යටතේ ප්‍රත්‍යාගණනය කර ගිණුම් ගත කර නොතිබුණි.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බදු විෂයයන් 4ක හා ගෙවිය යුතු ස්කන්ධ භාග වටිනාකම්,බදු වාර්තා අනුව හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තු ලේඛන අනුව සැසඳීමේදී රු.21,774 සිට රු.878,986,690 දක්වා පරාසයක වෙනස්කම් නිරීක්ෂණය විය.





## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසම්බර් 31 දිනට වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂය තුල පෞද්ගලික සමාගමකින් අය විය යුතු රු.11,873,954 ක් වසර 30 කට අධික කාලයක සිටද, රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවලින් අයවිය යුතු වර්ෂ 5 ක් ඉක්ම වූ එකතුව රු:1,132,198 ක තැන්පත්ද වර්ෂ 2 ඉක්මවූ එකතුව රු.13,018,508 ක ණය ශේෂයන්ද විගණිත දිනය වූ 2016 මැයි දක්වා අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රසාද අභිමානී ණය යෝජනා ක්‍රමය යටතේ ගෘහ භාණ්ඩ ලබාගත් නිලධාරීන් 06 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 69,249 ක මුදල 2011 වර්ෂයේ සිට අයකිරීම අක්‍රියව පැවතුන අතර අදාළ නිලධාරීන්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට 2016 මැයි දක්වා කටයුතු කර නොතිබුණි.

(ඇ) පසුගිය වර්ෂ කිහිපයක් තුළ බොල් ණය ලෙස විශාල අගයන් කපාහැරීමට සිදුවීම, අයවිය යුතු ණය ශේෂයන් යාවත්කාලීනව අය නොවීම, ගෙවීම් ප්‍රමාදවූ ණය මත අධිභාරයක් පැනවීම මඟින් ණය අයකර ගැනීමට කටයුතු නොකිරීම යනාදී හේතූන් නිසා ණයට විකුණුම් සම්බන්ධයෙන් වූ පරිපාලනය දුර්වල තත්ත්වයක පවතින බව නිරීක්ෂණය විය.

(ඈ) භාණ්ඩ හා සේවා ලබා ගැනීමට සහ සංස්ථාවේ වැඩබිම් වල කොන්ත්‍රාත්කරුවන්ට 2011 සහ 2014 වර්ෂවලදී ගෙවන ලද පිළිවෙලින් රු.95,000 ක සහ රු.13,822,462 ක අත්තිකාරම් සමාලෝචිත වර්ෂය තුළදී ද නිරවුල් කර නොතිබුණි.

(ඉ) වන සංරක්ෂක දෙපාර්තමේන්තුවෙන් විදුලිය, ජලය හා ගොඩනැගිලි කුලී වශයෙන් රු. 13,223,972 ක් 2014 වර්ෂයේ සිට අයකර ගෙන නොතිබුණි.

(ඊ) 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ස්කන්ධ භාග ලෙස සංස්ථාවේ ප්‍රාදේශීය කාර්යාල මඟින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු මුදල රු.97,540,310 ක් විය.

(උ) අවුරුදු දෙක ඉක්මවන ලද කොන්ත්‍රාත්කරුවන්ගේ රැඳවුම් මුදල හා ඇප තැන්පත් එකතුව රු.4,913,467 ක්ද වසරක් ඉක්ම වූ ගැන්ග් නේල් (Gang nail) තැන්පතු රු.484,450 ක් ද නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | (i) මුදල් රෙගුලාසි104 (3) සහ 104 (4) | 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා සිදු වූ වාහන අනතුරු 14 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව ප්‍රාරම්භක වාර්තා හා අවසන් වාර්තා ඉදිරිපත් කිරීමට කමිටු පත් කර තිබුණද ප්‍රාරම්භක වාර්තාවන් ඉදිරිපත් නොකළ අනතුරු සංඛ්‍යාව 07 ක් විය. |
| | (ii) මුදල් රෙගුලාසි 571(2) | කොන්ත්‍රාත්කරුවන් විසින් තබා ඇති ආරක්ෂිත තැන්පතු හා සැපයුම්කරුවන් විසින් තබා තිබූ ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු අදාල කාර්යයන් නිම වීමෙන් පසු ආපසු ගෙවිය යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. වර්ෂ දෙක ඉක්මවූ තැන්පතු රු.2,082,701 ක් හා ටෙන්ඩර් තැන්පතු රු.20,750 ක් විය. |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ | |
| | (i) 2.8.4 වගන්තිය | විශාල වටිනාකම් සහිත තාක්ෂණික උපකරණ මිලදී ගැනීමේදී ඒ පිළිබඳ විශේෂඥ දැනුම ඇති බාහිර පුද්ගලයෙකු රේඛීය අමාත්‍යාංශයෙන් හෝ ප්‍රසම්පාදන අස්ථිත්වයෙන් බාහිර ප්‍රසම්පාදන විෂයය සම්බන්ධයෙන් දැනුම ඇති අයෙකුවත් සිටිය යුතු වුවද, සංස්ථාව විසින් එවැනි පුද්ගලයෙකු කමිටුව සදහා පත්කර නොතිබුණි. |
| | (ii) 4.2.3 වගන්තිය | තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය ලැබී සති 04ක කාලයක් තුල භාණ්ඩ මිලදී ගතයුතු වුවද, අවස්ථා දෙකකදී එයට පටහැනිව තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව ලැබීමෙන් පසුව මාස 07 ක කාලයක් ප්‍රමාද කර මිලදී ගෙන තිබුණි. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 හා 9.4 වගන්ති | චක්‍රලේඛයේ විධි විධානවලට පටහැනිව නිලධාරීන් තිදෙනෙකු සමාගමක සේවය සඳහා සංස්ථා සේවයෙන් නිදහස් කර තිබුණි. |
| (ඇ) | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5.2(සී) වගන්තිය | ක්‍රියාකාරී සැලැස්මෙහි මානව සම්පත් සංවර්ධන සැලැස්මක් ඇතුළත් කර නොතිබුණි. තවද මෙම චක්‍රලේඛය ප්‍රකාරව රජය වෙනුවෙන් කරනු ලබන සංවර්ධන ක්‍රියාකාරකම් සහ වාණිජමය වශයෙන් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ක්‍රියාකාරකම් වෙන් වෙන් වශයෙන් හඳුනා ගත යුතු වුවද එසේ හඳුනාගෙන නොතිබුණි. |



AGDSL
විගණකාධිපති දෙපාර්තමේන්තුව
Auditor General's Department

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයේදී මූල්‍ය ප්‍රතිඵලය රු.369,890,477 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.205,997,864 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.163,892,613 ක වර්ධනයක් නිරීක්ෂණය විය. බදු වියදම රු.152,584,280 කින් වැඩි වුවද දළ ආදායම රු.303,664,054 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා මූල්‍ය ප්‍රතිඵලය අඛණ්ඩව වර්ධනය වී තිබුණි. සේවක පාරිශ්‍රමික, බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සැලකිල්ලට ගැනීමේදී 2011 හා 2012 වර්ෂවලට සාපේක්ෂව 2013 වර්ෂයේදී දායකත්වය අඩු වී තිබුණු අතර නැවත එය 2014 හා 2015 වර්ෂවලදී වර්ධනය වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දායකත්වයේ වැඩිවීම සියයට 23 කි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

විගණනය සඳහා ලැබී ඇති තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂය සඳහා විශේෂ මූල්‍යමය අවස්ථාවන් පහත පරිදි දක්වා ඇත.

| විෂයය | සමාලෝචිත වර්ෂය | ඉකුත් වර්ෂය | ඉකුත් වර්ෂය සමග වෙනස්වීමේ ප්‍රතිශතය වැඩිවීම/(අඩුවීම) |
|---|---|---|---|
| | රු. | රු. | සියයට |
| පිරිවැටුම | 3,836,191,364 | 3,473,847,448 | 10.43 |
| විකුණුම් පිරිවැය | 2,079,076,399 | 2,020,396,537 | 2.90 |
| දළ ලාභය | 1,757,114,965 | 1,453,450,911 | 20.89 |
| පරිපාලන වියදම් | 706,105,228 | 740,913,217 | (4.70) |
| බදුවලට පෙර ලාභය | 768,699,335 | 427,222,442 | 79.93 |
| භාණ්ඩාගාරයට ගෙවූ බදු | 50,000,000 | 25,000,000 | 100 |
| බදුවලට පසු ලාභය | 718,699,335 | 402,222,442 | 78.68 |
| ආදායම් බදු | 348,808,858 | 196,224,578 | 77.76 |
| මුළු විස්තිරණ ආදායම | 390,148,289 | 205,997,864 | 89.39 |
| තොග පිරිවැටුම් අනුපාතය | 1.96 | 1.96 | |
| තොග පිරිවැටුම් කාලය (දින) | 186 | 185 | |

(අ) පූර්ව වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දළ ලාභ අනුපාතය ඉහළ යාම සියයට 20.89 කි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ විකුණුම් පිරිවැය සියයට 2.9 කින් ඉහළ ගොස් තිබුණද ආදායම සියයට 10.43 කින් ඉහල යාම මෙම වර්ධනයට හේතු වී තිබුණි.



විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

(ආ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ලාභය ඉහළ යාම සියයට 79.93 කි. ඒ සඳහා පරිපාලන වියදම් සියයට 5 කින් සහ පහළ යාම මෙහෙයුම් ආදායම් සියයට 21.85 කින් ඉහල යාම බලපා තිබුණි. වෙනත් මෙහෙයුම් ආදායමෙන් සියයට 18 ක් විශ්‍රාමික පාරිතෝෂික අධි වෙන්කිරීම වූ අතර මෙහෙයුම් ආදායමෙන් සියයට 47 ක් අඩමාණ ණය අධි වෙන්කිරීම් හා තොග හානි අධි වෙන්කිරීම් විය. එබැවින් මෙම ශුද්ධ ලාභයේ ඉහළ යාම මෙහෙයුම් කටයුතු තුලින් ජනිත වූවක් නොවන අතර මෙමගින් මූල්‍යමය අගයේ ඉහළ යාමකට වඩා නාමික අගයේ ඉහළ යාමක් බැවින් සංස්ථාවේ මෙහෙයුම් කාර්යක්ෂමතාවයෙහි සැලකිය යුතු වර්ධනයක් නිරීක්ෂණය නොවීය.

(ඇ) සංස්ථාව විසින් අවසන් තොගය ඒකාකාරීව පවත්වාගෙන යාම හේතුවෙන් තොග පිරිවැටුම් අනුපාතය හා තොග පිරිවැටුම් කාලය 1.96 ක් හා දින 186 ක් වීමෙන් නිෂ්පාදන භාණ්ඩයන් දිගුකාලයක් ගබඩාවල රැඳී පවතින බැව් නිරීක්ෂණය වීම තුලින් සංස්ථාව විසින් වෙළඳ තොගය කඩිනමින් පිරිවැටුම බවට පත්කර ගැනීමේ වෙළඳ උපක්‍රමයන් කෙරෙහි අවධානය යොමුකර නොමැති බව නිරීක්ෂණය විය.

## 3.3 සංස්ථාවට එරෙහිව හෝ සංස්ථාව විසින් ආරම්භකර ඇති නෛතික සිද්ධි

සමාලෝචිත වර්ෂය අවසාන වන විට සංස්ථාවට එරෙහිව කම්කරු කාර්යාල නඩු 02 ක්ද, බේරුම්කරණ නඩු 02 ක්ද, කම්කරු විනිශ්චය සභා නඩු 03 ක්ද, මහේස්ත්‍රාත් අධිකරණ නඩු 03 ක්ද, දිසා අධිකරණ නඩු 06 ක්ද, මහාධිකරණ නඩු 03 ක්ද, අභියාචනාධිකරණ නඩු 03 ක් හා ශ්‍රේෂ්ඨාධිකරණ නඩු 02 ක්ද ඇතුළුව නඩු 24 ක් තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට සංස්ථාව විසින් මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ පවරන ලද නඩුවක්ද විභාග වෙමින් පැවතුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ 1968 අප්‍රේල් 04 දිනැති අංක 14796, 1982 පෙබරවාරි 05 දිනැති අංක 178/10 හා 2001 ජූනි 26 දිනැති අංක 1190/7 දරන ගැසට් පත්‍රවලින් නිශ්චිත පහත සඳහන් අරමුණු ඇතිව රාජ්‍ය දැව සංස්ථාව පිහිටුවා ඇත.

(i) වනාන්තර වලින් දැව කපා ඉවත් කිරීම, එම දැව ඉරූ දැව හා නිමි භාණ්ඩ වලට පරිවර්තනය කිරීම, කඳන් ඉරූ දැව හා නිමි නිෂ්පාදන අලෙවිය හා එම කාර්යයන් සඳහා කැලෑ මාර්ග ඉදිකිරීම.

(ii) දැව කඳන් කිරීමේ මධ්‍යස්ථාන, ඉරුම්හල්, තෙල් කැවීමේ හා පරීක්ෂණ යන්ත්‍රාගාර, දැව පදම් කිරීමේ හා වියලීමේ උදුන් හා වෙනත් උපකරණ හා ස්ථාපනයන් අත්පත් කරගැනීම, ඉදිකිරීම් හා පවත්වා ගෙන යාම.

(iii) දැව හා දර අලෙවි කිරීමේ ගබඩා පවත්වාගෙන යාම, අතුරු භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවිය හා දැව ආනයනය කිරීම.

(iv) නව වන වගා ව්‍යාපෘති ආරම්භ කිරීම, නැවත වන වගා ඇති කිරීම, වනාන්තර හා වන වගා විද්‍යාත්මකව කළමනාකරණය කිරීම.

(v) කෘෂිකාර්මික නිෂ්පාදනය හා වේවැල් ආනයනය කිරීම.

(vi) දැව ආශ්‍රිත නිමි හා අර්ධ නිමි භාණ්ඩ අපනයනය කිරීම හා පෞද්ගලික ඉඩම්වලින් දැව මිලදී ගැනීම.

(vii) වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන පිරිසැකසුම් කිරීම.

(viii) දේශීය හා විදේශීය දැව වර්ග හඳුනා ගැනීම හා සහතික නිකුත් කිරීම.

(ix) දැව කාර්මාන්තය ආශ්‍රිත විෂයයන් පිළිබඳ පුහුණු වැඩ සටහන් පැවැත්වීම, සහතික ප්‍රදානය කිරීම හා පරිසරය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම.

(x) සංස්ථාවට අයත් ඉඩම් හා ගොඩනැගිලිවල සම්පූර්ණ ප්‍රයෝජන ලබා ගැනීම සඳහා සැලසුම් කිරීම හා ආයෝජන යෙදවීම.

ඉහත සඳහන් අරමුණු අතරින් කෘෂිකාර්මික නිෂ්පාදන සහ වේවැල් ආනයනය යන අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණි.



AGDSL
විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

(ආ) විකුණුම් පිරිවැටුම

---------------------

(i) පූර්ව වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මුළු විකුණුම් පිරිවැටුම රු.396,150,785 කින් එනම් සියයට 10.41 ක වර්ධනයක් පෙන්නුම් කෙරෙන අතර සමාලෝචිත වර්ෂයේ දැව කඳන් වලින් සියයට 59 ක්ද, ඉරූ දැව වලින් සියයට 4.4 ක්ද, සිල්පර වලින් සියයට 4.05 ක්ද, විදුලි කණු වලින් සියයට 5.7 ක් හා ගෘහ භාණ්ඩ අලෙවියෙන් සියයට 6.8 ක් විකුණුම් පිරිවැටුම සඳහා දායකත්වය ලබා දී තිබුණි. පූර්ව වර්ෂයට සාපේක්ෂව දැව කඳන් වලින් සියයට 27 ක ඉහළ යාමක් වූ අතර මේ සඳහා තේක්ක දැව වල සාමාන්‍ය මිල ඉහළ යාම ද බලපා තිබුණි.

(ii) පූර්ව වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සිල්පර වලින් සියයට 55.19 කින් හා විදුලි කණු වලින් සියයට 30.66 කින්ද අලෙවි ආදායමෙහි දායකත්වය පහළ යාමක් පෙන්නුම් කෙරේ. පසුගිය වර්ෂ පහක දායකත්වයන් සලකා බැලීමේදී සිල්පර හා විදුලි කණු නිෂ්පාදන ජීවන චක්‍රයේ පිරිහීමක් දක්නට ලැබෙන අතර, මෙතෙක් රාජ්‍ය දැව සංස්ථාවට මෙම නිෂ්පාදන සම්බන්ධව රජයේ ඒකාධිකාරයක් තිබූ අතර මෙම නිෂ්පාදන භාවිතය ක්‍රමයෙන් අවම වන අතර විකුණුම් ආදායම අභිම්විමේ තර්ජනයක් පෙන්නුම් කෙරේ.

(ඇ) ගෘහ භාණ්ඩ අලෙවිය

-----------------------

2013 වර්ෂය සමග සැසඳීමේදී 2014 වර්ෂයේදී සියයට 20 ක අලෙවි වර්ධන අනුපාතයක් පෙන්නුම් කළද 2014 වර්ෂය හා සැසඳීමේදී 2015 වර්ෂයේදී සියයට 13 ක් දක්වා අලෙවි වර්ධන අනුපාතය පහළ යාමක් විය. ගෘහ භාණ්ඩ අලෙවිය රාජ්‍ය දැව සංස්ථාවේ ප්‍රධාන ආදායම් මාර්ගයක් ලෙස හඳුනා ගතහැකි වුවද මෙම ගෘහ භාණ්ඩ අලෙවිය සමාලෝචිත වර්ෂයේ මුළු විකුණුම් පිරිවැටුමෙන් සියයට 6 ක සුළු අගයකි. රජයේ දැව ලබා ගැනීමේ ඒකාධිකාරියක් පැවතියද නව තාක්ෂණය හා මුසුවී තරඟකාරී නිෂ්පාදන වෙළඳපලට ඉදිරිපත් නොකිරීම, තරඟකාරී නම්‍යශීලී මිල ප්‍රතිපත්තියක් අනුගමනය නොකිරීම, වෙළඳපල අධ්‍යයනයක් සිදු නොකිරීම, මුළු දිවයිනම ආවරණය වන පරිදි ප්‍රදර්ශනාගාර ව්‍යාප්තවී නොමැතිවීම, නව අලෙවි උපායමාර්ග කරා යොමු නොවීම හා වෙළඳපල අවස්ථා හඹා නොයෑම වැනි කරුණු බලපා තිබුණි.

(ඇ) 2013/2017 කාලච්ඡේදය සඳහා පිළියෙල කළ සංයුක්ත සැලැස්මට අනුකූලව 2015 වර්ෂයේදී ක්‍රියාකාරි සැලැස්මේ ඇතුලත් කළ ඉලක්කයන් ඉටුකර ගැනීම සම්බන්ධව වූ නිරීක්ෂණ පහත දැක්වේ.

(i) පහත සඳහන් ක්‍රියාකාරකම් ඉටුකර ගැනීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

* සේවකයින් සඳහා ආකල්පමය වෙනසක් සිදුකිරීමට උපදේශන සේවා වැඩසටහන් 03 ක් පැවැත්වීම.
* සේවකයින්ට හිතකර වැඩ පරිසරයක් සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම. (ව්‍යාපෘති යෝජනා)
* සේවකයින්ගේ කුසලතා සහ හැකියාවන් වර්ධනය කිරීම සඳහා වැඩසටහනක් පැවැත්වීම.
* ජාලගත ඉරූ දැව පාලන පද්ධතියක් නිර්මාණය කිරීම.
* ආයතන පරිශ්‍රයෙන් බාහිරව වෙනම සර්වර් (server) එකක් ස්ථාපනය කර නඩත්තු කිරීම.
* කල්දෙමුල්ල, බොරලන්ද, කැප්පෙටිපොල සහ බුස්ස වැඩහල් සඳහා ජාලගත තොග පාලන පද්ධතියක් නිර්මාණය කිරීම
* ජාලගත කරන ලද ලේඛන කළමනාකරණ පද්ධතියක් නිර්මාණය කිරීම.
* ජාලගත තොග කළමනාකරණ පද්ධතියක් ප්‍රධාන කාර්යාලයේ ගබඩාව සඳහා නිර්මාණය කිරීම.
* පවත්නා සියළුම නිෂ්පාදනයට සාපේක්ෂව නිෂ්පාදන ප්‍රමාණය සියයට 2 කින් වර්ධනය කිරීම.

(ii) 2015 වර්ෂයේදී ඉටු කර ගැනීමට ඉලක්ක කර තිබූ අරමුණුවලින්, වනජීවී දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර මේරූ තේක්ක ශාක ලබා ගැනීමේ ඉලක්කයෙන් සියයට 68 ක ප්‍රමාණයක්, තත්ත්වයෙන් උසස් ඉරූ දැව ආනයනය කිරීමේ ඉලක්කයෙන් සියයට 88 ක ප්‍රමාණයක් හා ජාලගත සංඛ්‍යාත්මක තොරතුරු පද්ධතියක් නිර්මාණය කිරීමේ ඉලක්කයෙන් සියයට 50 ක ප්‍රමාණයක් ඉටුකිරීමට අපොහොසත් වී තිබුණි.



AGDSL
විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

## 4.2 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

රාජ්‍ය දැව සංස්ථාවට නීත්‍යානුකූල හිමිකමක් නොමැති ඉඩම්වල රු.49,689,568 ක් වැයකර නිල නිවාස, දැව ගබඩා හා සංචාරක බංගලා ආදී ඉදිකිරීම් 12 ක් සිදුකර තිබුණි.

## 4.3 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පිරිවැය රු.12,796,781 ක් වැයකර ඉදිකරන ලද කඳපොළ සේවක නේවාසිකාගාරය ඉදිකිරීමේ අරමුණෙන් බැහැරව නිලධාරියෙකු විසින් භාවිතයට ගෙන තිබුණි. තවද නේවාසිකාගාරයේ භාවිතය සඳහා රු.491,235 ක් ගෙවා ඇඳන් 12 ක් සහ ඇඳ මෙට්ට 14 ක් මිලදී ගෙන තිබුණද එම උපකරණ කිසිදු භාවිතයකින් තොරව නිශ්කාර්යව පැවති අතර ප්‍රදේශයේ පවතින දේශගුණික තත්ත්වය නොසලකා රු.105,000 ක් වැයකර විදුලි පංකා ද සවිකර තිබුණි.

(ආ) ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයෙන් සංස්ථාව වෙත පවරා තිබූ ස්ථාවර වත්කම් යටතේ ගිණුම් ගත නොකළ භාවිතයට නොගන්නා යන්ත්‍ර දෙකක් අම්පාර දැව ඉරුම්හලෙහි තිබූ අතර මෙම යන්ත්‍ර අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

## 4.4 හඳුනාගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේදී රු.698,124 ක් වැය කර මිලදී ගන්නා ලද කාබයිට් තල 256 කින් තල 100 ක් නියමිත ප්‍රමිතියෙන් තොරවීම නිසා මිලදීගත් ආයතනය වෙත ආපසු යවා තිබූ අතර ඉන් රු. 149,078 ක් වටිනා තල 78 ක් 2016 අප්‍රේල් 30 දින වනවිටත් සංස්ථාව වෙත නැවත ලැබී නොතිබුණි.

(ආ) සැලසුම් අනුමත කරවා ගැනීමකින් තොරව නුවරඑළිය සේවක නිල නිවාසය ඉදිකිරීම නිසා අනවසර ඉදිකිරීම් ගාස්තු ලෙස රු. 44,889 ක අධිභාර මුදලක් නුවරඑළිය මහ නගර සභාවට ගෙවා තිබුණි.

(ඈ) නිලධාරියෙක් වෙත නියමිත කාලය තුළ පාරිතෝෂික මුදල් නොගෙවීම හේතුවෙන් සංස්ථාව විසින් රු.54,570 ක අධිභාර ගෙවා තිබුණි.

## 4.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පහත සදහන් නිරීක්ෂණ කරනු ලැබේ.

### (අ) දැල දැව ගබඩාවෙහි ඉදි කිරීම

(i) සමාලෝචිත වර්ෂයේ දී ජල ටැංකිය ඉදිකිරීම සහ නිල නිවසට පිවිසෙන මාර්ගය කොන්ක්‍රීට් කිරීම සදහා පිළිවෙලින් රු.194,100 ක් සහ රු. 33,120 ක් වටිනා භාණ්ඩ මිලදී ගෙන තිබුණද 2016 අප්‍රේල් 30 දින වන විටත් එම කටයුතු සිදුකර නොතිබුණි.

(ii) සේවක නිල නිවාසය සහ මායිම් තාප්පය ඉදිකිරීමේදී එයට අදාල අමුද්‍රව්‍යයන් සංස්ථාව මගින් සැපයීමටත් කම්කරු කුලිය මැන ගෙවීමේ (Measure & Pay) පදනම මත ලබා ගැනීමටත් තීරණය කර තිබුණි. එහෙත් ද්‍රව්‍ය සහ ශ්‍රමය සඳහා ඇස්තමේන්තු වෙන්කර පිළියෙල නොකිරීම නිසා ඉදිකිරීම්වලදී මිලදී ගත් අමුද්‍රව්‍ය සත්‍ය වශයෙන්ම අවශ්‍ය ප්‍රමාණය සඳහා පමණක් ලබාගත්තේද යන්න තහවුරු කරගත නොහැකි විය.

(iii) සේවක නිල නිවාසයේ ඉදිකිරීම සඳහා නිවැරදි ඇස්තමේන්තු සකස් නොකිරීම නිසා රු.696,863 ක අධි ඇස්තමේන්තුවක් හා රු.72,031ක ඌන ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබුණි.

### (ආ) අම්පාර සේවක නිල නිවාස ඉදිකිරීම (A සහ B)

ඉදිකිරීම් පිරිවැය රු.33,880,099 ක් වූ සේවක නිල නිවාස භෞතික පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

උපදේශන සේවා ආයතනයේ දුර්වල සැලසුම් හා අධීක්ෂණය නිසා නිවාසවල පිටුපස සැලසුම් කර ඇති (Out DoorKitchen ) දොර සවි කර ඇත්තේ එළියට ඇරෙන ආකාරයට වීම හා යකඩ වල්ග සරනේරුවලින් සවිකර තිබීම නිසා නිවාසයන් අනාරක්ෂිත වීම, බැල්කනිවල රැඳෙන ජලය ඉවතට ගලා යාම සඳහා ක්‍රමවේදයක් සකස්කර නොතිබීම, කාණු පද්ධතිය නිසි බෑස්මකින් යුක්තව ඉදිකර නොතිබීම නිසා





ජලය රැඳීම, කාණු පද්ධතිය ආවරණය අනාරක්ෂිත ආකාරයෙන් යොදා තිබීම, සංකීර්ණය ඉදිරිපස අල්ලා ඇති ඉන්ටලොග් ගල් නිසි ප්‍රමිතියට සකස් කර නොතිබීම, පසුපස කොටසෙහි කාණු පද්ධතියේ බැම් පොළොව මට්ටමට ඉහළින් වීම යන දුර්වලතා නිරීක්ෂණය විය.

### (ඇ) නුවරඑළිය සේවක නිල නිවාසයෙහි බිම්මහල සහ පළමු මහල ඉදිකිරීම

පහත සඳහන් නිරීක්ෂණ සිදු කෙරේ.

(i) උපදේශන ආයතනය විසින් තෝරා ගන්නා ලද කොන්ත්‍රාත්කරු පිළිබඳව ප්‍රමාණවත් කාරක ප්‍රාග්ධන අවශ්‍යතාව, බැංකු පහසුකම් සහ පෙර සිදු කරන ලද ඒ හා සමාන කාර්යයන් පිළිබඳ තෘප්තිමත් නොවන බවට සඳහන් කර තිබියදීත් මෙම කොන්ත්‍රාත්තුව පිරිනැමීමේදී ප්‍රසම්පාදන කමිටුව විසින් ඒ පිළිබඳව අවධානය යොමු නොකර එම කොන්ත්‍රාත්කරු වෙත ඉදිකිරීම් කටයුතු භාරදී තිබුණි.

(ii) උපදේශන ආයතනයට ගෙවීම් සිදු කිරීමේදී ඉංජිනේරු ඇස්තමේන්තුව පදනම් කරගෙන රු. 237,808 ක් ගෙවීම් කර තිබුණි.

### (ඈ) රාජ්‍ය දැව සංස්ථාවට අයත් නුවරඑළිය සේවක නිල නිවාසයෙහි දෙවන මහලේ ඉදිකිරීම

සංස්ථාවේ දැව යොදාගෙන නිම කල හැකිව තිබූ නේවාසිකාගාරයෙහි සිවිලිම සඳහා වර්ග මීටර් 128.48 සඳහා රු. 513,920 ක මුදලක් වැයකර ප්ලාස්ටික් වර්ගයකින් නිම කර තිබුණි. එමෙන්ම දැව යොදා ගත හැකි බොහෝ ස්ථානවල ඇලුමිනියම් යකඩ බාර් යොදා ගෙන ඉදිකිරීම් සිදු කර තිබුණි.

(ඉ) නුවරඑළිය සේවක නිල නිවසේ පැති බැම්ම ඉදිකිරීමේ කටයුතු ටෙන්ඩර් කැඳවීමකින් තොරව රු. 682,734 කට පුද්ගලික ආයතනයක් මගින් සිදු කරවා ගෙන තිබුණි.

## 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

සංස්ථාවේ 2015 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) මධ්‍යම මට්ටමේ කළමනාකරණයේ අනුමත තනතුරු සංඛ්‍යාව 64 ක් වන අතර සේවයේ නියුතු සංඛ්‍යාව 62කි. සමස්ථයක් ලෙස පුරප්පාඩු 02 ක් වුවද ඒ තුල නියෝජ්‍ය කළමනාකරුවන් හත් දෙනෙකුගේ අතිරික්තයන් අනියුක්ත නිලධාරීන්ගේ පුරප්පාඩුවලින් ආවරණය වී තිබුණි.

(ආ) මධ්‍යම කළමනාකරණයේ තනතුරු අතරින් ප්‍රාදේශීය කළමනාකරු, නියෝජ්‍ය කළමනාකරු (මූල්‍ය), (නීති හා පරිපාලන), ඉංජිනේරු සහ පද්ධති විශ්ලේෂක තනතුරුවල අතිරික්ත සේවක සංඛ්‍යාව 7 ක් ද, පහළ කළමනාකරණයට අයත් පිරිවැය නිලධාරි, ඉංජිනේරු සහායක (සිවිල්), විමර්ශන නිලධාරී වැනි තනතුරුවල අනුමත සේවක සංඛ්‍යාවට වඩා අතිරික්ත සේවක සංඛ්‍යාව 45 ක් සහ කළමනාකරණ සහකාර (අර්ධ ශිල්පීය) තනතුරුවල අතිරික්ත සේවක සංඛ්‍යාව 59 ක් විය.

(ඇ) සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩලය සලකා බැලීමේදී ආයතනයේ අරමුණු සහ උපාය මාර්ග ලඟාකර ගැනීමේ අපේක්ෂාවෙන් අනුමත කරන ලද කාර්ය මණ්ඩලය නිසි පරිදි බඳවා ගෙන නොතිබුණි.

(ඈ) නිලධාරියෙකුගේ විෂමාචාර ක්‍රියාවක් සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් පැවැත්වීමෙන් පසුව ඔහුගෙන් රු.64,329 ක් අයකරන ලෙසත් ඔහු දැනට සේවයේ නියුක්ත ස්ථානයෙන් මාරු කරන ලෙසත් නිර්දේශයන් ලැබී තිබියදී එම නිලධාරියා සම්මුඛ පරීක්ෂණයකට කැඳවා කළමනාකාර (ප්‍රදර්ශන) තනතුරට උසස් කර ඔහු සේවය කරන ලද සේවා ස්ථානයටම පත්කර තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 ප්‍රසම්පාදන සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන සැලසුමෙහි ඇතුළත්ව නොතිබූ රු. 979,673 ක් වටිනා ප්‍රාග්ධන ස්වරූපයේ භාණ්ඩ 26 ක් හා සැලසුම්ගත ප්‍රමාණය ඉක්මවා රු.1,489,110 ක් වටිනා අයිතමයන් 12 ක් මිලදී ගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුලදී ප්‍රාග්ධන අයිතමයන් 522 ක් මිලදී ගැනීමට සැලසුම්කර තිබුණද අයිතමයන් 92 ක් පමණක් මිලදී ගෙන තිබුණි.



AGDSL
විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

(ඇ) ඩොට් මෙට්රික්ස් ප්‍රින්ටර් (Dot metrix printer) හා ලේසර් ප්‍රින්ටර් (Laser printer ) මිලදී ගැනීම සඳහා පිළිවෙලින් රු.990,000 ක් සහ රු.2,161,000 අයවැයගතව තිබුණද, එය ප්‍රසම්පාදන සැලසුම අනුව පිළිවෙලින් රු.1,890,000 ක් හා රු.1,286,000 වීමෙන් අයවැයගත සහ ප්‍රසම්පාදන සැලසුම් අතර වෙනස්කම් නිරීක්ෂණය විය.

(ඈ) ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබුණද එය තාත්ත්වික ලෙස පිළියෙලකර නොතිබීම හේතුවෙන් වෙනස්කම් නිරීක්ෂණය වූ අතර ප්‍රසම්පාදන සැලැස්ම ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

### 5.3 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සියයට 20 සිට සියයට 738 දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොමැති බව නිරීක්ෂණය විය.

### 5.4 ආයතනයේ ක්‍රියාකාරීත්වය නිසා පරිසරයට සිදුවන අහිතකර බලපෑම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ආයතනයේ ක්‍රියාකාරිත්වය සඳහා පූර්ණ වශයෙන් හෙළිම් කරන ලද වැඩබිම් ප්‍රමාණය හෙක්ටයාර් 605.8ක් (අක්කර1505.0) වන අතර, නව වන වගා ආවරණය සඳහා 2013 වර්ෂයේ සිට ලබා දී ඇති දායකත්වය හෙක්ටයාර් 68 ක් (අක්කර 169) වේ. පූර්ණ හෙළිම් සමග සැසඳීමේදී නව වන වගා ආවරණය සඳහා දක්වා ඇති දායකත්වය ඉතා අවම මට්ටමක විය. තවද, ආයතනයේ ක්‍රියාකාරිත්වය ශාක මත රඳා පවතින අතර නිෂ්පාදන සඳහා වන වගා තුනී කිරීමේදී නොමේරූ ශාක විනාශ වීම හා සත්ව කොටස්වලට හානි වීම බොහෝවිට සිදුවී තිබුණි.

(ආ) සංස්ථාවේ නිෂ්පාදන ලෙස දැව කඳන්, ඉරූ දැව, සිල්පර, විදුලි කණු, අලිවැට කණුවට කණු සහ ගෘහ භාණ්ඩ දැක්විය හැක. සිල්පර රජයේ දුම්රිය දෙපාර්තමේන්තුව වෙතද, විදුලි කණු ලංකා විදුලි බල මණ්ඩලයට ද, අලි වැට කණු වන ජීවී දෙපාර්තමේන්තුවට ද සහනදායි ණය කාල සීමාවන් යටතේ ලබා දෙනු ලැබේ. ගෘහ භාණ්ඩ සැපයීමේදී රාජ්‍ය සේවකයන් පමණක් අරමුණු කර ගත් ප්‍රසාද අභිමානී ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක වන අතර, පෞද්ගලික අංශයේ සේවකයන් අරමුණු කර නොගැනීම, සාමාන්‍ය ජනතාවට සහනදායි ක්‍රමයක් මත ගෘහ භාණ්ඩ ලබා නොදීම හා තරඟකාරී ආයතනවලට සාපේක්ෂව ගෘහ භාණ්ඩ මිල ගණන් ඉතා ඉහළ මිලකින් යුක්ත වීම නිසා ජනතාවට ලබා දෙන සේවය පිළිබඳ සෑහීමකට පත්විය නොහැකි විය.

## 5.6 නොවිසඳී ඇති විගණන ඡේද

-------------------------------

බංගලාවත්ත වැපල්ටන් වාණිජ තුනී කිරීම් බිම් කට්ටියේ අනවසර ගස් හෙලීම් සිදුකිරීමට එරෙහිව කොන්ත්‍රාත්කරු සහ සංස්ථා නිලධාරීන් සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියා මාර්ග ගන්නා බව සංස්ථාවේ සභාපතිවරයා 2013 ජූනි 28 දින දන්වා සිටියද 2016 මැයි 20 දින වන විටත් මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ණයගැති හා ණයහිමි පාලනය | අයවිය යුතු ණය ශේෂයන් නියමිත කාල සීමාව තුලදී අයකර ගැනීමට කටයුතු නොකිරීම, බාහිර පාර්ශවයන් වෙත ගෙවිය යුතු ස්කන්ධ භාග ගෙවීමට කටයුතු නොකිරීම සහ විවිධ තැන්පතු කාලසීමාව ඉක්මවා ගොස් ඇති විට ආපසු ගෙවීමට කටයුතු නොකිරීම. |
| (ආ) | අයවැය ලේඛනමය පාලනය | ආයතනයේ කළමනාකරණ පාලන කාරකයක් ලෙස අයවැය යොදා නොගැනීම හා නිවැරදි ඇස්තමේන්තු සකස් නොකිරීම. |
| (ඇ) | ස්ථාවර වත්කම් පාලනය | ස්ථාවර වත්කම්වල අයිතිය තහවුරු කර නොගැනීම සහ වත්කම් නිසි පරිදි ප්‍රයෝජනයට නොගැනීම. |
| (ඈ) | ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයේ උපදෙස්වලට අනුව කටයුතු නොකිරීම, කොන්ත්‍රාත් පරිපාලනයේදී උපදේශක සේවා ආයතනවලින් නියමිත සේවාවන් නිසි පරිදි ලබා නොගැනීම සහ එවැනි අවස්ථාවලදී සුදුසු ක්‍රියාමාර්ගයන් අනුගමනය කර කොන්ත්‍රාත් නිසි පරිදි කරවා නොගැනීම |
| (ඉ) | කාර්ය මණ්ඩල පරිපාලනය | ආයතන නීති රීති හා රෙගුලාසි ප්‍රකාරව බඳවා ගැනීම් සහ උසස් කිරීම් සිදු නොකිරීම. |

එච්. එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති



# වාර්ෂික ගිණුම්

*2015 දෙසැම්බර් 31 දිනෙන්*
*අවසන් වර්ෂය සඳහා*

# විස්තීරණ ආදායම් ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන් | 2015 රු. | 2014 රු. |
|---|---|---|---|
| පිරිවැටුම | 2 | 3,836,191,364 | 3,473,847,448 |
| විකුණුම් පිරිවැය | 3 | (2,079,076,399) | (2,020,396,537) |
| **මෙහෙයුම් මත දළ ලාභය** | | **1,757,114,965** | **1,453,450,911** |
| වෙනත් ආදායම් | 6 | | |
| මෙහෙයම් | 6.2 | 72,879,875 | 59,808,848 |
| මෙහෙයුම් නොවන | 6.1 | 222,980,543 | 222,826,052 |
| **මුළු ශුද්ධ ආදායම** | | **2,052,975,383** | **1,736,085,811** |
| විකුණුම් හා බෙදාහැරීමේ වියදම් | 4 | (578,170,820) | (567,950,153) |
| පරිපාලන වියදම් | 5 | (706,105,228) | (740,913,217) |
| **භාණ්ඩාගාර බදු වලට පෙර ශුද්ධ ලාභය** | | **768,699,335** | **427,222,442** |
| භාණ්ඩාගාරයට ගෙවූ බදු | | (50,000,000) | (25,000,000) |
| **භාණ්ඩාගාර බදුවලට පසු ලාභය** | | **718,699,335** | **402,222,442** |
| වර්ෂය සඳහා ආදායම් බදු | 7 | (348,808,858) | (196,224,578) |
| **ආදායම් බදු වලට පසු ලාභය** | | **369,890,477** | **205,997,864** |
| වෙනත් විස්තීරණ ආදායම් | | - | - |
| **වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම** | | **369,890,477** | **205,997,864** |

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනට | සටහන් | 2015 රු. | 2014 රු. |
|---|---|---|---|
| වත්කම් | | | |
| ජංගම නොවන වත්කම් | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 8 | 1,022,918,340 | 905,640,314 |
| අස්පෘශ්‍ය වත්කම් | 9 | 1,676,332 | 1,634,835 |
| ජීව විද්‍යාත්මක වත්කම් | 10 | 5,317,379 | 4,836,929 |
| භාණ්ඩාගාර තැන්පත් | | 2,966,000 | 2,966,000 |
| සේවක ඇප තැන්පත් | | 55,275,308 | 48,717,776 |
| ආයෝජන | 11.1 | 523,099,646 | 491,211,954 |
| පෙර ගෙවුම් සේවක ප්‍රතිලාභ | | 34,491,982 | 43,149,305 |
| විලම්භිත බදු වත්කම් | 7.2 | - | 41,757,543 |
| කෙරිගෙන යන ප්‍රාග්ධන වැඩ | | 97,834,789 | 114,993,567 |
| මුළු ජංගම නොවන වත්කම් | | 1,743,579,776 | 1,654,908,223 |
| ජංගම වත්කම් | | | |
| වෙළඳ තොග | 12 | 1,051,179,907 | 1,068,260,904 |
| වෙළඳ සහ වෙනත් ණයගැතියෝ | 13 | 725,589,567 | 1,050,972,162 |
| ස්ථිර තැන්පතුවල ආයෝජන | 11.2 | 1,977,265,939 | 1,574,321,125 |
| මුදල් හා බැංකු ශේෂය | 14 | 361,223,645 | 311,305,958 |
| මුළු ජංගම වත්කම් | | 4,115,259,058 | 4,004,860,150 |
| **මුළු වත්කම්** | | **5,858,838,835** | **5,659,768,372** |
| ස්කන්ධය හා බැරකම් | | | |
| ස්කන්ධය හා සංචිත | | | |
| අනුමත ප්‍රාග්ධනය | | 75,000,000 | 75,000,000 |
| දායක ප්‍රාග්ධනය | 15 | 41,503,668 | 41,503,668 |
| අයභාර සංචිත | | 3,674,865,183 | 3,311,070,808 |
| | | 3,716,368,851 | 3,352,574,476 |
| සේවක ණය චක්‍රීය අරමුදල | 16 | 236,650,441 | 230,554,340 |
| මුළු ස්කන්ධය | | 3,953,019,293 | 3,583,128,816 |
| ජංගම නොවන බැරකම් | | | |
| විශ්‍රාම පාරිතෝෂික අරමුදල | 17 | 366,887,129 | 435,931,143 |
| සේවක ඇප තැන්පත් | | 55,275,308 | 48,717,776 |
| විලම්භිත බදු වගකීම | 7.2 | 2,691,425 | - |
| මුළු ජංගම නොවන බැරකම් | | 424,853,862 | 484,648,919 |
| ජංගම බැරකම් | | | |
| ආදායම් බදු | 18 | 291,486,919 | 232,193,834 |
| ණයහිමියෝ සහ උපචිත වියදම් | 19 | 1,189,478,761 | 1,359,796,803 |
| මුළු ජංගම බැරකම් | | 1,480,965,680 | 1,591,990,637 |
| මුළු බැරකම් | | 1,905,819,542 | 2,076,639,556 |
| **මුළු ස්කන්ධය හා බැරකම්** | | **5,858,838,835** | **5,659,768,372** |

රාජ්‍ය දැව සංස්ථාවේ ක්‍රියාකාරකම් සම්බන්ධ මෙම ප්‍රකාශනය 1971 අංක 38 දරණ මුදල් පනතේ විධි විධාන වලට අනුකූලව ඉදිරිපත් කරනු ලැබේ.

**සාමාන්‍යාධිකාරී**
රාජ්‍ය දැව සංස්ථාව

පිටු අංක 101 සිට 107 දක්වා වන ගිණුම් ප්‍රතිපත්ති සහ පිටු අංක 108 සිට 117 දක්වා වන ගිණුම් සටහන් මෙම ගිණුම් ප්‍රකාශන වල කොටසකි. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් තබන ලදී.

**සභාපති** **අධ්‍යක්ෂක**

රාජ්‍ය දැව සංස්ථාව.
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්.

දිනට:- 2016.06.21



## ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශනය

| | දායක ප්‍රාග්ධනය (රු.) | සේවක ණය චක්‍රිය අරමුදල (රු.) | රඳවාගත් ලාභ (රු.) | එකතුව (රු.) |
|---|---|---|---|---|
| **2014 ජනවාරි 01 වන දිනට ශේෂය** | **41,503,668** | **225,543,133** | **3,110,175,859** | **3,377,222,660** |
| වර්ෂය තුල කරන ලද ගැලපුම් | - | (91,708) | - | (91,708) |
| වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම | - | - | 205,997,864 | 205,997,864 |
| වර්ෂය සඳහා සේවක ණය පොළිය | - | 5,102,915 | (5,102,915) | - |
| **2015 ජනවාරි 01 දිනට ශේෂය** | **41,503,668** | **230,554,340** | **3,311,070,808** | **3,583,128,816** |
| වර්ෂය තුල කරන ලද ගැලපුම් | - | - | - | - |
| වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම | - | - | 369,890,477 | 369,890,477 |
| වර්ෂය සඳහා සේවක ණය පොළිය | - | 6,096,101 | (6,096,101) | - |
| **2015 දෙසැම්බර් 31 වන දිනට ශේෂය** | **41,503,668** | **236,650,441** | **3,674,865,183** | **3,953,019,293** |

## මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2015 | 2014 |
|---|---|---|
| | රු. | රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | |
| ගනුදෙනුකරුවන්ගෙන් ලැබුණු මුදල් | 4,170,532,250 | 3,114,095,334 |
| සැපයුම්කරුවන්ට හා සේවකයින්ට ගෙවූ මුදල් | (3,382,894,088) | (2,679,852,677) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් | 787,638,162 | 434,242,657 |
| ආදායම් බදු | (245,066,805) | (60,973,270) |
| භාණ්ඩාගාරයට ගෙවූ විශේෂ බදු | (50,000,000) | (25,000,000) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | 492,571,357 | 348,269,387 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | |
| ස්ථාවර වත්කම් මිලදීගැනීම් | (244,929,234) | (113,479,867) |
| ජීව විද්‍යාත්මක වත්කම් සංවර්ධනය | (480,450) | (1,652,039) |
| ආයෝජන | (434,832,507) | (294,956,339) |
| ආයෝජන වලින් ලද ආදායම | 206,687,772 | 353,965,156 |
| වත්කම් විකිණීමෙන් ලද මුදල් | 7,645,869 | 6,843,786 |
| කෙරීගෙන යනවැඩ | 17,158,778 | (63,389,977) |
| සේවක ණය වක්‍රීය අරමුදල | 6,096,101 | 5,011,207 |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | (442,653,671) | (107,658,075) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | - | - |
| මුදල් හා මුදල් සමාන වත්කම් වල ශුද්ධ අගය වැඩිවීම | 49,917,687 | 240,611,311 |
| වර්ෂය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන වත්කම් - සටහන 14 | 311,305,958 | 70,694,647 |
| **වර්ෂය අවසානයේ දී මුදල් හා මුදල් සමාන වත්කම් - සටහන 14** | **361,223,645** | **311,305,958** |



# රාජ්‍ය දැව සංස්ථාව - ගිණුම් සඳහා සටහන්

**2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

## 01. වාර්තාකරණ ආයතනය

### 1.1 සංස්ථාපනය

1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ, 1968, අප්‍රේල් මාසයේ දී රාජ්‍ය දැව සංස්ථාව සංස්ථාවක් ලෙස ස්ථාපනය කරන ලදි.

**1.1.1 මූල්‍ය ප්‍රකාශන සඳහා අනුමැතිය ලද දිනය**

2016, ජුනි මස 21 වන දින අධ්‍යක්ෂ මණ්ඩලයේ දී සම්මත කරගන්නා ලද අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවට අනුකූලව 2015 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට අනුමැතිය ලබා දී ඇත.

**1.1.2. මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම.**

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ හා නිකුත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුය.

**1.1.3 සේවක සංඛ්‍යාව.**

2015 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ සේවක සංඛ්‍යාව 2,145 කි. (2014 වර්ෂයේ 2,186 කි)

### 1.2 ඉදිරිපත් කිරීමේ පදනම

**1.2.1. අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශය**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය මගින් ප්‍රකාශ කරන ලද නිර්දේශිත රීතීන් වලට හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ලංකා ගිණුම්කරණ ප්‍රමිත සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත) වලට අනුකූලව සංස්ථාවේ 2015 දෙසැම්බර් 31 දිනට හා එම කාලපරිච්ඡේදයෙන් අවසන් වසර සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සමග ගිණුම් සඳහා සටහන් පිළියෙල කර ඇත.

**1.2.2 අගය කිරීමේ පදනම**

ලැබිය යුතු සේවක ණය සහ වෙළඳ ණයගැතියන් සාධාරණ අගයට ගිණුම්වල පෙන්වා ඇති අතර, ඒ හැර අනෙකුත් අගයන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත්තේ ඓතිහාසික පිරිවැය පදනම් කරගෙනය.

**1.2.3 භාවිතා වන හා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන මුදල් ඒකකය**

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර, එය සංස්ථාවේ ගනුදෙනු කරන මුදල් ඒකකය වේ. විශේෂයෙන් සඳහන් කොට නොමැති නම්, සියලුම මූල්‍ය තොරතුරු ආසන්නතම රුපියල දක්වා වටයා ඉදිරිපත් කර ඇත.

**1.2.4 ඇස්තමේන්තු හා නිගමන**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකාරිත්වයට නොයෙකුත් ඇස්තමේන්තු, නිගමන හා උපකල්පන පදනම් කරගැනීමට සිදුවන අතර, ඒවා ගිණුම්කරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී හා වාර්තා කරන වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම්වල අගයන් කෙරෙහි බලපෑම් ඇති කරවයි. ඇස්තමේන්තු සහ මූලික උපකල්පන අතීත අත්දැකීම් සහ යම් අවස්ථාවන් යටතේ සාධාරණයැයි විශ්වාස කරන විවිධ වෙනත් කරුණු මත පදනම් වී ඇත. සත්‍ය ප්‍රතිඵලය, ඇස්තමේන්තු නිගමනයන් හා තීරණවලට වඩා වෙනස් විය හැකිය. ඇස්තමේන්තු හා උපකල්පන නිරතුරුවම සමාලෝචනය කරනු ලැබේ. සංශෝධනය කරනු ලබන ගණකාධිකරණ ඇස්තමේන්තු එම ඇස්තමේන්තු සංශෝධනය කරන ලද කාලපරිච්ඡේදයට හා ඒවා බලපානු ලබන ඉදිරි කාලපරිච්ඡේද සඳහා ගලපනු ලැබේ.

**1.2.5 විදේශ විනිමය ගනුදෙනු**

විදේශ විනිමය ගනුදෙනු ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරනුයේ

ගනුදෙනු සිදුවූ දිනට පැවති විනිමය වටිනාකම අනුව වේ.

### 1.2.6 බදුකරණය

ගිණුම් ප්‍රකාශවල වාර්තා වන ආදායම් සහ වියදම් පදනම් කරගෙන 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන සහ පසුකාලීන සංශෝධන වලට අනුකූලව ගණනය කිරීමෙන් පසුව ආදායම් බදු සඳහා වෙන්කිරීම් කර ඇත.

## 1.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති අදාල ගිණුම් කාලපරිච්ඡේදය තුලදී අඛණ්ඩව භාවිතා කොට ඇත.

### 1.3.1 වත්කම් සහ වටිනාකම ගණනය කිරීම

### 1.3.1.1 දේපල පිරියත හා උපකරණ

1.3.1.1.1 හඳුනාගැනීමේ පදනම

දේපල, පිරියත හා උපකරණ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානිවූ වටිනාකම අඩුකර අගය කර ඇත. (ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් සාධාරණ අගය මත) වත්කම මිලදී ගැනීමේදී එය සෘජුව ආරෝපිත වියදම් දේපල, පිරියත හා උපකරණ පිරිවැයට ඇතුළත්වේ. දේපල, පිරියත හා උපකරණවල වෙනස් කොටස්වල විවිධ ඵලදායී ජීවකාල ඇත්නම් ඒවා දේපල, පිරියත හා උපකරණවල වෙනම අයිතම ලෙස ගිණුම්ගත කරයි. සියලු දේපල, පිරියත හා උපකරණ පළමුව පිරිවැයට හඳුනාගනී. ඉඩම් හා ගොඩනැගිලිවල සාධාරණ අගය සහ ඉදිරියට ගෙනඑන ලද අගය අතර සැලකියයුතු වෙනසක් ඇත්නම් ඒවා වෘත්තිය සුදුසුකම්ලත් තක්සේරුකරුවන් විසින් ප්‍රත්‍යාගණනය කරනු ලබයි. දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කරන විට මුළු වත්කම් පන්තියම ප්‍රත්‍යාගණනය කරනු ලැබේ. ප්‍රත්‍යාගණනයෙන් වැඩිවන වත්කම්වල ඉදිරියට ගෙනඑන ලද වටිනාකම ප්‍රත්‍යාගණන සංචිත ගිණුමට බැර කරනු ලැබේ.

වත්කම් ප්‍රත්‍යාගණනය නිසා උද්ගත වන වටිනාකම් අඩුවීම් එම වත්කමේ පෙර අවස්ථාවකදී කරන ලද වත්කම් ප්‍රත්‍යාගණනය නිසා උද්ගත වූ වටිනාකම් වැඩිවීම ඇතුළත් ප්‍රත්‍යාගණන සංචිතයට හිලව්කරනු ලැබේ. අනෙක් සෑම වටිනාකම් අඩුවීමක් ම විස්තීරණ ආදායම් ප්‍රකාශනයට ගැලපීම් කරනු ලැබේ.

1.3.1.1.2 වත්කම් විකිණීමෙන් ඇති වූ ලාභ/අලාභ

වත්කම් විකිණීමෙන් ඇති වන ලාභයක් හෝ අලාභයක් (ශුද්ධ විකිණීමේදී ලැබීම් හා වත්කමේ ධාරණ වටිනාකමේ වෙනස ලෙස ගණනය කරන ලද) වත්කම විකුණනු ලබන වර්ෂයේ ආදායම් ප්‍රකාශනයේ වෙනත් මෙහෙයුම් ආදායම්/වියදම් යටතේ දක්වනු ලබයි.

1.3.1.1.3 පසු පිරිවැය

ස්ථාවර ස්වභාවයෙන් ව්‍යාපාරය පවත්ගෙන යාමට හෝ ව්‍යාපාරයේ ඉපැයුම් ධාරිතාව වර්ධනය කිරීම සඳහා වත්කම් පවරාගැනීම, දීර්ඝ කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා වැයවන පසු වියදම්, ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලබන අතර, එවැනි වියදම් වත්කමේ ඉදිරියට ගෙනයනු ලබන වටිනාකමෙන් හඳුනාගැනේ. එමෙන්ම දේපල හා උපකරණවල එදිනෙදා නඩත්තු පිරිවැය ආදායම් ප්‍රකාශනයෙන් යෙදවූ වටිනාකම් ලෙස හඳුනාගැනේ.

1.3.1.1.4 ඉවත් කිරීම්

දේපල, පිරියත හා උපකරණ ඉවත් කිරීමේදී හෝ ඒවා පාවිච්චි කිරීම තුළින් ඉදිරි ප්‍රතිලාභයක් අත්නොවන විට ඒවායේ ඉදිරියට ගෙනඑන ලද වටිනාකම ගිණුම් වලින් ඉවත් කරනු ලැබේ. මෙසේ වත්කම් ඉවත් කිරීමේදී උද්ගත වන ලාභ හෝ පාඩු විස්තීරණ ආදායම් ප්‍රකාශනයට ගලපනු ලබන අතර, ලාභ ආදායමක් ලෙස සලකනු නොලැබේ.

1.3.1.1.5 ක්ෂයවීම

දේපළ, පිරියත හා උපකරණවල සියලුම අංගයන් එහි ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය පුරා සරල රේඛීය පදනම මත විස්තීරණ ආදායම් ප්‍රකාශනයට කපාහරිනු ලබයි. ඉඩම් ක්ෂය නොකරනු ලබන අතර, අදාල ක්ෂය කිරීම් අනුපාත පහත පරිදි වේ.

| | |
|---|---|
| ස්ථිර ගොඩනැගිලි | 2.5% |
| අර්ධ ස්ථිර ගොඩනැගිලි | 30% |
| යන්ත්‍රෝපකරණ | 10% |
| වාහන | 20% |
| මාර්ග හා දුම්රිය මාර්ග | 5% |
| බදු ඉඩම් | 5% |
| මාර්ග ඉදිකිරීම් | 10% |
| ගෘහභාණ්ඩ හා සවිකිරීම් | 15% |
| කාර්යාල උපකරණ | 15% |
| විවිධ වත්කම් | 20% |
| පරිගණක | 20% |
| විදුලි උපකරණ | 10% |
| මෙවලම් හා උපකරණ | 20% |
| ඉඩම් සංවර්ධන | 10% |

### 1.3.1.2 නොනිමි වැඩ

ගිණුම් වර්ෂය තුලදී සම්පූර්ණ කරගත නොහැකි වූ ප්‍රාග්ධන ආයෝජනවලට අදාල ප්‍රාග්ධන වියදම් අදාල වර්ෂයේ නොනිමි වැඩ යටතේ දක්වා ඇති අතර, වැඩ සම්පූර්ණ වී පරිහරණයට සුදුසු තත්වයට පැමිණි පසු ඒවා දේපල පිරියත හා උපකරණ යටතේ දක්වනු ලැබේ.

### 1.3.1.3 අස්පෘෂ්‍ය වත්කම්

අස්පෘෂ්‍ය වත්කම්වලට පරිඝනක මෘදුකාංග මිලදිගැනීම සඳහා වැය වූ පිරිවැය ඇතුලත් වේ. එමෙන්ම මෙවැනි අස්පෘෂ්‍ය වත්කම් හඳුනාගනු ලබන්නේ එහි පිරිවැය විශ්වාසදායි ලෙස මැනිය හැකිනම් සහ එහි අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ සංස්ථාව වෙත ලැබීමේ ප්‍රවණතාවයක් පවතී නම් පමණි. අස්පෘෂ්‍ය වත්කම් පිරිවැයෙන්, සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානි වූ වටිනාකම් අඩුකර වටිනාකම අගය කර ඇත. විශේෂිත වත්කමකට අදාලව පසුව දරනු ලබන වියදම් ප්‍රාග්ධනිත කරනු ලබන්නේ එම වියදම් දැරීම හේතුවෙන් අදාල වත්කමෙහි අනාගත ආර්ථික ප්‍රතිලාභ වර්ධනයට එය පිටුවහලක් වන්නේ නම් පමණි. ක්‍රමක්ෂය සරල රේඛීය පදනම මත ඇස්තමේන්තු ගත පස් අවුරුදු ජීව කාලය පුරා කපාහරිනු ලබයි.

### 1.3.1.4 ජීව විද්‍යාත්මක වත්කම්

''ජීව විද්‍යාත්මක වත්කම්'' පරිණත ජීව විද්‍යාත්මක වත්කම් සහ අපරිණත ජීව විද්‍යාත්මක වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත. පරිණත ජීව විද්‍යාත්මක වත්කම් ගණයට අයත් වන්නේ ඵලදාව නෙලාගන්නා මට්ටමට පත්ව ඇති හෝ නිරන්තර ඵලදාව ලැබෙන තත්වයට පත්ව ඇති අයිතමයන් ය. අපරිණත ජීව විද්‍යාත්මක වත්කම් ලෙස සැලකෙන්නේ ඵලදාව නෙලාගන්නා තත්වයට පත් නොවූ අයිතමයන්ය.

ජීව විද්‍යාත්මක වත්කම් ඵලදරන ජීව විද්‍යාත්මක වත්කම් සහ පරිභෝජනමය ජීව විද්‍යාත්මක වත්කම් ලෙස වර්ගීකරණය කෙරෙන අතර ඵලදරන ජීව විද්‍යාත්මක වත්කම් විකිණීම සඳහා හෝ නෙලාගැනීම සඳහා තබා නොගන්නා ඒවා වන අතර, එම අයිතමයන් කෘෂිකාර්මික නිෂ්පාදනයන් ලබාගැනීමේ පරමාර්ථයෙන් සංවර්ධනය කරනු ලැබේ. පරිභෝජනයම ජීව විද්‍යාත්මක වත්කම් ගණයට දැව ලබාගැනීමට පාලනය කරනු ලබන ගස් මෙන්ම ජීව විද්‍යාත්මක වත්කම් වලින් ඵලදාව නෙලාගන්නා ලද කෘෂිකාර්මික නිෂ්පාදන මෙන්ම ජීව විද්‍යාත්මක වත්කම් වශයෙන් විකුණනු ලබන අයිතමයන් අයත්වේ. අතීත සිද්ධියක ප්‍රතිඵලයක් සේ ආයතනය ඒවා වර්තමානයේ දී පාලනය කරනු ලබන විට හා එම අයිතමයන් සමඟ බැඳුනු අනාගත ආර්ථික ප්‍රතිලාභයන් ව්‍යාපාරය තුළට ජනනයවීම හව්‍ය වන්නේ නම් හා ඒවායේ පිරිවැය හෝ සාධාරණ අගය විශ්වසනීය පරිදි මැනිය හැකිවන විට පිව විද්‍යාත්මක වත්කම් ආයතනය විසින් හඳුනාගනී. දැව ලබාගැනීමට පාලනය කරන ගස් මුල්වරට හඳුනාගන්නා අතර, සෑම වාර්තාකරණ කාලච්ඡේදයක් අවසානයේදීම ශ්‍රී.ල.ගි.ප්‍ර 41 ප්‍රකාරව ඒවා සාධාරණ අගයෙන් විකිණීම සඳහා යන පිරිවැය අඩු කළ පසු ලැබෙන අගයට නිරූපණය කෙරේ.

අපගේ ගණනය කිරීම්වලට අනුව තේක්ක ගසක් පරිණත වීමට රෝපණය කළ දින සිට අවුරුදු 35ක කාලයක් ගත වන බවත්, එම ගසේ විද්‍යාත්මක පරිනාමය සිදුවීමට අවුරුදු 10ක

කාලයක් ගත වන බව සඳහන් කළ හැක. ජීව විද්‍යාත්මක පරිනාමය සිදුවන කාලය අතර තුර දැරීමට සිදුවන පිරිවැයත්, එහි සාධාරණ අගයත් එම කාල පරිච්ඡේදය තුල සමාන වන බව උපකල්පනය කර ඇත.

**1.3.1.5 මූල්‍ය උපකරණ**

1.3.1.5.1 ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් සංස්ථාව විසින් පළමුව ණය මුදල, ලැබිය යුතු මුදල් හා තැන්පතු එළඹි දිනය මත පදනම් ව හඳුනාගැනීම සිදුකරනු ලබයි. අනෙකුත් සියලුම මූල්‍ය වත්කම් (ලාභ හා අලාභ හරහා සාධරණ අගය මත නම් කරන ලද වත්කම් අතුළුව) සංස්ථාව කොන්ත්‍රාත් විධිවිධාන වලට අදාල පාර්ශවයක් බවට පත් වූ ගණුදෙනු සිදුවූ දිනය මත පදනම් ව හඳුනාගැනීම් සිදුකරනු ලබයි. වත්කම් කල්පිරීමේ දී මූල්‍ය ප්‍රවාහ සදහා ඇති ගිවිසුම්ගත හිමිකම් මත සංස්ථාව වත්කම් නැවත හඳුනාගැනීම හෝ මූල්‍ය වත්කම් ගනුදෙනු වලදී වත්කමට අදාල ගිවිසුම්ගත මූල්‍ය ප්‍රවාහ ලැබීමට ඇති අයිතිය සමග සැලකිය යුතු සියලුම අවදානම් මාරු කරනු ලබයි.

1.3.1.5.1.1. ණයට දුන් සහ අයවිය යුතු වත්කම් ස්ථිර හෝ තීරණය කළ හැකි ගෙවීම් සහිත ක්‍රියාකාරි වෙළඳපොළෙන් උපුටාගත නොහැකි මූල්‍ය වත්කම් ණය හා ලැබීම් වේ. මෙම වත්කම් සාධාරණ අගයට එයට අදාල ඍජු වියදම් එකතු කිරීමෙන් පසු ලැබෙන අගය මත මූලික හඳුනාගැනීම සිදුකරනු ලබයි. මූලික හඳුනාගැනීමෙන් පසුව ණය හානිකරන අලාභ ඉවත් කිරීමෙන් පසුව ඵලදායී පොළී ක්‍රමය යොදාගනිමින් එම වත්කම් නැවත හඳුනාගැනීම සිදුකරනු ලබයි. ණය හා ලැබීම් වෙළඳ හා වෙළඳ නොවන ලැබීම් වලින් සමන්විත වන අතර, සේවක ණය ද ඇතුළත් වේ. මුදල් හා මුදල් සමාන වත්කම් මුදල් ශේෂයන්ගෙන් හා ඊක්ෂණ තැන්පතු වලින් සමන්විත වන අතර, ඊක්ෂණ තැන්පතු ඇතුළත් කරනු ලබන්නේ මුදල් ප්‍රවාහ ප්‍රකාශ අරමුණ සදහාය.

**1.3.1.6 ආයෝජන**

1.3.1.6.1 ස්ථිර තැන්පතු ආයෝජන පිරිවැය මත සඳහන් කර ඇත.

1.3.1.6.2 දිගුකාලින ආයෝජන පිරිවැය මත සඳහන් කර ඇත.

1.3.1.6.3 රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙහි ආයෝජන

මෙම ආයෝජනයන් සිදුකර ඇත්තේ රාජ්‍ය දැව සංස්ථාවේ සේවකයින්ට නිවාස ණය පහසුකම් සැලසීම සඳහාය.

1.3.1.6.4 අපහායනය

මූල්‍ය වත්කමක අගය අඩුවන බවට විෂය මූලික සාක්ෂි ඇතිදැයි එක් එක් වාර්තාකරණ දිනක දී ඇගයීමකට ලක්කිරීම සිදුකොට එසේ අගය අඩුවීමෙන් දැරීමට සිදුවන අලාභය ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

1.3.1.6.5 ලංකා ටිම්බර් ප්ලාන්ටේෂන් ඉන්ඩස්ට්‍රීස් සමාගමේ ආයෝජන

මෙම ආයෝජනයෙන් කිසිඳු ලාභාංශයක් මේවන තෙක් ලැබී නොමැත. තවද, ආයෝජනය කර ඇති රුපියල් 30,000,000/-ක මුදල නැවත ලබාගැනීම ද අවිනිශ්චිතය. එමනිසා අගය අඩුවීමෙන් ලැබෙන අලාභය රු.30,000,000 ලෙස ආදායම් ප්‍රකාශනයට ඇතුලත් කර ඇත.

**1.3.1.7 වෙළෙඳ තොග**

වෙළෙඳ තොග අගයකරනු ලැබ ඇත්තේ පිරිවැය හෝ ඇස්තමේන්තුගත ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට ය. පරිත්‍යාග දැව තොග ද, අගය කොට ඇත්තේ පිරිවැය (තොග වර්තමාන ස්ථානයට සහ වර්තමාන තත්වයට ගෙනඒම සඳහා දරන ලද පිරිවැය) හෝ ඇස්තමේන්තුගත ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට ය. පිරිවැය නිගමනය කරනු ලබන්නේ ප්‍රථමයෙන් ලැබීම්, ප්‍රථමයෙන් නිකුත් කරන පදනමට වන අතර පිරිවැයට, බඩුතොග ප්‍රවර්තන තත්වයට හා ස්ථානයට ගෙනඒමට දරන ලද සියලු වියදම් ඇතුලත්ය. නිෂ්පාදන සම්බන්ධයෙන් මේ වනවිටදී පිරිවැයට සියලු ඍජු වියදම් ද සාමාන්‍ය ක්‍රියාකාරී මට්ටම මත පදනම් වන නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය ද ඇතුළත් ය. අවශ්‍ය අවස්ථාවන් හිදී යල්පැනගිය, සෙමින් අලෙවි වන හා දෝෂ සහිත බඩුතොග සඳහා ප්‍රතිපාදන සලසා ඇත. තොග හානිවීම් සඳහා 15% ක සාමාන්‍ය ප්‍රතිපාදනයක් සලසා ඇත.

**1.3.2 වගකීම් හා ප්‍රතිපාදන**

මූල්‍ය තත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් යටතේ ගැනෙනුයේ ඉල්ලූ වහා ගෙවිය යුතු ගෙවීම් හෝ මූල්‍ය තත්ව ප්‍රකාශන දින සිට වසරක් තුළ ගෙවිය යුතු ගෙවීම්ය. ජංගම නොවන වගකීම් ලෙස ගැනෙනුයේ මූල්‍ය තත්ව ප්‍රකාශන දින සිට වසරකට වැඩිකාලයක් තුළ ගෙවිය යුතු ගෙවීම්ය. මූල්‍ය ප්‍රකාශනවල සියලුම හඳුනාගෙන ඇති වගකීම් ගිණුම්ගත කර ඇත.

**1.3.2.1 වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු වගකීම්**

වෙළඳ හා අනෙකුත් කටයුතු සදහා ගෙවීම් අදාල පිරිවැය අනුව සදහන් කර ඇත.

**1.3.2.2 විශ්‍රාම පාරිතෝෂිකය**

1983 අංක 12 දරන විශ්‍රාම පාරිතෝෂික පනත අනුව අඛණ්ඩව වර්ෂ 05කට වඩා වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයින් විශ්‍රාම පාරිතෝෂික සඳහා හිමිකම් ලබයි. කෙසේ වෙතත් සියලුම සංස්ථා සේවකයින් වෙනුවෙන් වර්ෂ 2014 දෙසැම්බර් 31 දිනට අවසන්කර ඇති සේවා කාලය හා අවසන්වරට ලැබූ වැටුප පදනම් කරගෙන සේවක විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන වෙන්කර ඇත.

**1.3.2.3 අසම්භාව්‍ය වත්කම් හා වගකීම් සදහා වෙන්කිරීම්**

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස, වර්තමානයේ විශ්වාසනීයව මැනිය හැකි නීතිමය හෝ සාධාරණීයකරණය කළ හැකි වගකීමක් පවතී නම් හා එම වගකීම පියවීම සදහා ආර්ථික ප්‍රතිලාභ ගලායෑමක් නියත වශයෙන්ම සිදුවේ නම් පමණක් සංස්ථාව මගින් ප්‍රතිපාදන වෙන්කරනු ලබයි.

මුදලින් මැනිය හැකි සියලුම වගකීම් සඳහා ප්‍රතිපාදන සලසා ඇති අතර, අනෙකුත් වගකීම් හෙළිදරවු කර ඇත.

ආනයනය කල ක්‍රියෝසෝට් තෙල්වල දෝෂ තත්වයක් සම්බන්ධයෙන් සැපයුම්කරු සමග මතභේදයක් ඇති අතර, එම මතභේදය හේතුවෙන් ඇ.ඩො54,490.51 ක මුදලක් ණයවර ලිපියේ සඳහන් මුදලින් නිදහස් කර නැත. මෙම මතභේදය නිරවුල් වනතෙක් බැංකුව මගින් අදාල මුදල් රඳවාගෙන ඇත.

බගවන්තලාව වැපල්ටන් වාණිජ තුනී කිරීම් බිම් කට්ටියේ අනවසර හෙළීම් නිසා රජයට පාඩු සිදුවූ බවට දන්වන ලද අතර, පරීක්ෂණවලදී හෙළිදරව් වූ සමහර කරුණු හේතුවෙන් තවමත් නිශ්චිත නිගමනයකට එලඹිය නොහැකි බැවින් සංස්ථාවේ නිලධාරීන් සමග එක්ව එම කරුණ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්විය යුතු බවට වනසංරක්ෂණ ජෙනරාල්තුමා තීරණය කොට ඇත.

වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය දැව සංස්ථාවට එරෙහිව දෙහිඅත්තකණ්ඩිය මහේස්ත්‍රාත් උසාවියට රඹකැන්ඔය ජලාශයට යටවන භූමියේ දැව ඉවත් කිරීමේ දී සිදුවූ අක්‍රමිකතා හේතු කොට ගෙන “බී” වාර්තාවක් ඉදිරිපත් කරන ලද නමුත් සංස්ථාව විසින් නීතිපති දෙපාර්තමේන්තුවට තත්වය පිළිබඳ කරුණු ඉදිරිපත් කරන ලදී. මේ වනතෙක් නීතිපති දෙපාර්තමේන්තුව විසින් නඩුවක් ගොනුකර නොමැත.

2006 සිට 2012 කාල සීමාව තුළ රාජ්‍ය දැව සංස්ථාව විසින් සේවක අර්ථසාධක අරමුදලෙහි හා සේවක භාරකාර අරමුදලෙහි දායකත්වය ගණනය කිරීමේදී ජීවන වියදම් නොසලකා ඇති බව දක්වමින් කම්කරු දෙපාර්තමේන්තුව විසින් සංස්ථාවට එරෙහිව චෝදනා ගොනුකර ඇත. මෙම තත්වය සමථයකට පත්කරගැනීම සදහා කම්කරු දෙපාර්තමේන්තුව හා රාජ්‍ය දැව සංස්ථාව සාකච්ඡා කරමින් සිටින

අතර, තවමත් අවසාන තිරණයකට එළඹ නැත.

2015.07.29 දිනෙන් පසු සම පාර්ශව ලෙස ලංකා බැංකු ස්ථාවර තැන්පතු ගිණුම් අංක :77777554 සහ 77902580 එරෙහිව බැංකු ඇපකර නිකුත් කර ඇත.

**1.3.3 විස්තීරණ ආදායම් ප්‍රකාශනය**

විස්තීරණ ආදායම් ප්‍රකාශනය සකස්කර ඉදිරිපත් කිරීම සඳහා කාර්යයන්ට අනුව වියදම් වර්ගීකරණ ක්‍රමය භාවිතා කර ඇත. එසේ කර ඇත්තේ එයින් සංස්ථාවේ කාර්යසාධනය ලෙස පිළිබිඹු වන බැවිනි. උපචිත පදනම අනුව ආදායම් හා වියදම් හඳුනාගෙන ඇත.

**1.3.3.1 ආදායම් හඳුනාගැනීම**

දැව විකිණීමෙන් ලද ආදායම ගණනය කර ඇත්තේ දැව විකිණීමෙන් ලැබුණු හෝ ලැබිය යුතු මුදල, වෙළඳ වට්ටම් සහ ප්‍රමාණ සඳහා දෙනුලබන සහන ආදිය සැලකිල්ලට යොමුකිරීමෙන් සාධාරණ වටිනාකම් පදනමටය. රාජ්‍ය දැව සංස්ථාවේ සහ වනසංරක්ෂ දෙපාර්තමේන්තුවේ සේවකයින් හට 25% ක සහනදායී මිලක් යටතේ දැව නිකුත් කරන අතර, එම වියදම් සුභසාධක පහසුකම් වැය ශීර්ෂය යටතේ ගිණුම්ගත කර ඇත.

**1.3.3.2 වියදම් හඳුනාගැනීම**

වර්ෂය තුළ ලබා ඇති ලාභය ගණන් බැලීමේදී වසර තුළ ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා දරන ලද සියලුම වියදම් ආදායමෙන් අඩුකර ඇත. අන්‍දත්වැඩියා සහ නවීකරණයට අදාල වියදම් එය දැරූ වර්ෂයේ විස්තීරණ ආදායම් ප්‍රකාශනයට හරකර ඇත.

**1.3.3.2.1 ආදායම් බදු**

ප්‍රවර්තන හා විලම්භිත බදු වලින් ආදායම් බදු සමන්විත වේ. ස්කන්ධයෙන් හෝ වෙනත් විස්තීරණ ආදායම් තුලින් සෘජුව හඳුනාගන්නා අයිතම වලට අදාල ප්‍රමාණය හැර ප්‍රවර්තන හා විලම්භිත බදු වියදම් විස්තීරණ ආදායම් ප්‍රකාශනය මගින් හඳුනාගනී.

වාර්තා කරන දිනට බලපවත්වන බදු අනුපාත හා පූර්ව වාර්ෂය වෙනුවෙන් කරන ලද වෙන්කිරීම් උපයෝගී කරගෙන, වර්ෂයේ බදු ආදායම හෝ අලාභය මත ගෙවිය යුතු හෝ ලැබිය යුතු අපේක්ෂිත බදු මුදල ප්‍රවර්තන බදු ලෙස හඳුනා ගනී.

ආදායම් බදු අනුපාතය 28% වන අතර, කල්පිත ලාභාංශ බදු අනුපාතය 25% කි.

මූල්‍ය වාර්තාකරණය සඳහා වත්කම් හා වගකීම්වල ඉදිරියට ගෙන ආ ශේෂය සහ බදු මුදල අතර තාවකාලික වෙනස ලබාගැනීම සඳහා වගකීම් ක්‍රමය භාවිතය මගින් විලම්භිත බදු මුදල ගණනය කෙරේ. මූල්‍ය තත්වය ප්‍රකාශන දිනට බලපවත්වන බදු අනුපාත භාවිතයෙන් වත්කම් හා වගකීම්වල ඉදිරියට ගෙන ආ නිරවුල් කළ යුතු ශේෂය හෝ අපේක්ෂිත උපලබ්ධි මදුල මත පදනම්ව විලම්භිත බදු මුදල ගණනය කෙරේ.

අනාගත වත්කම්වල පරිභෝජනයට ගතහැකි අගයට එරෙහිව අනාගතයේ දී බදු ලාභයක් ලැබීමේ සම්භාවිතාවයක් පවතී නම් එම ප්‍රමාණයට පමණක් විලම්භිත බදු වත්කම හඳුනාගැනේ. වත්කමට අදාල බදු ප්‍රතිලාභය තවදුරටත් ලබාගත නොහැක්කේ නම් එම ප්‍රමාණයට විලම්භිත බදු වත්කම පහත හෙලනු ලැබේ.

1.3.3.2.2 ස්කන්ධභාග ගෙවීම

2015 වසර සඳහා ස්කන්ධභාගය ගණනය කර ඇත්තේ හෙලා ඇති දැව පරිමාව අනුවය.

1.3.3.2.3 පිරිවැය වෙන් කිරීම

දැව හුවමාරු අගය මත දැව පිරිවැය හා දැව ඉරුම්හල්වල පරිවර්තන පිරිවැය බෙදාවෙන් කරනු ලබන අතර, අදාල ඒකකය වෙත ප්‍රවාහනය කිරීමේ කුලී අගය මත යාන්ත්‍රික වැඩපොලේ පිරිවැය වෙන්කරනු ලබයි.



**1.3.4 මූල්‍ය තත්ව ප්‍රකාශන දිනට පසුව සිදුවීම්**

මූල්‍ය තත්ව ප්‍රකාශනය සකස් කළ දිනයට පසුව පැනනැගී සියලු සැලකිය යුතු සිද්ධීන් සැලකිල්ලට ගෙන, මූල්‍ය ප්‍රකාශවල අදාල සටහන් යටතේ නිසි ගැලපීම් හෝ අනාවරණය කිරීම් සිදුකර ඇත.

**1.3.5 සේවක ණය චක්‍රීය අරමුදල**

මෙම අරමුදල නිර්මාණය කොට ඇත්තේ සංස්ථාවේ සේවකයන්ට ණය ලබාදීමේ අරමුණිනි. සේවක ණයපොලී ආදායම වෙනත් ආදායම් යටතේ විස්තීරණ ආදායම් ප්‍රකාශනයෙහි දක්වා, ආදායම් බදු අඩුකිරීමෙන් පසු ශුද්ධ පොලී ආදායම සේවක ණය චක්‍රීය අරමුදලට මාරු කරනු ලැබේ. මෙමගින් සේවක ණය චක්‍රීය අරමුදල ගොඩනැංවෙන අතර, එමගින් ණය ලබාදීම අරමුදලේ ඇති මුදල් ප්‍රමාණයට සීමාවේ.

**1.3.6 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සම්බන්ධ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සෘජු ක්‍රමයට අනුව පිළියෙල කර ඇත. මුදල් සහ මුදල් වලට සමාන වත්කම්වලට වටිනාකම වෙනස්වීමේ අවධානමට යටත්ව ඉක්මණින් මුදල් වලට මාරුකර ගතහැකි ඉහළ ද්‍රවශීලීතාවයක් ඇති කෙටිකාලීන ආයෝජන ඇතුලත් වේ. මුදල් සහ මුදල් සමාන වත්කම් වලට අතැති මුදල්, බැංකු ශේෂ සහ බැංකුවල ඇති කෙටිකාලීන තැන්පතු ඇතුළත් වේ.

# ගිණුම් සඳහා සටහන්

## 02. පිරිවැටුම

| | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|
| කඳන් - රජයේ ඉඩම් වලින් ලද | 2,257,131,657 | 1,774,835,926 |
| කඳන් - පුද්ගලික ඉඩම් වලින් ලද | 57,716,183 | 41,521,752 |
| ඉරුදැව | 172,613,302 | 156,973,992 |
| ඉරුදැව - ආනයනය කරන ලද | 51,284,256 | - |
| සිල්පර - පුද්ගලික ඉඩම් වලින් ලද | 74,746,345 | 324,619,571 |
| සිල්පර - රජයේ ඉඩම් වලින් ලද | 107,808,862 | 155,478,174 |
| සිල්පර - අපනයන | 54,239,413 | 48,297,160 |
| විදුලිකණු - රජයේ ඉඩම් වලින් ලද | 171,860,038 | 142,153,826 |
| විදුලිකණු - පුද්ගලික ඉඩම් වලින් ලද | 62,020,251 | 195,127,486 |
| අලි වැට කණු | 222,846,588 | 88,672,100 |
| වෙනත් | 21,989,976 | 23,903,788 |
| වනඅපරාධ දැව | 38,933,047 | 37,669,004 |
| රජයේ ඉඩම්වල පරිත්‍යාග දැව | 349,568,783 | 315,497,163 |
| ගෘහභාණ්ඩ | 269,460,443 | 238,318,417 |
| දළ පිරිවැටුම | 3,912,219,144 | 3,543,068,359 |
| ජාතිය ගොඩනැගීමේ බදු | (76,027,780) | (69,220,911) |
| ශුද්ධ පිරිවැටුම | 3,836,191,364 | 3,473,847,448 |

## 03. විකුණුම් පිරිවැය

| | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|
| දැව ගබඩා හා මංසල ගබඩා | 1,051,253,845 | 906,772,371 |
| දැව පරිරක්ෂණාගාර | 486,500,651 | 661,198,073 |
| ගෘහභාණ්ඩ යන්ත්‍රාගාර | 199,687,421 | 165,251,217 |
| මංසල විකුණුම් | 341,634,483 | 287,174,876 |
| **එකතුව** | **2,079,076,399** | **2,020,396,537** |

## 04. විකුණුම් හා බෙදාහැරීමේ වියදම්

| | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|
| දැව ගබඩා | 530,990,321 | 505,088,613 |
| දැව පරිරක්ෂණාගාර | 5,775,907 | 23,390,634 |
| ගෘහභාණ්ඩ යන්ත්‍රාගාර | 33,163,963 | 27,587,476 |
| ප්‍රාදේශීය කාර්යාල හා ප්‍රධාන කාර්යාලය | 8,240,628 | 11,883,430 |
| **එකතුව** | **578,170,820** | **567,950,153** |



## 05. පරිපාලන වියදම්

| | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|
| දැව පරිරක්ෂණාගාර | 17,065,901 | 21,945,543 |
| ගෘහභාණ්ඩ යන්ත්‍රාගාරය | 21,964,163 | 29,144,333 |
| ප්‍රාදේශීය කාර්යාල හා ප්‍රධාන කාර්යාලය | 660,082,480 | 683,100,131 |
| සංචාරක බංගලා | 6,992,684 | 6,723,210 |
| **එකතුව** | **706,105,228** | **740,913,217** |

## 06. වෙනත් ආදායම්

| | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|
| **6.1 මෙහෙයුම් නොවන ආදායම් සටහන 6.3** | | |
| පොලී ආදායම - ආයෝජන | 156,091,113 | 197,513,358 |
| විදේශ විනිමය හුවමාරු ලාභ/(අලාභ) | 14,336 | 1,136 |
| ගොඩනැගිලි කුලිය | 15,488,165 | 15,042,601 |
| පාරිතෝෂික අධි වෙන්කිරීම් | 40,812,838 | - |
| සේවක ණය පොලිය | 10,574,092 | 10,268,957 |
| | 222,980,543 | 222,826,052 |
| **6.2 මෙහෙයුම් ආදායම් සටහන 6.3** | | |
| විවිධ ආදායම් | 28,389,377 | 20,952,428 |
| දඩ - කොන්ත්‍රාත්කරුවන්ගේ සහ සැපයුම්කරුවන්ගේ | 823,764 | 568,079 |
| වත්කම් විකිණීමෙන් ලද ආදායම | 6,431,412 | 6,474,636 |
| තොග හානි සඳහා අධි වෙන්කිරීම් | 25,455,651 | 27,245,757 |
| අඩමාන ණය අධි වෙන්කිරීම් | 9,072,801 | 2,003,952 |
| ඌණතා සහ පාඩු සඳහා අයකිරීම් | 1,048,605 | 1,153,737 |
| ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පත් | 1,658,265 | 1,410,260 |
| | 72,879,875 | 59,808,848 |
| **එකතුව** | **295,860,418** | **282,634,900** |

## 6.3 වෙනත් ආදායම් විශ්ලේෂණය 2015

| ආදායම් මූලාශ්‍ර | අලෙවි ගබඩා | දැව පදම් කිරීමේ ඒකක | ගෘහභාණ්ඩ නිෂ්පාදන ඒකක | දැව පිරිවැය | ප්‍රාදේශීය කාර්යාල හා ප්‍රධාන කාර්යාලය | දැව ඉරුම්හල් | සංචාරක බංගලා | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| **මෙහෙයුම් නොවන ආදායම්** | | | | | | | | |
| පොළී ආදායම - ආයෝජන | - | - | - | - | 156,091,113 | - | - | 156,091,113 |
| විදේශ විනිමය හුවමාරු ලාභ/(අලාභ) | - | - | - | - | 14,336 | - | - | 14,336 |
| ගොඩනැගිලි කුලිය | - | - | - | - | 15,488,165 | - | - | 15,488,165 |
| පාර්තෝෂික අධි වෙන්කිරීම් | 10,822,677 | 378,492 | 3,925,266 | 8,010,028 | 16,084,137 | 1,592,238 | - | 40,812,838 |
| සේවක ණය පොළිය | - | - | - | - | 10,574,092 | - | - | 10,574,092 |
| | 10,822,677 | 378,492 | 3,925,266 | 8,010,028 | 198,251,843 | 1,592,238 | - | 222,980,543 |
| **මෙහෙයුම් ආදායම්** | | | | | | | | |
| විවිධ ආදායම් | 296,615 | - | 39,252 | - | 24,718,988 | 2,274,212 | 1,060,309 | 28,389,377 |
| දඩ - කොන්ත්‍රාත්කරුවන්ගේ සහ සැපයුම්කරුවන්ගේ | - | - | - | - | 823,764 | - | - | 823,764 |
| වත්කම් විකිණීමෙන් ලද ආදායම | - | - | - | - | 6,431,412 | - | - | 6,431,412 |
| තොග හානි සඳහා අධි වෙන්කිරීම් | 20,005,625 | 5,441,032 | 8,993 | - | - | - | - | 25,455,651 |
| අඩමාන ණය අධි වෙන්කිරීම් | 852,551 | 7,925,603 | 294,647 | - | - | - | - | 9,072,801 |
| ඌණතා සහ පාඩු සඳහා අයකිරීම් | - | - | - | - | 1,048,605 | - | - | 1,048,605 |
| ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පත් | - | - | - | - | 1,658,265 | - | - | 1,658,265 |
| | 21,154,792 | 13,366,636 | 342,892 | - | 34,681,034 | 2,274,212 | 1,060,309 | 72,879,875 |
| **එකතුව** | **31,977,469** | **13,745,127** | **4,268,158** | **8,010,028** | **232,932,876** | **3,866,451** | **1,060,309** | **295,860,418** |



## 07 ආදායම් බදු

| | | 2015 රු. | 2014 රු. |
|---|---|---|---|
| **ප්‍රවර්තන බදු වියදම්** | | | |
| ප්‍රවර්තන වර්ෂය සඳහා ආදායම් බදු | සටහන 7.1 | 304,359,828 | 202,347,540 |
| පෙර වර්ෂය සඳහා අධි/ඌණ වෙන්කිරීම් | | 63 | 2,237,777 |
| | | 304,359,891 | 204,585,317 |
| **විලම්භිත බදු වියදම්** | සටහන 7.2 | | |
| තාවකාලික වෙනස්වීම්වල ප්‍රවර්ථනය හා මූලාරම්භය | | 44,448,968 | (8,360,739) |
| | | 44,448,968 | (8,360,739) |
| වර්ෂය සඳහා බදු අයකිරීම් | | 348,808,858 | 196,224,578 |

### 7.1 ප්‍රවර්තන වර්ෂයේ ලාභය සඳහා ආදායම් බදු

| | 2015 රු. | 2014 රු. |
|---|---|---|
| බදු පෙර ලාභය | 718,699,335 | 402,222,442 |
| සමාහාර ඉඩනොදෙන වියදම් | 104,679,569 | 293,664,679 |
| සමාහාර ඉඩදෙන වියදම් | (411,808,542) | (423,720,740) |
| ව්‍යාපාරික ලාභය | 411,570,362 | 272,166,381 |
| ව්‍යාපාරික නොවන ආදායම් | 182,167,706 | 212,557,094 |
| බදු අයකල හැකි ආදායම් | 593,738,068 | 484,723,475 |
| ආදායම් බද්දෙන් 28% | 166,246,659 | 135,722,573 |
| බෙදාහැරිය හැකි ලාභය මත ලාභාංශ බදු | 138,113,169 | 66,624,967 |
| **එකතුව** | **304,359,828** | **202,347,540** |

### 7.2 විලම්භිත බදු

| | තාවකාලික වෙනස රු. | බලපෑම (වත්කම්/වගකීම්) රු. |
|---|---|---|
| 2015 ජනවාරි 01 වන දිනට ශේෂය | (149,134,081) | (41,757,543) |
| වසර තුල උත්පාදනය වූ මුදල | 158,746,313 | 44,448,968 |
| 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය | 9,612,232 | 2,691,425 |
| දේපළ, පිරියත හා උපකරණවල තාවකාලික වෙනස | 376,499,361 | 105,419,821 |
| විශ්‍රාම පාර්තෝෂික අරමුදලේ තාවකාලික වෙනස | 366,887,129 | 102,728,396 |
| ඉදිරියට ගෙන ආ බදු අලාභය | - | - |
| 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය | (9,612,232) | (2,691,425) |

## 08. දේපළ, පිරියත හා උපකරණ

| විස්තරය | පිරිවැය 2015.01.01 දිනට ශේෂය | පිරිවැය එකතු කිරීම් | පිරිවැය ඉවත් කිරීම් | පිරිවැය 2015.12.31 දිනට ශේෂය | ක්ෂයවීම 2015.01.01 දිනට ශේෂය | ක්ෂයවීම ඉවත් කිරීම් | ක්ෂයවීම වසර සඳහා අයකිරීම් | ක්ෂයවීම 2015.12.31 දිනට ශේෂය | 2015.12.31 දිනට ඉදිරියට ගෙන එන ලද වටිනාකම | 2014.12.31 දිනට ඉදිරියට ගෙන එන ලද වටිනාකම |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ඉඩම් | 56,873,092 | 3,628,401 | 1,444,347 | 59,057,146 | - | - | - | - | 59,057,146 | 76,729,723 |
| ඉඩම් සංවර්ධනය | 19,856,631 | 5,554,068 | - | 25,410,700 | - | - | 12,357,688 | 12,357,688 | 13,053,012 | - |
| ගොඩනැගිලි | 630,353,815 | 78,563,939 | 1,667,356 | 707,250,398 | 155,350,348 | - | 14,109,113 | 169,459,461 | 537,790,937 | 475,003,467 |
| දැව අට්ටිමඩු හා වෙනත් ගොඩනැගිලි | 19,256,777 | - | - | 19,256,777 | 18,237,618 | - | 508,130 | 18,745,748 | 511,029 | 1,019,159 |
| මාර්ග හා දුම්රිය මාර්ග | 16,679,376 | 1,742,356 | - | 18,421,732 | 5,782,723 | - | 793,900 | 6,576,623 | 11,845,109 | 10,896,653 |
| යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 639,552,770 | 57,624,822 | 12,917,552 | 684,260,040 | 478,966,365 | 11,994,016 | 29,577,255 | 496,549,604 | 187,710,436 | 160,586,405 |
| බදු අයිති ඉඩම් හා ගොඩනැගිලි | 148,311 | - | - | 148,311 | 148,311 | - | - | 148,311 | - | - |
| මාර්ග ඉදිකිරීම් යන්ත්‍ර හා උපකරණ | 60,450 | - | - | 60,450 | 60,450 | - | - | 60,450 | - | - |
| මෙවලම් හා උපකරණ | 5,645,229 | 346,646 | - | 5,991,875 | 4,879,147 | - | 231,725 | 5,110,872 | 881,003 | 766,082 |
| විදුලි උපකරණ | 14,980,705 | 2,499,136 | - | 17,479,841 | 8,186,694 | - | 1,134,980 | 9,321,674 | 8,158,167 | 6,794,011 |
| වාහන | 540,469,054 | 78,035,714 | 5,093,210 | 613,411,558 | 414,105,946 | 4,802,290 | 49,839,606 | 459,143,263 | 154,268,295 | 126,363,108 |
| ගෘහභාණ්ඩ හා සවිකිරීම් | 39,564,603 | 3,474,622 | - | 43,039,225 | 21,281,938 | - | 4,440,846 | 25,722,783 | 17,316,442 | 18,282,665 |
| කාර්යාලීය උපකරණ | 32,484,131 | 834,893 | - | 33,319,024 | 25,232,171 | - | 1,782,069 | 27,014,240 | 6,304,784 | 7,251,960 |
| පරිගණක හා උපාංග | 56,382,226 | 7,450,367 | - | 63,832,594 | 40,313,955 | - | 5,410,577 | 45,724,532 | 18,108,062 | 16,068,271 |
| විවිධ වත්කම් | 22,119,263 | 4,453,001 | - | 26,572,264 | 16,240,452 | - | 2,417,892 | 18,658,344 | 7,913,920 | 5,878,811 |
| පෙර නිමවුම් ව්‍යුහ | 4,938,333 | - | - | 4,938,333 | 4,938,333 | - | - | 4,938,333 | - | - |
| බදු අයිති ඉඩම් - රත්නපුර | 680,300 | - | - | 680,300 | 680,300 | - | - | 680,300 | - | - |
| **එකතුව** | **2,100,045,065** | **244,207,967** | **21,122,466** | **2,323,130,566** | **1,194,404,751** | **16,796,306** | **122,603,780** | **1,300,212,226** | **1,022,918,342** | **905,640,314** |

වාර්තා කරන දිනය වන විට පිරිවැය රු.879,155,884/- ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දේපල පිරියත හා උපකරණ ප්‍රමාණයක් සංස්ථාව සතු වේ.

ඉඩම් යටතේ දක්වා තිබූ ඉඩම් සංවර්ධනය සඳහා දරන ලද පිරිවැය දේපළ, පිරියත සහ උපකරණ යටතේ 2015 වර්ෂයේ සිට වෙන්කොට ඉඩම් සංවර්ධන යන විස්තරය යටතේ දක්වන ලදී.

සංස්ථාව විසින් ඉඩම් සංවර්ධනය සඳහා දරන ලද පිරිවැය 2015 වර්ෂයේ සිට සකස් කර ක්ෂය කරන ලදී. පෙර වර්ෂවල සමුච්චිත ක්ෂය අගය ගණනය කොට මුළු සමුච්චිත ක්ෂය අගය 2015 වර්ෂයේ වියදමක් ලෙස සටහන් කරන ලදී.

## 09. අස්පෘශ්‍ය වත්කම්

| විස්තර | පිරිවැය 2015.01.01 දිනට ශේෂය | පිරිවැය එකතු කිරීම් | පිරිවැය ඉවත් කිරීම් | පිරිවැය 2015.12.31 දිනට ශේෂය | ක්‍රමක්ෂය 2015.01.01 දිනට ශේෂය | ක්‍රමක්ෂය ඉවත් කිරීම් | ක්‍රමක්ෂය වසර සඳහා අයකිරීම් | ක්‍රමක්ෂය 2015.12.31 දිනට ශේෂය | 2015.12.31 දිනට ඉදිරියට ගෙන එන ලද වටිනාකම | 2014.12.31 දිනට ඉදිරියට ගෙන එන ලද වටිනාකම |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| පරිගණක මෘදුකාංග | 3,011,537 | 721,267 | - | 3,732,804 | 1,376,702 | - | 679,769 | 2,056,472 | 1,676,332 | 1,634,835 |
| එකතුව | 3,011,537 | 721,267 | - | 3,732,804 | 1,376,702 | - | 679,769 | 2,056,472 | 1,676,332 | 1,634,835 |



## 10. ජීව විද්‍යාත්මක වත්කම්

| දෙසැම්බර් 31 දිනට | 2015 රු. | 2014 රු. |
|---|---|---|
| වර්ෂය ආරම්භක ශේෂය | 4,836,929 | 3,184,890 |
| නැවත වගා කිරීම් හෝ සංවර්ධනය සඳහා දරන ලද වියදම් | 480,450 | 1,652,039 |
| **වසර අවසාන ශේෂය** | **5,317,379** | **4,836,929** |

පුලියන්කුලම, මැදවච්චිය, සෙවනපිටිය, හා විහීතගම යන ස්ථානවල සංස්ථාව සතු තේක්ක වගාවක් පවත්වාගෙන යනු ලබයි.

## 11. ආයෝජන

### 11.1 ආයෝජන - දිගු කාලීන

| දෙසැම්බර් 31 දිනට | 2015 රු. | 2014 රු. |
|---|---|---|
| ස්ථාවර තැන්පතුවල ආයෝජන | | |
| රාජ්‍ය ආයතනවල තාවකාලික අරමුදල් ගිණුම | 382,550,525 | 360,226,630 |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | 140,049,121 | 130,485,324 |
| | 522,599,646 | 490,711,954 |
| කොටස්වල ආයෝජන | | |
| ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ මණ්ඩලය | 500,000 | 500,000 |
| සී/ස. ලංකා ටිම්බර් ප්ලාන්ටේෂන් සමාගම | 30,000,000 | 30,000,000 |
| (-) ආයෝජන අපහායනය | (30,000,000) | (30,000,000) |
| | 500,000 | 500,000 |
| **වසර අවසාන ශේෂය** | **523,099,646** | **491,211,954** |

### 11.2 ආයෝජන - කෙටි කාලීන

| දෙසැම්බර් 31 දිනට | 2015 රු. | 2014 රු. |
|---|---|---|
| ස්ථාවර තැන්පතුවල ආයෝජන | | |
| මහජන බැංකුව | 738,673,524 | 696,410,412 |
| ලංකා බැංකුව | 1,238,592,415 | 877,910,713 |
| **වසර අවසාන ශේෂය** | **1,977,265,939** | **1,574,321,125** |

## 12. තොග

| දෙසැම්බර් 31 දිනට | | 2015 රු. | 2014 රු. |
|---|---|---|---|
| වෙළඳ බඩු තොගය | සටහන 12.1 | 916,935,326 | 919,995,872 |
| තොග හානිවීම් සඳහා වෙන්කිරීම් | | (113,437,199) | (116,548,545) |
| | | 803,498,128 | 803,447,328 |
| මාර්ගස්ථ තොග | | 25,131,126 | 76,743,448 |
| කෙරීගෙන යනවැඩ | | 45,183,310 | 36,902,197 |
| ගබඩා ද්‍රව්‍ය සහ අමතර කොටස් | | 116,767,921 | 104,376,621 |
| පරිරක්ෂණය කිරීමේ ද්‍රව්‍ය | | 41,783,742 | 27,987,940 |
| ඉන්ධන හා තෙල් | | 5,873,480 | 2,590,469 |
| ලිපිද්‍රව්‍ය | | 12,942,201 | 16,212,901 |
| **වසර අවසාන ශේෂය** | | **1,051,179,907** | **1,068,260,904** |

### 12.1 තොග විශ්ලේෂණය

| දෙසැම්බර් 31 දිනට | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|
| රජයේ ඉඩම් වලින් ලද කඳන් | 428,517,605 | 477,644,908 |
| රජයේ ඉඩම් වලින් ලද ඉරුඇදැව | 176,236,771 | 196,148,449 |
| ආනයනික ඉරූ දැව | 10,795,467 | - |
| පුද්ගලික ඉඩම් වලින් ලද කඳන් | 1,233,350 | 669,081 |
| රජයේ ඉඩම් වලින් ලද සිල්පර | 1,056,247 | 103,896 |
| පුද්ගලික ඉඩම් වලින් ලද සිල්පර | 28,431,995 | 1,377,702 |
| රජයේ ඉඩම් වලින් ලද විදුලිකණු | 44,214,166 | 49,274,718 |
| පුද්ගලික ඉඩම් වලින් ලද විදුලිකණු | 44,388,282 | 38,529,211 |
| වෙනත් | 21,374,105 | 13,242,339 |
| ගෘහභාණ්ඩ | 160,687,338 | 143,005,568 |
| **වසර අවසාන ශේෂය** | **916,935,326** | **919,995,872** |

### 13. වෙළඳ හා වෙනත් ණයගැතියෝ

| දෙසැම්බර් 31 දිනට | | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|---|
| වෙළඳ ණයගැතියෝ | | 488,719,334 | 760,981,262 |
| අඩමාන ණය වෙන්කිරීම් | | (40,995,580) | (49,869,309) |
| | | 447,723,754 | 711,111,953 |
| කාර්යාල මණ්ඩල ණයගැතියෝ | සටහන 13.2 | 146,612,656 | 162,274,544 |
| වෙනත් ණයගැතියෝ | සටහන 13.1 | 20,747,208 | 17,898,395 |
| **තැන්පත් සහ පූර්ව ගෙවීම්** | | | |
| දේශීය මිලදීගැනීම් අත්තිකාරම් | | 2,057,894 | 38,659,265 |
| පූර්ව ගෙවීම් අත්තිකාරම් | | 5,323,161 | 29,189,005 |
| දැව සැපයීම් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවූ අත්තිකාරම් | | 13,822,462 | 13,001,712 |
| තැන්පත් සඳහා ලැබිය යුතු පොළී | | 63,387,345 | 57,683,002 |
| ආපසු හරවා යැවූ චෙක්පත් | | - | 110,552 |
| කතරගම අෂ්ඨපල අරමුදල | | 962,000 | 1,000,000 |
| උසාවි තැන්පත් | | 8,752,033 | 8,752,033 |
| මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යංශය | | 2,413,385 | 3,817,263 |
| වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව | | 13,223,972 | 6,910,741 |
| වරාය අධිකාරිය | | 563,698 | 563,698 |
| **වසර අවසාන ශේෂය** | | **725,589,567** | **1,050,972,162** |



### 13.1 වෙනත් ණයගැතියෝ

| දෙසැම්බර් 31 දිනට | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|
| විවිධ ණයගැතියෝ | 8,362,516 | 3,828,645 |
| පොදු තැන්පත් | 12,713,812 | 14,433,370 |
| පොදු තැන්පත් සඳහා වෙන්කිරීම් | (366,620) | (366,620) |
| ටෙන්ඩර් තැන්පතු | 37,500 | 3,000 |
| **වසර අවසාන ශේෂය** | **20,747,208** | **17,898,395** |

### 13.2 කාර්ය මණ්ඩල ණයගැතියෝ

| දෙසැම්බර් 31 දිනට | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|
| **කාර්ය මණ්ඩල ණය** | | |
| වාහන ණය | 3,073,052 | 3,899,083 |
| ආපදා ණය | 104,696,844 | 112,815,515 |
| විදුලි උපකරණ ණය | 34,134 | 50,067 |
| යතුරුපැදි ණය | 821,634 | 1,527,351 |
| ලැප්ටොප් පරිගණක ණය | 30,333,084 | 35,085,981 |
| ගෘහභාණ්ඩ ණය | 1,534,994 | 1,945,513 |
| | 140,493,741 | 155,323,510 |
| **අත්තිකාරම් හා වෙනත් ණය** | | |
| වැටුප් හා වේතන අත්තිකාරම් | 3,000 | 7,900 |
| ගමන් වියදම් අත්තිකාරම් | 28,233 | 45,687 |
| උත්සව අත්තිකාරම් | 4,240,222 | 4,239,279 |
| අභ්‍යන්තර හරපත් | 894,739 | 1,767,994 |
| සේවක අයකිරීම් | 858,962 | 790,174 |
| රෙදිපිළි ණය | 93,758 | 100,000 |
| | 6,118,914 | 6,951,034 |
| **වසර අවසාන ශේෂය** | **146,612,656** | **162,274,544** |

### 14. මුදල් හා බැංකු ශේෂය

| දෙසැම්බර් 31 දිනට | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|
| අතැති මුදල් | 975,777 | 959,167 |
| මාර්ගස්ථ මුදල් | 13,648,009 | 7,914 |
| ලංකා බැංකුව - ජංගම ගිණුම | 116,529,360 | 119,169,001 |
| ලංකා බැංකුව - කාලීන තැන්පත් | 230,070,498 | 191,169,876 |
| **වසර අවසාන ශේෂය** | **361,223,645** | **311,305,958** |

## 15. දායක ප්‍රාග්ධනය

| දෙසැම්බර් 31 දිනට | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|
| ශ්‍රී ලංකා රජයේ අරමුදල | 25,584,808 | 25,584,808 |
| වනසංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් පවරා ගත් වත්කම් | 10,714,815 | 10,714,815 |
| ලෝක බැංකු ආධාර | 708,202 | 708,202 |
| කැනේඩියානු හා බ්‍රිතාන්‍ය ආධාර | 4,495,843 | 4,495,843 |
| **වසර අවසාන ශේෂය** | **41,503,668** | **41,503,668** |

## 16. සේවක ණය චක්‍රීය අරමුදල

| දෙසැම්බර් 31 දිනට | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|
| වසර ආරම්භක ශේෂය | 230,554,340 | 225,543,133 |
| සේවක ණය පොළී ලැබීම් | 6,096,101 | 5,102,915 |
| වසර තුල සිදුකරන ලද ගැලපුම් | - | (91,708) |
| **වසර අවසාන ශේෂය** | 236,650,441 | 230,554,340 |
| දෙසැම්බර් 31 දිනට ප්‍රයෝජනයට ගත් අරමුදලේ නාමික අගය | 173,194,551 | 196,135,203 |
| දෙසැම්බර් 31 දිනට ප්‍රයෝජනයට නොගත් අරමුදල | 63,455,891 | 34,510,845 |

## 17. විශ්‍රාම පාරිතෝෂිකය

| දෙසැම්බර් 31 දිනට ශේෂය | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|
| වසර ආරම්භක ශේෂය | 435,931,143 | 340,599,947 |
| වර්ෂය සඳහා ප්‍රතිපාදන | (38,170,626) | 123,790,345 |
| වර්ෂය තුල ගෙවීම් | (30,873,388) | (28,459,149) |
| **වසර අවසාන ශේෂය** | 366,887,129 | 435,931,143 |

විශ්‍රාමික පාරිතෝෂික සදහා වන වගකීම් ගණනයේදී 1983 අංක 12 දරන විශ්‍රාමික පාරිතෝෂික පනතට අනුකූලව අඛණ්ඩව අවුරුදු 5කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයන් පාරිතෝෂික සදහා හිමිකම් ලබයි. 2015 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ විශ්‍රාමික පාරිතෝෂික සදහා වන වගකීම ආයු ගණනය කිරීම යටතේ ඇගයීමට ලක්කරන ලදී. වාර්තා කරනු ලබන දිනට ප්‍රධාන උපකල්පන,

| | 31.12.2015 | 31.12.2014 |
|---|---|---|
| වට්ටම් අනුපාතය | 10.51% | 7.05% |
| අනාගත වැටුප් වැඩිවීමේ අනුපාතය | 5% | 5% |
| සේවක පිරිවැටුම් අනුපාතය | 4.57% | 2.77% |
| විශ්‍රාම ගැන්වීමේ වයස | 60 | 60 |



## 18. බදුකරණය

| දෙසැම්බර් 31 දිනට ශේෂය | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|
| ගෙවිය යුතු ආදායම් බදු වසර ආරම්භක ශේෂය | 232,193,834 | 88,581,787 |
| තැන්පතු මත රඳවාගැනීමේ බදු | (11,066,805) | (30,153,705) |
| වර්ෂය තුල ගෙවීම් | (234,000,000) | (30,819,565) |
| බදු සඳහා ඌණ වෙන්කිරීම් 2014 | 63 | 2,237,777 |
| වර්ෂය සඳහා වෙන්කිරීම් | 304,359,828 | 202,347,540 |
| **වසර අවසාන ශේෂය** | **291,486,919** | **232,193,834** |

## 19. ණයහිමියෝ සහ උපචිත වියදම්

| දෙසැම්බර් 31 දිනට | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|
| සේවක අර්ථසාධක අරමුදල | 13,621,019 | 14,086,637 |
| සේවක භාරකාර අරමුදල | 1,634,641 | 1,698,070 |
| උපචිත වියදම් | 144,405,634 | 128,298,983 |
| ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු | 8,497,920 | 11,862,050 |
| ඇප තැන්පත් - කාර්ය මණ්ඩලය හැර | 42,110,289 | 33,239,095 |
| ගෙවිය යුතු විගණන ගාස්තු | 2,357,828 | 3,073,028 |
| රඳවාගත් මුදල් | 14,280,554 | 13,969,943 |
| වෙනත් ණයහිමියෝ | 72,631,161 | 165,386,186 |
| ස්කන්ධභාගය - වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව | 856,100,427 | 964,283,581 |
| ස්කන්ධභාගය - වනජීවී දෙපාර්තමේන්තුව | 297,946 | 388,363 |
| එකතුකල අගය මත බදු | 33,541,343 | 23,510,868 |
| **වසර අවසාන ශේෂය** | **1,189,478,761** | **1,359,796,803** |

## 20. ආශ්‍රිත පාර්ශවයන් සමග ගනුදෙනු

රාජ්‍ය දැව සංස්ථාවේ අධ්‍යක්ෂවරයෙකු හා වනසංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වනසංරක්ෂණ අධ්‍යක්ෂ ජෙනරාල් විසින් සංස්ථාවට දැව හෙලීම සදහා වනවගා නිදහස් කිරීමේදී ජාතික වන කළමනාකරණ සැලැස්මට අනුව සිදුකරන අතර, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් රු.782,276,144/- ක් වටිනා ගස් වර්ෂය තුළදී සංස්ථාවට ලබාදී ඇත. මූල්‍ය ප්‍රකාශන දිනයට ආශ්‍රිත පාර්ශවයන් සමග ගනුදෙනු වල ශේෂයන් පහත පරිදි වේ.

| දෙසැම්බර් 31 දිනට | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|
| **ආශ්‍රිත පාර්ශවයන්ට ගෙවිය යුතු** | | |
| වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 856,100,427 | 964,283,581 |
| | 856,100,427 | 964,283,581 |
| **ආශ්‍රිත පාර්ශවයන්ට ලැබිය යුතු** | | |
| වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 13,223,972 | 6,910,741 |
| | 13,223,972 | 6,910,741 |

# මූල්‍ය පාරිභාෂික ශබ්ද මාලාව

1 ගිණුම් ප්‍රතිපත්ති
මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී භාවිතා කරනු ලබන විශේෂ මූලධර්ම, පදනම්, සම්මත, නීතීන් සහ ක්‍රියාමාර්ග.

2 ක්‍රමක්ෂය
අස්පෘශ්‍ය වත්කම් එහි ඵලදායී ජීව කාලය තුල ක්‍රමවත් ලෙස බෙදා හැරීම.

3 උපචිත වියදම්
ආදායම් හා වියදම් ලැබීම් හෝ ගෙවීම් කාලපරිච්ඡේදයන් ගැන නොසලකා, එකිනෙක ගැලපීමේ මූලධර්මය.

4 මුදල් හා මුදල් වලට සමාන වත්කම්
මාස 3 ක් හෝ ඊට අඩු කාලයකින් කල්පිරෙන ද්‍රවශීලි ආයෝජන.

5 ආදායම් සංචිත
ආයෝජන සඳහා තබා ඇති සංචිත.

6 අගය එකතු කිරීම්
සංස්ථාව විසින් එහි ක්‍රියාකාරකම් මත උත්පාදනය කරන ලද ධන ප්‍රමාණය.

7 ක්‍රියාකාරී දර්ශකය
ජංගම වගකීම් වලින් ජංගම වත්කම් බෙදූ විට ලැබේ.

8 ක්ෂය වීම්
වත්කමක ක්ෂය කළ හැකි අගය එහි ඵලදායී ජීවකාලය තුල ක්‍රමවත්ව බෙදාහැරීම.

9 තෝලනය
යෙදවූ ප්‍රාග්ධනයට ණය ලබාගත් ප්‍රමාණය.

10 සාධාරණ අගය
දැනුමැති මනාප පාර්ශවයන් අතර අතේ දුරින් කරනු ලබන ගණුදෙනුවකදී වත්කමක් හුවමාරු කලහැකි අගය වේ.

11 වත්කම් මත ඉපැයීම්
ශුද්ධ ආදායම මුළු වත්කමෙහි ප්‍රතිශතයක් ලෙස දැක්වීමයි. මෙය ලාභය මැනීමේ හා සමාන
වෙනත් ආයතනවල කාර්යසාධනය සැසඳීමේ මිනුමක් ලෙස භාවිතාවේ.

12 විලම්භිත බදු
වර්තමාන ගිණුම්කරණ ප්‍රතිපත්ති, බදු ප්‍රතිපත්ති වලින් වෙනස් වීම නිසා අනාගතයේදී ඇති විය හැකි වත්කම් හෝ වගකීම් වේ.

